padippakam

# ලංකාවේ ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහි රාජ්‍ය මර්දනය

# இலங்கை மாணவர் அமைப்பிற்கு எதிரான அரச அடக்குமுறை

# State Suppression Against Students Movement of Sri Lanka

## වසර හතරක සිදුවීම් වාර්තාව
## நான்கு வருட சம்பவங்களின் அறிக்கை
## Reporting the Incidence of Four Years




මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය
மனித உரிமைகளை பாதுகாக்கும் மாணவர் அமைப்பு
Students for Human Rights

**අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය**
**அனைத்து பல்கலைக்கழக மாணவர் பேரவை**
**Inter University Students' Federation**


படிப்பகம்

# පටුන

ප්‍රවේශය

2010 - 2014 තුළ ශිෂ්‍ය මර්දනය

සබරගමුව විශ්වවිද්‍යාලය 10

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 18

රජරට විශ්වවිද්‍යාලය 22

කැලණිය විශ්වවිද්‍යාලය 28

අග්නිදිග විශ්වවිද්‍යාලය 32

යාපනය විශ්වවිද්‍යාලය 34

සාරිපුත්ත භික්ෂු විද්‍යායතනය 36

බෞද්ධ හා පාලි විශ්වවවිද්‍යාලය 36

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය 36

විවෘත විශ්වවිද්‍යාලය 36

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 38

රුහුණ විශ්වවිද්‍යාලය 46

සෞන්දර්ය විශ්වවිද්‍යාලය 49

මර්දනයට අදාළ විශේෂ සිදුවීම්


ජානක හා සිසිත ඝාතනය කිරීම 52

රුහුණ විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ හර්ෂ ගුණවර්ධන පැහැරගෙනයාමට උත්සාහ කිරීම හා පහරදීම 54

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ජනක නිලංග මදුෂාන් පැහැරගෙන යාම හා තර්ජනය කිරීම 55

කැලණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති සුරංජිත් බණ්ඩාරට පහරදීම 56

අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු කිඹුල්ලෑවේ චන්ද්‍රානන්ද හිමිට එරෙහි මර්දනය 57

කැලණිය විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් ශ්‍යාමලී ලියනආරච්චිට එරෙහි මර්දනය 59

රජරට විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ඉසුරු බණ්ඩාරට එරෙහි මර්දනය 60

අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු සංජීව බණ්ඩාරට එරෙහි මර්දනය 61

අධ්‍යාපන ආයතන මිලිටරිකරණය හරහා සිදුකරන මර්දනය 64

පසුවදන 66

ඇමුණුම් 67

## ප්‍රවේශය

ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් කඩවීම් හේතු කොටගෙන ලංකාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානවල හා විවිධ රටවල අවධානය යොමු වී ඇත. ලංකාවේ ආණ්ඩුව එක පසකින් මානව හිමිකම් අමු අමුවේ කඩ කරමින්ද, අනෙක් පසින් ජාත්‍යන්තර වශයෙන් එල්ල වී ඇති අවධානය හේතුවෙන් ලංකාවේ මානව හිමිකම් පිළිබඳ ව්‍යාජ වාර්තා සකසමින්ද මේ වන විට පසුවේ. මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නය කේන්ද්‍ර කරගෙන විදේශීය රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකා රජය ප්‍රශ්න කරන සෑම විටම ඔවුන් එය අධිරජ්‍යවාදී අතපෙවීම ලෙස හුවා දක්වමින් ලංකාවේ ජනතා සහාය ආණ්ඩුව වෙත දිනාගැනීමට යොදාගනු ලබයි. එක් පැතකින් මර්දනය හරහා දේශපාලන ක්‍රියාකාරිකයන්, වෘත්තිකයන් ඉලක්ක කර ඔවුන් අඩපණ කිරීමේද, එමඟින් ඇතිවන විදේශීය බලපෑම පාදක කරගනිමින් පොදු ජනතා සහාය හා ප්‍රසාදය ආණ්ඩුව වෙත දිනාගැනීමේද වංචනික ක්‍රීඩාවක යෙදීම සැබෑ ලෙස ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් ඉල්ලා සිටින ප්‍රගතිශීලී සංවිධාන හා ක්‍රියාකාරිකයින්ට ඇති අභියෝගයකි. ලංකාවේ සිංහල, දෙමළ හා මුස්ලිම්, ජනතාව තුළ පාලකයන් විසින් ගොඩනගා ඇති ජාතිවාදී අදහස් යාවත්කාලීන කරමින්ද ප්‍රතිවිරෝධතා අවුස්සමින්ද, ඒ හරහා සිංහල බහුතරයගේ විකෘති කරන ලද ජනමතය දිනාගනිමින්ද සිටී. රජයට විරුද්ධව කටයුතු කරන ඕනෑම දේශපාලන සංවිධානයකට LTTE ලේබල් ඇලවීමත්, ජාත්‍යන්තර කුමන්ත්‍රණකාරීන් යැයි හංවඩු ගැසීමත්, රජය හා රාජ්‍ය මාධ්‍ය රිසි සේ සිදුකරනු ලබයි. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් පසුගිය වසර තුන තුළ දී ගෙන ගිය වැඩවර්ජන කාලයන් තුළදී ඔවුන්ට එරෙහිව එල්ල කළ චෝදනාව වූයේද මෙයයි. විවිධ දේශපාලන පක්ෂවලට, වෘතීය සමිති නායකයින්ට හා මාධ්‍යවේදීන්ට එරෙහිවද මෙම චෝදනාවම යොදාගනු ලබයි. වෘත්තිය සමිති නායකයන්ටද, මාධ්‍යවේදීන්ටද මෙම චෝදනාව එල්ල කිරීම සාමාන්‍ය සිරිතයි.

පසුගිය වසර කිහිපය තුළ ලංකාවේ මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය කඩවීමට අදාළව විවිධ සිදුවීම් වාර්තා විය. මාධ්‍යවේදීන් පැහැර ගැනීම, මාධ්‍ය ආයතනවලට ගිනිතැබීම, දේශපාලන ක්‍රියාධරයින් පැහැරගැනීම, දෙමළ පුරවැසියන් ඉලක්ක කරගත් විශේෂ පැහැරගැනීම් ගණනාවක් සිදුකිරීම, උද්ඝෝෂණවලට වෙඩි තැබීම, පහරදීම, මිනිසුන් ඝාතනය කිරීම, පොලිස් අත් අඩංගුවේදී චූදිතයන්ට පහරදීම හෝ වෙඩිතබා මරාදැමීම ආදී සිදුවීම් ගණනාවක් වාර්තා විය.

විශ්වවිද්‍යාල ප්‍රජාවට අදාල තත්ත්වය රටේ පොදු මානව හිමිකම් උල්ලංගණය කිරීමේ ප්‍රකාශනයකි. විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවට එරෙහිව පාලකයන් මෙතෙක් අනුගමනය කළ උපක්‍රම වන්නේ නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන යොදා කරන මර්දනය, උද්ඝෝෂණවලට කෙරෙන පහරදීම්, බියවැද්දීම්, නායකයින් ඉලක්ක කර සිදුකරන මර්දනය ආදියයි. පසුගිය වසර 04 තුළ ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පන්ති තහනම් කිරීම් 1420 ද අත්අඩංගුවට ගැනීම් 231 ක් ද නඩු පැවරීම් 164 ක් ද වාර්තා විය. 1990 වෙන් පසු ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහි රාජ්‍ය මර්දනය උග්‍ර ලෙසම ක්‍රියාවට නැගුණු කාලය වූයේ පසුගිය ගෙවුණු වසර කිහිපයයි. එහිදී සරසවි සිසුන් තිදෙනෙක් ඝාතනය කෙරුණි. සුසන්ත බණ්ඩාර, ජානක ඒකනායක හා සිසිත ප්‍රියංකර මෙලෙස ඝාතනයට ලක්විය. මෙම සිදුවීම් තුනේදීම මාධ්‍ය යොදා හා ව්‍යාජ ප්‍රචාරණයන් සිදුකර චෝදනා යටපත් කිරීමටද, අධිකරණ ක්‍රියාවලිය හරහා කල් වැරීමටද ආණ්ඩුව කටයුතු කර ඇත. රුහුණ සරසවියේ හිටපු සභාපති, හර්ෂ ගුණවර්ධන අංක තහඩු සඟවන ලද මෝටර් රථයකින් පැහැර-ගැනීමට තැත්කරන ලදි. යාපනය සරසවි සිසු නායක ශ්‍රීදරන් මෙලෙස පැහැරගෙන ගොස් පහර දී හා දමා ගොස් තිබුණි. පසුගිය වසර තුනක පමණ කාලය තුළ වරින්වර තෙවරක්

අත්අඩංගුවට ගෙන මුදාහළ අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු සංජීව බණ්ඩාර නැවත වරක් සිරගත කිරීමේ සූදානමක්ද ඇත. පසුගිය වසර හතරක පමණ කාලය තුළ ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහිව ක්‍රියාත්මක වූ මර්දනය පිළිබඳ කරුණු සහිත වාර්තාවක් මෙමඟින් ඉදිරිපත් කෙරේ.

මෙලෙස රාජ්‍ය මර්දනය ප්‍රබල ලෙස ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහිව ක්‍රියාත්මක වීමේ ප්‍රධාන හේතුව වන්නේ ලංකාවේ උසස් අධ්‍යාපනය පෞද්ගලීකරණයටත් පාසල් අධ්‍යාපනය තවදුරටත් පෞද්ගලීකරණය කිරීම සඳහාත් පාලකයන්ට ඇති වුවමනාවට ශිෂ්‍යයන් එරෙහි වීමයි. එමෙන්ම පසුගිය දශක තුන හමාරක් තුළ ලංකාවේ දේශපාලනයට ප්‍රධාන බලපෑමක් කල බහුජන ව්‍යාපාරයක් ලෙස ශිෂ්‍ය ව්‍යාපාරය එම භූමිකාවෙන් අතුගා දැමීමත් තවත් අරමුණකි.

ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලබන නවලිබරල් ධනවාදී ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් පීඩාවට පත් වන ජනතාවගේ සටන් මර්දනය කිරීමත්, ජනතාව ජාතිවාදී ලෙස බෙදා වෙන්කිරීම විසින් පැනනගින ජාතිවාදී ක්‍රියාකාරීත්වයන් වර්ධනයවීමත්, බරපතළ ලෙස ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් කඩවීම සීඝ්‍රවීමට පසුබිම් වී ඇත. වර්ධනය වීමට පසුබිම් වී ඇත.

ලංකාව තුළ ඇති මානව හිමිකම් කඩවීම් පිළිබඳව විදේශීය රාජ්‍යයන් හා විවිධ සංවිධාන වලින් නැගෙන හඬ විදේශීය බලපෑම් ලෙස නම්කර තවදුරටත් ජනතා සහය ලබාගැනීමේ දේශපාලන ක්‍රීඩාවක පාලකයන්ට හැකිව ඇත්තේ ඒ සඳහා මැදිහත් වන සමහර ආයතන හා රටවල් තුළ ඇති සැඟවුණු අරමුණු ද හේතුවෙන්ය. ආර්ථික පිළිවෙතේදී මුළුමනින්ම අධිරාජ්‍ය ගැති වූ පාලකයන්ට දේශපාලන තලයේදී ව්‍යාජ අධිරාජ්‍ය විරෝධයක් රඟදැක්වීමේ අවස්ථාවද, ඒ තුළින් පිට පිට මැතිවරණ ජයගැනීමේ හැකියාවද තිලිණ කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් පිළිබඳ ගැටළු ජාතික මෙන්ම ගෝලීය සීමාවන් තුළත් අනාගතයේදී තවත් උග්‍ර වනු ඇත. මේ සඳහා මානව හිමිකම් අගයන, ප්‍රජාතන්ත්‍රවාදයට ගරුකරන පුද්ගලයින්ගේත් ක්‍රියාකාරිකයන්ගේත් සංවිධානවලත් තියුණු මැදිහත්වීමක් අවශ්‍යව ඇත. ජනතාව මර්දනය කරන හා ජනතාව රවටන, වත්මන් පාලනය හෙළිදරව් කිරීම් සඳහා මෙම වාර්තාව ඉවහල් වේ යැයි අප සිතමු.

| විශ්වවිද්‍යාලය | ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම් | නඩු පැවරීම් | | සිරගත කිරීම් | මැර ප්‍රහාර | | මරණ තර්ජන | | ඝාතන | පැහැර ගෙන යාම් | ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නඩු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | අවස්ථා | ශිෂ්‍ය සංඛ්‍යාව | අවස්ථා ගණන | ශිෂ්‍ය සංඛ්‍යාව | | | ශිෂ්‍ය සංගම් ගණන | අවස්ථා ගණන |
| සබරගමුව | 141 | 02 | 16 | 05 | 3 | 14 | 49 | 61 | - | 1 | 05 | 02 |
| කැලණිය | 87 | 7 | 48 | 5 | 34 | 47 | 25 | 76 | 1 | - | | |
| රුහුණ | 60 | 13 | 63 | 09 | 10 | 10 | 16 | 45 | 2 | - | 2 | 2 |
| ජයවර්ධනපුර | 391 | 127 | 85 | 8 | 08 | 16 | | | | - | 02 | 02 |
| පේරාදෙණිය | 223 | 7 | 39 | 21 | 5 | 8 | 35 | 24 | - | 1 | 08 | 1 |
| සෞන්දර්යය | 18 | - | - | - | - | - | - | - | - | - | 4 | 1 |
| රජරට | 71 | 4 | 41 | 13 | 6 | 16 | 5 | 12 | - | 1 | 1 | 1 |
| අග්නිදිග | 53 | 1 | 53 | - | - | - | - | - | - | - | - | - |
| යාපනය | - | 1 | 13 | 13 | 11 | 68 | - | - | - | - | - | - |
| බෞද්ධ හා පාලි | 197 | 2 | 68 | - | - | - | - | - | - | - | 3 | 1 |
| බුද්ධ ශ්‍රාවක | 48 | - | - | - | - | - | - | - | - | - | 1 | 1 |
| විවෘත | 05 | | | | | | | | | - | 05 | 1 |
| ඌව වෙල්ලස්ස | 72 | - | - | - | - | - | - | - | - | - | 5 | - |
| ශාරිපුත්‍ර භික්ෂු | 54 | - | - | - | - | - | - | - | - | - | - | 1 |
| එකතුව | 1420 | 164 | 426 | 74 | 77 | 179 | 130 | 218 | 3 | 3 | 36 | 13 |

සැ.යු - මෙම වගුවෙහි අඩංගුවන දත්ත, මෙතෙක් අපවෙත ලබාගත ගැකිවූ තොරතුරු ඇසුරෙන් පමණි

padippakam
படிப்பகம்

# සබරගමුව විශ්වවිද්‍යාලය

| විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම් | | 141 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 2 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 16 |
| සිරගත කිරීම් | | 5 |
| පැහැරගෙන යාම් | | 1 |
| මැර ප්‍රහාර | අවස්ථා | 3 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 14 |
| මරණ තර්ජන | අවස්ථා ගණන | 49 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 61 |
| ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | ශිෂ්‍ය සංගම් ගණන | 5 |
| | අවස්ථා ගණන | 2 |



**The IUSF says it will take its protest against the suspension of five students of Sabaragamuwa University to international forums.**

**2013.06.09**
**infolanka.com**

padippakam

# පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

01. **දිනය** 2011 ජනවාරි 03

**සිදුවීම** 2011 ජනවාරි 03 දින නවක සිසුන් සඳහා පත්‍රිකාවක් බෙදීම

**චෝදනාව** නවක වදය ලබාදීම

**දඬුවම**

| ශිෂ්‍යභාවය අහෝසි කිරීම(කාලය) | වසර 2යි මාස 3ක | වසර 2 | වසර 1කයි මාස 6ක | වසර 1ක | මාස 9ක | මාස 6ක |
|---|---|---|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | 1 | 2 | 1 | 7 | 7 | 40 |

**ගත් ක්‍රියාමාර්ග** 01. මානව හිමිකම් කොමිසන් සභාවට පැමිණිලි කිරීම
02. අභියාචනා දැමීම

**මර්දනයට ලක් වූ සිසුන්**

කේ.ඩී.ආර්. දිසානායක
ආර්.කේ.එම්. මධුරංග
ඩී.එම්.එම්.සී. දිසානායක
එම්.එස්.එස්. තෙන්නකෝන්
බී.පී.සී.එල්. හරිස්චන්ද්‍ර
කේ.එස්. ප්‍රභාත්
එස්. මුරලික්‍රිෂ්ණා
එච්.එම්.එන්.එස්. සංජීව
කේ.එම්.ටී.පී.සී. කුමාරිහාමි
පී.එන්.වයි. දයාරත්න
බී.එම්.එච්.එන්. හේමචන්ද්‍ර
පී.එම්.එස්. ප්‍රියදර්ශන
ඒ.ඒ.ජේ.සී. ද අතාවුද
ඩබ්ලිව්.කේ.එස්. ප්‍රනාන්දු
එම්.එස්.ආර්. ද සිල්වා
ආර්.එස්.ඒ. හේමකාන්ත
කේ.ඒ.ඩී.එස්. මධුශාන්ත
බී.එල්.එස්.යූ. කුමාර
ටී. හෙන්ස්මන්
ටී. නාසේකෙනන්
එස්. ප්‍රතිපන්
එන්. පෝරුමන්
එස්.එෆ්. කෘෂප්
කේ.එස්. චාමර
ඩබ්ලිව්.එම්.ඒ.යූ. ජයලත්
ඩබ්ලිව්.පී.ඩී.සී.ආර්. කුමාර
ආර්.ඒ.පී. මධුසංඛ
එෆ්.එච්.එස්. සංඛපාල
එම්.පී.අයි.එන්. සරත්චන්ද්‍ර
ඩබ්ලිව්.ජී. සුමිත්
පී.කේ.එස්.එම්. විජයගුණවර්ධන
ජී.ඒ.ටී. ධර්මජීව
එස්.එච්.ඩී. දිල්හානි
කේ.ඒ.එන්. ජයාශානි
එච්.ඩී. කරුණාරත්න
එච්.සී. කසුනිකා
ඩබ්ලිව්.ඩී.බී.එම්. කීර්තිසිංහ
එන්.එන්. කෝදාගොඩ
ඩබ්ලිව්.ඒ.පී. මධුශානි
ටී.එච්.සී. ප්‍රියදර්ශනි
වයි.බී.ටී. ප්‍රියංගනි
ඩී.එම්.අයි. සෙව්වන්දි
ඩී.කේ.වී.කේ. විජේවික්‍රම
එච්.එම්.එස්.පී. හේරත්
එස්.පී. අගලවත්ත
එච්.කේ.එච්.සී. හේමකුමාර
ජේ.කේ.ඩී.ඩී. නුවන්
එම්.ඩී.කේ. වීරරත්න
ආර්.එම්.ඩී.අයි. රත්නායක
එස්. රණවක
එම්.පී.ඒ. නුවන්
අයි.ඩී. මල්වැන්න
ඒ.වී.ඩබ්ලිව්. හෙට්ටිහේවා
ඩී.එම්.එන්.බී. දිසානායක
කේ.ඩී. දර්ශන
ඩී.එම්.ඩී.සී. විජේකෝන්
බී.පී.එල්.කේ. චතුරංග
ඩබ්ලිව්.ඒ.පී. මධුශානි



படிப்பகம்

02. **දිනය** 2013 මාර්තු 15

**සිදුවීම** 2013 මාර්තු 12 දින විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය බඳවා ගැනීම් 30% කින් කප්පාදු කිරීම, විශ්වවිද්‍යාල ගාස්තු 500% ගුණයකින් ඉහළ දැමීම, විශ්වවිද්‍යාල දේපල (ක්‍රීඩා පිටිය, පුස්තකාලය, පිහිනුම් තටාකය, ශ්‍රවණාගාරය) විකිණීම ආදී වූ අධ්‍යයන සුහසාධන ගැටළු හා අධ්‍යාපනය විකිණීමට ගෙන ගිය ආණ්ඩුවේ ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කිරීමට විශ්වවිද්‍යාලයේ සියලු සිසුන් එක්ව පොදු රැස්වීමක් පැවැත්වීම

**චෝදනාව** නීති විරෝධී රැස්වීමක් පැවැත්වීම, රාත්‍රි 8 න් පසු විශ්වවිද්‍යාල භූමිය තුළ රැඳී සිටීම, අවසරයකින් තොරව බාහිර පුද්ගලයකු රැස්වීමට කැඳවීම (එවැනි කිසිවකු පැමිණියේ නැත) විශ්වවිද්‍යාලය අපකීර්තියට පත්කිරීම

**දඬුවම** 01. මහා ශිෂ්‍ය සංගමය ඇතුළු සියලුම ශිෂ්‍ය සංගම් තහනම් කිරීම.
02. මහා ශිෂ්‍ය සංගමයේ සියලුම නිලධාරීන්ගේ ශිෂ්‍යභාවය මාස අටකට අහෝසිකිරීම (දඬුවම ක්‍රියාත්මක කළ දිනය 2013 අප්‍රේල් 09 වන දින වන අතර එතෙක් තාවකාලිකව ශිෂ්‍යභාවය අහෝසිකර තිබුණි)

**ගත් ක්‍රියාමාර්ග** 01. මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම (සාධාරණ පරීක්ෂණයක් සිදු වූයේ නැත)
02. ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් නඩුවක් ගොනු කිරීම (පළමු නඩු විභාගයේදී විභාගවලට ඉදිරිපත්වීමේ අවස්ථාව ලබාදීමට තීන්දුවක් ලබාදුන් නමුත් ඉන් අනතුරුව පැවති විභාගවලදී එම අවස්ථාවද ලබා නොදෙන ලදී. තවමත් මෙම නඩුව විභාග වේ.)

**මර්දනයට ලක්වූ සිසුන්**
එස්.එච්.එම්.බී. ගුණසේකර
එම්.එල්.ඩී.ඩී.එස්. කුමාර
ඊ.එම්.එච්.පී. ඒකනායක
ටී.එච්.එන්. චින්තක

03. **දිනය** 2013 අප්‍රේල් 01

**සිදුවීම** විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය බඳවා ගැනීම් කප්පාදුව පිළිබඳව ආචාර්යවරුන් දැනුවත් කිරීමට ලිපියක් ලබාදීම

**චෝදනාව** ශිෂ්‍ය සංගම් තහනම් කොට ඇති බැවින් ලිපි පත්‍රිකා බෙදීම නීති විරෝධීවීම හා අසත්‍ය තොරතුරු බාහිර පාර්ශව වෙත ලබාදීම

**දඬුවම** මාස අටකට ශිෂ්‍යභාවය අහෝසි කිරීම

**ගත් ක්‍රියාමාර්ග** අභියාචනා දැමීම

**මර්දනයට ලක්වූ සිසුන්**
එස්.එච්.එම්.බී සඳරුවන්

04. **දිනය** 2013 ජුනි 04

**සිදුවීම** නීති විරෝධී අයුරින් තහනම් කළ ශිෂ්‍ය සංගම් යළි ලබාගැනීම, ශිෂ්‍යභාවය අහෝසි කළ සිසුන්ගේ ශිෂ්‍යභාවය නැවත ලබාගැනීම අරමුණු කරගනිමින් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සත්‍යග්‍රහයක් පැවැත්වීම

**චෝදනාව** සත්‍යග්‍රහය නිසා උපකුලපතිතුමාට බියකින් හා සැකයකින් තොරව සිය රාජකාරී කිරීමට නොහැකි පරිසරයක් නිර්මාණය කිරීම, ආණ්ඩුව නම් කළ ජනරජ දිනය පැවැත්වීමට නොහැකි වීම, පාලක සභාව ලබාදුන් විනය තීන්දු ඉවත් කිරීමට බලකිරීම, පරිපාලනය බිය වැද්දීම හා තර්ජනය කිරීම, කටවුට් පොස්ටර් ඇලවීම, විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට හානි පැමිණවීම, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම ඉහත කාරණා එකක් හෝ කිහිපයකට සම්බන්ධවීම.

**දඬුවම**

| ශිෂ්‍යභාවය අහෝසි කිරීම (කාලය) | වසර 1කයි මාස 6යි | මාස 9යි | මාස 7 | මාස 5 |
|---|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | 13 | 12 | 01 | 08 |

**ගත් ක්‍රියාමාර්ග** 01. මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම (සාධාරණ පරීක්ෂණයක් සිදු වූයේ නැත)
02. අභියාචනා දැමීම

**මර්දනයට ලක්වූ සිසුන්**

ඩබ්ලිව්.පී.එන්.සී හපන්ගල
කේ.එම් ප්‍රියදර්ශන
එස්.එන්.ඩබ්ල.පී.එම් සෙනවිරත්න
ඩී.වී.එච්.ඒ.කේ
දෝඩංගොඩ
ජේ.එම්.ජේ.පී ජයසුන්දර
ටී.එම්.ටී.ඩබ්ලිව් නිමලවංශ
යු.අයි හිනටිගල
එස්.වි කොඩිතුවක්කු
ඩී.කේ.සී.ඒ දිසානායක
කේ.පී.ඒ.ටි ප්‍රසාද්
ජේ.ඩි විජේසිංහ
ආර්.එම්.ආර්.පී.කේ රත්නායක
එච්.එම්.එල්.ටී.එස් බණ්ඩාර
අයි.පී.බී මධුජිත්
ආර්.ඒ.කේ.එස් චතුරංග
එම්.පී.ඩී.සි බණ්ඩාර
එම්.එන්.එම්.එන් නිරෝශන්
කේ.සී.ආර් පෙරේරා
පී.ඒ.එස්.එම් සිරිමෙවන්
ඒ.කේ.එස් සංජීව
කේ.එස්.ඩී.පී කුමාර
එන්.ආර් ඕපනායක
ඒ.එස් ප්‍රියදර්ශනි
එම්.එල්.සී.එම් කරුණාරත්න
එස්.එම්.එල් ප්‍රභාත්
ඒ.එම්.ඒ.ඩී.සි කුමාර
එන්.මුතුමාල
එම්.එම්.එන්.ජේ මාපා
වි.පී.බි දේශප්‍රිය
ඒ.එල්.පී.එන් බුද්ධික
ජේ.එස් මැදගම
ඩී.එම්.එන්.බී දිසානායක
කේ.ඒ.සී.පී ප්‍රියන්කර
ආර්.එම්.එස් පී රත්නායක
ඩබ්ලිව්.එම්.එස්.ආර් බණ්ඩාර
ආර්.ටි ජයසිංහ
එස්.පී ලියනගේ
ඩබ්ලිව්.එච්.ආර්.අයි උදයන්ති
ජේ.එම්.ඩී.එම් නිරාජ්
පි.ඒ.එන් පින්නවල
ඩබ්ලිව්.කේ.බී.එච්.ඩි ෆර්නැන්ඩෝ
එස්.මොරවක
පි.පි.සී.ජේ රණසිංහ
පි.ඒ.එස්.පි කුමාරි

05. **දිනය** 2013 අගෝස්තු 01

සිදුවීම 2013 අගෝස්තු 01 කාන්තා නේවාසිකාගාරයට වරින් වර සිදු වූ විවිධ පුද්ගලයන්ගේ කඩාපැනීම් හේතුවෙන් අනාරක්ෂිත තත්වයක් නිර්මාණය වීම නිසා සිසුන් ආරක්ෂාව තහවුරු කරන ලෙස ඉල්ලා උද්ඝෝෂණයක් පැවැත්වීම හා එතනට පැමිණි පරිපාලන නිලධාරීන්ට එරෙහිව විරෝධය පළකිරීම.

**චෝදනාව** ආචාර්යවරුන්ට (මොවුන් විශ්වවිද්‍යාලයේ පරිපාලන නිලධාරීහුය) ශාරීරික හා මානසික පීඩා සිදුකිරීම, ප්‍රසිද්ධියේ අවඥාවට ලක්කිරීම හා මරණ බිය ඇති කිරීම (මෙම පුද්ගලයන් පවා මරණ තර්ජන එල්ල කිරීමක් හෝ පහරදීමක් යන්න ප්‍රතික්ෂේප කරයි)

**දඬුවම** සිසුන් 16 දෙනකුගේ ශිෂ්‍යභාවය ජීවිතාන්තය දක්වා අහෝසි කිරීම සහ සමනල වැව පොලිසිය මගින් අපරාධ නඩුවක් ගොනු කිරීම සිසුන් 18 කට විරුද්ධව.

**ගත් ක්‍රියාමාර්ග** 01. මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම
02. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීම (මෙම නඩුව තවමත් විභාග වෙමින් පවතී)
03. අභියාචනා දැමීම
(මෙම ක්‍රියාමාර්ගවලට අවතීර්ණය වීමෙන් අනතුරුව හදිසියේම විනය පරීක්ෂණ කැඳවා ජීවිතාන්තය දක්වා වූ ශිෂ්‍යභාවය අහෝසි කිරීම වෙනුවට දඬුවම් අඩුකිරීමට කටයුතු කර ඇත)

| ශිෂ්‍යභාවය අහෝසි කිරීමේ කාලය | මාස 04 | මාස 09 | අවුරුදු 12 | අවුරුදු 02 |
|---|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | 07 | 01 | 05 | 03 |

**මර්දනයට ලක්වූ සිසුන්**

එස්.ඒ.එස් ළහිරු
එස් සේනානායක
එල්.ඩබ්ලිව්.සී මධුෂාන්
එච්.එම්.ඩී.පී.කේ හේරත්
පී.එච්.සී.එස් ධර්මදාස
ආර්.එම්.එස්.එස් සෙනවිරත්න
එච්.එම්.ආර්.එච්.කේ හේරත්
නාමල් මුණසිංහ
පී.එම්.සී.පී චන්ද්‍රසේන
කේ.පී.වී.පී ප්‍රසාද්
පී.එස්.කේ විජේසිරිවර්ධන
බී.ඩබ්ලිව්.එම්.පී කුමාර
ඩබ්ලිව්.එම්.එස්.එල් දිසානායක

06. **දිනය** 2013 ඔක්තොම්බර් 10

**සිදුවීම** එවැනි කිසිඳු සිදුවීමක් සිදුවී නැත.

**චෝදනාව** නවක සිසුන්ට නවක වදය ලබාදීම, විශ්වවිද්‍යාලය තබා තිබූ විශ්වාසය බිඳ දැමීම, විනය අතුරු ව්‍යවස්ථා කඩකිරීම, විශ්වවිද්‍යාලය අපකීර්තියට ලක් කිරීම.

**දඬුවම** දින නියමයකින් තොරව සිසුන් 20 දෙනකුගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීම. පසුව විනය පරික්ෂණයක් පවත්වා පන්ති තහනම් ලබාදීම.

**ගත් ක්‍රියාමාර්ග** 01. අභියායචනා ලබාදීම.
02. නවක සිසුන් සියලුදෙනා තමන්ට නවක වදයක් සිදු නොවූ බවට සිය අත්සනින් පෙත්සමක් බාරදීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

එල්.එන්.එස්.යු විජේතුංග
ඉ.එච්.අයි.ඩී ජයරත්න
එච්.ඒ.සී ප්‍රියදර්ශනි
ඒ.එච්.කේ.එල් කුමාර
කේ.ආර් ජයමානි
ආර්.ආර්.ඩබ්ලිව් ජයවර්ධන
පී.එල් පූර්ණිමා
පී.ආර්.ඒ.එල් ඉලන්ගතිලක
එල්.එච්.එන් සඳමාලි
පී.එල්.එල්.කේ සමන්ත
යූ.ඒ.ඒ නිර්මානි
ජේ.පී.අයි කුමාර
ඩබ්ලිව්.පී.එම් ගයානි
ඩබ්ලිව්.ඩබ්ලිව්.ටී.ඒ සම්පත්
එල්.ඒ.එම්.එච්.එල් ආරච්චි
ආර්.එච්.සී සඳරුවන්
ටී.එම්.ඒ.සී කුලතිලක
පී.අයි කුමාර
ඩබ්ලිව්.පී.එම් ගයානි
ඩබ්ලිව්.ඩබ්ලිව්.ටී.ඒ සම්පත්

## පහරදීම්, මරණ තර්ජන, ආරක්ෂක අංශවල බලපෑම්, අත්අඩංගුවට ගැනීම් හා සිරගත කිරීම්

01. 2013 මැයි 01 දින පඹහින්න මංසන්දියේ පැවති උද්ඝෝෂණයට ආරක්ෂක අංශ ඉතාමත් අමානුෂික ප්‍රහාරයක් එල්ල කිරීම

01. සිසුන් 150 කට ආසන්න ප්‍රමාණයක් මෙම ප්‍රහාරය හේතුවෙන් තුවාල ලැබූහ.
02. සියයක් පමණ රෝහල්ගත කරල ලද අතර සිසුන් 20 දෙනෙකු බරපතළ තුවාල ලැබීය.
03. මෙම උද්ඝෝෂණයේදී සිසුන්ට ජලය ලබාදුන් ගම්වාසීන් 2ක් හා අනධ්‍යයන සේවකයකු සිරගත කරන ලද අතර සිසුන් 10 ප්‍රමාණයකට නඩු පැවරීය.

**මර්දනයට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| එච්.එම්.සී.අයි හෙට්ටිආරච්චි | බී.බී.සී ජයසේකර |
| ජෙනඩ් | දිල්ශාන් තරින්ද |
| මුහුන්දන් | ඒ.එම්.ඒ.ඩී.සී කුමාර |
| පී.වී.පී.එල් සෝමදාස | ආර්.එම්.එල්.යු.කේ රාජපක්ෂ |

02. 2013 මාර්තු 24 දින උපවාසය පවතිද්දී අංක තහඩු රහිත ජීප් රියකින් පැමිණි පිරිසක් අහසට වෙඩි තබා තර්ජනය කර පලා යන ලදී. මේ පිළිබඳව පැමිණිලි අංක CIB 372/204 අංකය යටතේ සමනලවැව පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළද සාධාරණ පරීක්ෂණයක් සිදු වූයේ නැත.

03. 2012 ජනවාරි 10 ආචාර්යවරයකුගේ නිවසට පහරදුන්නේ යැයි චෝදනා කරමින් සිසුන් 5 දෙනෙකු 2013 ජනවාරි 12 සිට 17 දක්වා බන්ධනාගාර ගත කරල ලදි. ඔවුන් දින 7 ක් බන්ධනාගාරයේ පසුවිය.

**බන්ධනාගාර ගත කළ සිසුන්**

| | |
|---|---|
| එම්.එන්.එම්.එන් නිරෝශන් | සමිත් තිළිණ |
| ඩී.කේ.සී.ඒ දිසානායක | චන්ද්‍රසේන |
| ධනුෂ්ක හේමාල් රනසිංහ | |

04. 2013 අගෝස්තු 07 වන දින ප.ව 8.00ට කෘෂි විද්‍යා පීඨයේ හිටපු සභාපති එම්.එම්.එන්.ජේ. මාපා රැඳී සිටි ස්ථානයට පැමිණ මැරවරයින් විසින් පහර දීම හා එම ස්ථානයට අලාභහානි කිරීම.

05. 2012 ජනවාරි 10 වන දින රාත්‍රී 7.00 ට එම්.එල්.ඩී.ඩී.එස්. කුමාර ඇතුළු තිදෙනෙකුට විශ්වවිද්‍යාලය තුළදී මැර කණ්ඩායමක් විසින් පහරදීම මගින් දින 2ක් රෝහල් ගත කිරීම.

## අධිකරණය හරහා ගෙනගිය මර්දනය

01. 2013 ඔක්තෝම්බර් 24 දින පැවැත්වීමට නියමිතව තිබූ උද්ඝෝෂණය හා පාගමනට එරෙහිව වාරණ නියෝග ලබාදීම

**වාරණයට ලක්වූ සිසුන්**

- ආර්.ටී. ජයසිංහ
- එම්.පී.ඩී.සී. බණ්ඩාර
- කේ.එස්.ඩී. රන්ගන
- එන්.පී.එන් ගුණවර්ධන
- අනුරාධ අබේරත්න
- පී.වී.පී.එල් සෝමදාස
- ආර්.කේ.එස් සංජීව
- එන්.එච්.ඒ.ජේ සේනාරත්න
- ඉඳුනිල් ලක්සිත
- එම්.අයි.යු.ද සිල්වා
- ඒ.බී.යු.යු. ප්‍රියන්ත

## පැහැර ගැනීම්

01. 2013 සැප්තැම්බර් 27 දින නවක ශිෂ්‍යයකු වෑන් රියකින් පැහැරගෙන යාම හා තොරතුරු ලබාදෙන ලෙස බලකරමින් තර්ජනය කර මුදාහැරීම.

## මරණ තර්ජන එල්ල කිරීම්

01. ජංගම දුරකථන හරහා මරණ තර්ජන එල්ල කිරීම මේ පිළිබඳව පැමිණිලි අංක CIB 359/192 යටතේ ආර්.ටී. ජයසිංහ විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලද අතර සාධාරණ පරීක්ෂණයක් සිදු වුයේ නැත.

| ශිෂ්‍ය සංඛ්‍යාව | 49 |
|---|---|
| අවස්ථා ගණන | 60 |


02. ආරක්ෂක අංශ නිවෙස්වලට ගොස් තර්ජනය කිරීම

| ශිෂ්‍ය සංඛ්‍යාව | 16 |
|---|---|
| අවස්ථා ගණන | 20 |

03. පන්ති තහනම් වු ශිෂ්‍යයින් රැදිසිටින නවාතැන් හිමිකරුවන්ට තර්ජනය කිරීම.
2013.08.06 දින මේ පිළිබඳව පඹගින්න පොලිසියේ 54/48 CIB 2013.08.07 දින පැමිණිල්ලක් කර ඇත.

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

| විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම් | | 223 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 7 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 39 |
| සිරගත කිරීම් | | 21 |
| පැහැරගෙන යාම් | | 1 |
| මැර ප්‍රහාර | අවස්ථා | 5 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 8 |
| මරණ තර්ජන | අවස්ථා ගණන | 35 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 24 |
| ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | ශිෂ්‍ය සංගම් ගණන | 8 |
| | අවස්ථා ගණන | 1 |



Police baton charged a group of university students who were protesting in front of the University Grants Commission in Ward Place a short while ago. Our reporter at the scene said that atleast four students sustained injuries during the clash.

Students of the Peradeniya, Ruhunu and Jayawardena Universities are protesting seeking several demands.

2010.05.04
Daily Mirror

# පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

01. **සිදුවීම** සිසුන් දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමක් සමථයකට පත්කිරීමට ගිය එවකට ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සංගමයේ සභාපති සහෝදරයා සහ ශාන්ත හෙන්නායක අචාර්යවරයා මෙම සිදුවීම වීඩියෝ කරනවිට එයට විරෝධය පා කරුණු දැක්වීමට උත්සාහ කිරීම.

**චෝදනාව** මෙම අචාර්යවරයාට පහරදීම (නමුත් කිසිම පහරදීමක් සිදු වූයේ නැත)

**දඬුවම** වසර 5 කට ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

02. **සිදුවීම** වසර 4 ක උපාධි පාඨමාලාවක් වශයෙන් ආරම්භ කරන ලද සමසෞඛ්‍ය පාඨමාලාව වසර 3 දක්වා කප්පාදු කිරීමට ගෙන ඇති තීරණයට විරෝධය පළ කරමින් විශ්වවිද්‍යාලය ඉදිරිපිට සත්‍යාග්‍රහයක් පැවැත්වීම හා විශ්වවිද්‍යාලය පුරා කළු කොඩි දමා විරෝධය පෑම.

**චෝදනාව** කළු කොඩි දමා විශ්වවිද්‍යාලය අපවිත්‍ර කිරීම.

**දඬුවම** මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිගේ හා තවත් ශිෂ්‍යයකුගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

**දඬුවමට ලක් වූ සිසුන්**

දිමුතු ගුණසේකර (සභාපති මහා ශිෂ්‍ය සංගමය)
පසන් හේවාවිතාරණ

03. **දිනය** 2013 අප්‍රේල් 30

**සිදුවීම** අධ්‍යාපනය විකිණීමට එරෙහිව හා විශ්වවිද්‍යාලයේ ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමට ජයතිලක ශාලාවේ නේවාසිකාගාර රැස්වීමක් පැවැත්වීම.

**චෝදනාව** නවක වදය ලබාදීම.

**දඬුවම** සති දෙකක් පන්ති තහනම් කිරීම.

**මර්දනයට ලක් වූ සිසුන්**

එම්.එල්.එම්. බුද්ධික
ඊ.එස්.පී. ප්‍රියංකර
ජේ.කේ.එච්. සම්පත්
ඒ.වී.යූ. ඉමන්ත
එච්.ඒ.බී.එම්. සඳරුවන්
ඩබ්.ජී.කේ.එච්. ගමගේ
එච්.ඒ.බී.එම්. ජයසේකර
එස්.කේ. චතුරංග

04. **සිදුවීම** අධ්‍යාපන පෞද්ගලීකරණය පිළිබඳ දෙවන වසර සිසුන් දැනුවත් කිරීමට නේවාසිකාගාර රැස්වීමක් පැවැත්වීම.

**චෝදනාව** නවක වදය ලබාදීම. (මෙය අභූත චෝදනාවක් වන අතර රැස්වීම පැවැත්වූයේද දෙවන වසර සිසුන්ටය)

**මර්දනයට ලක්වූ සිසුන්**

යූ.සී. සේනාධීර
ඩී.එම්.ඩී.වී. දිසානායක
පී.සී.එල්. පතිරණ
ඩබ්.ජී.ජී.ඒ.ඒ. මදුෂංක
එස්.පී.එල්. මධුරංග
ටී.ඩී.බී. අලුත්පිටිය
ඒ.එම්.ඩී.බී. අබේසිංහ
එම්.ඩබ්.ඒ.ටී.පී. සඳරුවන්
එම්.ඩබ්.ඒ.අයි. චන්දිමාල්

05. **සිදුවීම** දෙවන වසර සිසුන් පීඨ ආපන ශාලාවේදී සමසෞඛ්‍ය පාඨමාලා කප්පාදුව පිළිබඳ රැස්වීමක් පැවැත්වීම

**චෝදනාව** නවක වදය ලබාදීම

**දඬුවම** සති දෙකක පන්ති තහනම් ලබාදීම.

**මර්දනය ලක්වූ සිසුන්**

ඉසුරු සම්පත්
කුංචන ජයප්‍රකාශ්

06. **සිදුවීම** නේවාසිකාගාර රැස්වීමක් පැවැත්වීම

**චෝදනාව** නවක වදය ලබාදීම

**දඬුවම** සති දෙකක් පන්ති තහනම් කිරීම.

**මර්දනයට ලක් වූ සිසුන්**

H.A.D.V. පෙරේරා
S.P. රත්නායක
K.H.M.S.M. හේරත්
N.C.M. කුරේ
M.M.U.N. ගුණසිංහ
M.P.P. විජේසිරි

## නඩු පැවරීම් හා සිරගත කිරීම්

01. **සිදුවීම** විශ්වවිද්‍යාල සිසුන්ගේ දහසකුත් එකක් ඉල්ලීම් පවතිද්දී ඒ කිසිවක් කෙරෙහි කිසිඳු සංවේදීතාවයක් නොදක්වා කළමණාකරන පාඨමාලාවට අදාළව ඉදිකළ යුතු ගොඩනැගිලි වසර ගණනාවක් තිස්සේ ඉදි නොකිරීම (මේ නිසා ශාලා නොමැතිව සිසුන්ගේ සමහර දේශනපවා නොපැවැත් වේ) වසර 4 කට ආරම්භ කරන ලද සමසෞඛ්‍ය පාඨමාලාව වසර 3 කට කප්පාදු කිරීම) විශ්වවිද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ලක් සුදු හුණු ගා විවෘත කිරීමට පැමිණීම හේතුවෙන් සිසුන් උසස් අධ්‍යාපන ඇමතිවරයාට විරෝධය පා උද්ඝෝෂණයක් පැවැත්වීම

**දඬුවම** ඇමතිවරයාට හූ කීවේ යැයි නඩු පවරා සිසුන් 8 දෙනෙකු අවස්ථා දෙකකදී රක්ෂිත බණ්ධනාගාර ගතකිරීම.

**බණ්ධනාගාර ගත කළ සිසුන්**

01. පළමු නඩුව :-

නඩු අංකය :- ඊ/13239

සංධය බණ්ඩාර
මාලක බණ්ඩාර
ඉන්දික පතිරණ
දිනේෂ් වැල්ලව

02. දෙවන නඩුව :-

නඩු අංකය :- ඊ 13229

අත්තරගොඩ පියධම්ම
යසිත් තිලංක
වටරක්ගොඩ සුමන
P.R. කුමාර

02. **සිදුවීම** ඉතාමත් අසාධාරණ ලෙස අත්අඩංගුවට ගෙන සිටි හා පන්ති තහනමට ලක්කොට සිටි සිසුන් නිදහස් කිරීමට බලකරමින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට උද්ඝෝෂණයක් පැවැත්වීම.

**චෝදනාව** උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දේපලවලට උද්ඝෝෂණය අතරතුර අලාභහානි සිදුකිරීම.

**දඬුවම** සිසුන් 21 දෙනෙකු එවකට අවිශිබම කැඳවුම්කරු උදුල් ප්‍රේමරත්න අත්අඩංගුවට ගෙන සිරගත කිරීම

03. **චෝදනාව** බරපතළ ලිංගික අතවර සිදුකිරීම හා නවක වදය ලබාදීම (මෙවැන්නක් සිදු වී නැත)

**දඬුවම** තිදෙනෙකු මාස 3 ක් රක්ෂිත බන්ධනාගාර ගතකිරීම හා තවත් සිසුන් 26 දෙනෙකුට ලක්ෂ 2 ක බැගින් ශරීර ඇප නියම කිරීම.

**මර්දනයට ලක්වූ ශිෂ්‍ය නාම ලේඛනය :-**

| | | |
|---|---|---|
| යොෂාන් සඳරුවන් | සමන් පරණවිතාන | සම්පත් ලහිරු රාජපක්ෂ |
| චරිත ලක්මාල් | ධනුෂ්ක තිලකසිරි | ජගත් බන්දුල සිරිවර්ධන |
| රුචිර මදුෂංක | ධනුෂ්ක පෙරේරා | දමින්ද කුමාර |
| T.T. විදානපතිරණ | මල්ෂ රුවන්ත | T.S.L. ගුණරත්න |
| J.H.C.C. ජයරත්න | බුද්ධික ප්‍රියශාන්ත | J.A.C. හන්සිමා |
| M.G.H.N. ප්‍රියංකර | දිලීප සුදර්ශන | S.M. චාන්දනී |
| හේමාල් | P.K.L.R. නීලංග | W.K. දීපා |
| ජයන්ත බණ්ඩාර | ක්‍රිෂාන් සජිත් මේනක | D.W.G.T.M. අබේරත්න |
| T.P. තිලකරත්න | ප්‍රදීප් කුමාර | |

04. **සිදුවීම** අධ්‍යාපනය විකිණීමට එරෙහිව සටන්වැදීමේ වරදට අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගත් ශිෂ්‍ය නායකයින් තිදෙනා (යොෂාන් සඳරුවන්, චරිත ලක්මාල්, රුචිර මදුෂංක) නිදහස් කිරීමට බලකරමින් මහනුවර නගරයේ ඔරලෝසු කණුව ඉදිරිපිට උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වීම.

**චෝදනාව** නීති විරෝධී උද්ඝෝෂණයක් පවත්වා මහජන පීඩාවක් ඇතිකිරීම.

**දඬුවම** මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පැවරීම.

**චෝදනාවට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| මහේෂ් ප්‍රභාෂ්වර ලංකා | දිමුතු ගුණසේකර |
| බුද්ධික ධර්මරත්න | මංජුල මංගල කුමාර |
| රාජිත කිතුල්දෙණිය | සංජීව කසුන් |
| ධනුෂ්ක බෝධි | |

## ශිෂ්‍ය සංගම් තහනම් කිරීම්

01. **සිදුවීම** අධ්‍යාපනය විකිණීම නීතිගත කිරීමට ගෙන ආ පෞද්ගලික විශ්වවිද්‍යාල පනතට එරෙහිව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිට කොළඹ දක්වා පාගමනක් සංවිධානය කිරීම.

**චෝදනාව** විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට හානි සිදුකිරීම

**දඬුවම** මහා ශිෂ්‍ය සංගමය ඇතුළු සියලු ශිෂ්‍ය සංගම් තහනම් කිරීම.

## පැහැරගැනීම් හා තර්ජන

01. **සිදුවීම** එදින මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ජනක නිලංග මධුෂාන් සහෝදරයා සිය පියා හමුවීමට මහනුවර බස් නැවතුම්පළට පැමිණි අවස්ථාවේදී බලහත්කාරයෙන් රැගෙනගොස් ශිෂ්‍ය සංගමයේ කටයුතුවලින් ඈත්වෙන ලෙසට මරණ තර්ජන එල්ල කිරීම.

02. **සිදුවීම** පහත නම් සඳහන් සිසුන්ගේ නිවෙස්වලට ගොස් දෙමව්පියන්ට රාජ්‍ය ආරක්ෂක අංශවලට අයත් පිරිස් සිසුන් ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලින් ඉවත්කරගන්නා ලෙසට තර්ජනය කිරීම.

**මෙම බලපෑම්වලට මුහුණ දුන් සිසුන්**

තරිඳු හසන්ත (මහා ශිෂ්‍ය සංගමයේ උප සභාපති)
මහේෂ් ප්‍රභාෂ්වර ලංකා (මහා ශිෂ්‍ය සංගමයේ සභාපති)

# රජරට විශ්වවිද්‍යාලය

| විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම් | | 71 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 04 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 41 |
| සිරගත කිරීම් | | 13 |
| පැහැරගෙන යාම් | | 01 |
| මැර ප්‍රහාර | අවස්ථා | 06 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 16 |
| මරණ තර්ජන | අවස්ථා ගණන | 05 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 12 |
| ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | ශිෂ්‍ය සංගම් ගණන | 01 |
| | අවස්ථා ගණන | 01 |



The police riot squad aimed its high powered water cannons on a protest campaign that had been organized by the students of the Faculty of Medicine at Rajarata University.

2011.02.24
lankaviews.com

# පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

01. **දිනය** 2010 සැප්තැම්බර් 23

**සිදුවීම** ''සිහින හොරු අරන්'' වේදිකා නාට්‍ය පෙන්වීමට ඉඩ නොදී කොළඹ සිට නාට්‍ය පෙන්වීමට විශ්වවිද්‍යාලයට පැමිණි නාට්‍ය ශිල්පීන් හා නාට්‍ය නැරඹීමට පැමිණි පිරිස් විශ්වවිද්‍යාල පරිපාලනය මැදිහත්වී පොලිසිය යොදා ආපසු හරවා යැවීමට එරෙහිව උද්ඝෝෂණයක් පැවැත්වීම.

**දඬුවම** වසර 4 කට ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

**ගත් ක්‍රියාමාර්ග** අභියාචනා ඉදිරිපත් කිරීම.

මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.

මානව හිමිකම් නඩුවක් ගොනු කිරීම. (නඩුව දැමීමෙන් අනතුරුව වසර 4 ක ශිෂ්‍යභාවය අහෝසි කිරීම. වසර 3 කට අඩු කරන ලදී. පසුව නඩුවේදී සිසුන් නිවැරදි බව ඔප්පු විය. නමුත් නඩුව අවසන් වන විට වසර 3 ක කාලයක් ගෙවී තිබුණි)

**මර්දනයට ලක්වූ සිසුන්**

R.M.C.S. රාජපක්ෂ
K.D.M.K. තිලකරත්න
චමින්ද වීරසිංහ
පහන් බුද්ධික
ලසිත් මල්ලවආරච්චි

02. **දිනය** 2010 ඔක්තෝම්බර් 17

**සිදුවීම** ශිෂ්‍ය නායකයින් සිරගත කිරීම සම්බන්ධව පැවති පන්ති වර්ජනය හා විභාග වර්ජනය අවස්ථාවේ පරිපාලනය විසින් ශිෂ්‍යයින් පිරිසක් යොදවා විභාගය බලහත්කාරයෙන් ලියවීමට කටයුතු කළ විට ඊට එරෙහි වීම.

**චෝදනාව** දේශන ශාලාවකට පහරදීම.

**දඬුවම** සති 5 කට පන්ති තහනම් කිරීම.

**මර්දනයට ලක් වූ සිසුන්**

ජී.පී.ටී. එන් චන්ද්‍රසිරි
තුෂාර නුවන්
අශෝක නිර්මල
තිලංග දර්ශන හෙට්ටිහේවා
ධනුෂ්ක මාලිංග ජයමහ
සුනේත්‍රා කුමාරි
චතුරංග නවරත්න
අනුරුද්ධ සමන් බණ්ඩාර
එන්.ජී.පී නවරත්න
නුවන් ලසන්ත
ක්‍රිශාන්ති ගංගානි

03. **දිනය** 2011 නොවැම්බර් 05

**සිදුවීම** එවැනි සිදුවීමක් සිදු වී නොමැත.

**චෝදනාව** ''හෙල්ලරාව'' නැමැති සිසුවාට පහරදීම (එවැනි පහරදීමක් සිදුකර නොමැති අතර ඔහු විසින් බොරු පැමිණිල්ලක් සිදු කර ඇත. ඔහු ආණ්ඩුවට සම්බන්ධ ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකි)

**දඬුවම** සති පහක පන්ති තහනමක් සහ නඩු පැවරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| පී.ඒ. එස් ස්වර්ණතිලක | යූ.එම්. වීරසිංහ |
| ලසන්ත දිසානායක | දිනේෂ් පුෂ්පකුමාර |
| යූ.එම්. තිලකරත්න | උපුල් තිලකරත්න |

04. **දිනය** 2013 ජූනි 20

**සිදුවීම** ''ගමයි-සරසවියයි 2013'' වැඩසටහනට සහභාගී නොවීම. (මෙම වැඩසටහන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සංවිධානය කොට රජරට විශ්වවිද්‍යාලය තුළ සිදුකෙරිණ. ජාතික ශිෂ්‍ය වීර දිනය ද මෙදිනට යෙදී තිබෙන අතර එය සියලුම විශ්වවිද්‍යාලවල සිසුන් 1985 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව සමරයි. එහි ජාතික උත්සවය කැලණි සරසවියේ එදින පැවති අතර, එදින විශ්වවිද්‍යාලයේ වැඩසටහනට සම්බන්ධ විය නොහැකි බවත් වෙන දිනයකදී පවත්වන්නේ නම් ඒ සඳහා උපරිම සහයෝගය ලබාදිය හැකි බවත් පරිපාලනයට සිසුහු දැනුම් දුන්හ. එසේම එහිදී එයට සම්බන්ධවීමට කිසිදු සිසුවකුට ශිෂ්‍ය සංගම් හෝ ක්‍රියාකාරීන් බාධා නොකළ නමුත් ඒ සඳහා සිසුන් සහභාගී වූයේ ඉතා සුළුපිරිසක් පමණි. සිසුන් සහභාගී නොවීම කඩාකප්පල් කිරීමක් ලෙස සඳහන් වුවද එය මුළුමනින්ම සාවද්‍ය වේ. සැබවින්ම මෙම වැඩ සටහන සාර්ථකව පැවැත්වීමේ අවශ්‍යතාවයක් පාලකයන්ට නොතිබූ අතර එදිනට මෙම වැඩසටහන යොදාගැනීමේ අරමුණ ශිෂ්‍ය වීර දිනය කඩාකප්පල් කිරීම හා මර්දනය සඳහා හේතුවක් සොයාගැනීම බව පැහැදිළි විය)

**චෝදනාව** උළෙලට ශිෂ්‍ය සහභාගීත්වය වැළැක්වීම,
පීඨාධිපතිවරුන් අපහසුතාවට පත්කිරීම, උළෙල කඩාකප්පල් කිරීම හරහා විශ්වවිද්‍යාලය අපකීර්තියට පත් කිරීම.

**දඬුවම** ශිෂ්‍ය නායකයින් 8 දෙනෙකුගේ ශිෂ්‍යභාවය මාස 6 කට අහෝසි කිරීම.

**ගත් ක්‍රියාමාර්ග**
01. මෙම උස්සවයට සහභාගී නොවූ සියලුම සිසුන් සිය කැමැත්තෙන් ඊට සහභාගී නොවූ බවට සිය අත්සනින් යුතුව පෙත්සමක් ලබාදීම.
02. මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.
03. නිර්දෝශී භාවය දක්වා අභියාචනා ඉදිරිපත් කිරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| අනුරාධ ඉසුර බණ්ඩාර | අසේල සඳරුවන් |
| දිනේෂ් පුෂ්පකුමාර | සමන්ත බණ්ඩාර |
| දිනේෂ් කුමාර | සුරේෂ් මිහිර බණ්ඩාර |
| බුද්ධික සෙනෙවිරත්න | ගිහාන් අමිල |

05 . දිනය 2013 අගොස්තු 27 හා 29

සිදුවීම ශිෂ්‍ය නායකයින්ට ලබා දුන් පන්ති තහනමට හා කළමණාකරන උපාධිය විකිණීමට එරෙහිව උද්ඝෝෂණ 2 ක් පැවැත්වීම.

චෝදනාව විශ්වවිද්‍යාල භූමියේ නීති විරෝධි උද්ඝෝෂණ හා රැස්වීම් සංවිධානය කිරීම.

දඬුවම

| ශිෂ්‍යභාවය අහෝසි කිරීම් (කාලය) | වසර 03 | වසර 02 |
|---|---|---|
| සිසුන් ගණන | 4 | 9 |

ගත් ක්‍රියාමාර්ග අභියාචනා ඉදිරිපත් කිරීම.

මර්දනයට ලක්වූ සිසුන්

ලහිරු වීරසේකර
චානක ඇන්ඩෘ
අකනලු දිසානායක
ටිරාන් සමරවීර
සී.එස්. ධර්මදාස
ටී.ටී. ඇඹලවිට
විකසිත පතිරණ
චාමර සම්පත්
පී.එම්.පී.පී. කුමාර
චන්දන අතුරුපාන
සී.පී.ඒ. රණවීර
ඒ.ඒ.එම්. ප්‍රනාන්දු
තිලක් කිත්සිරි සොයිසා

06. දිනය 2013 සැප්තැම්බර් 19

සිදුවීම කළමණාකරන උපාධිය විකිණීමට එරෙහිව අත් පත්‍රිකාවක් බෙදාදීම (අත් පත්‍රිකා බෙදමින් සිටි ස්ථානයට පැමිණි විශ්වවිද්‍යාලයේ විනයපාලකවරයා සිසුන්ට පහරදීමට උත්සාහ කළ අතර සිසුන්ගේ ජංගම දුරකථන පැහැර ගනිමින් පෞද්ගලික තොරතුරු පවා පරීක්ෂාවට ලක් කළ අතර සිසුන් ඊට විරුද්ධව පොලිසියේ පැමිණිල්ලක් ද ගොනු කළහ)

දඬුවම

| ශිෂ්‍යභාවය අත්හිටුවීම් (කාලය) | වසර 01 | වසර 05 |
|---|---|---|
| සිසුන් ගණන | 1 | 5 |

## නඩු පැවරීම්, සිරගත කිරීම් හා පහරදීම්

01. දිනය 2010 ඔක්තෝම්බර් 17

සිදුවීම ශිෂ්‍ය නායකයින් සිරගත කිරීම සම්බන්ධව පැවති පන්ති වර්ජනය අවස්ථාවේ පරිපාලනය විසින් ශිෂ්‍යයින් පිරිසක් යොදවා විභාගය ලියවීමට කටයුතු කළ අවස්ථාවේ ඊට එරෙහිවීම.

දඬුවම සිසු සිසුවියන් 21 දෙනෙකුට වසර 5 ක අත්හිට වූ සිර දඬුවම්.

මර්දනයට ලක්වූ සිසුන්

තුෂාර නුවන්
අශෝක නිර්මල
එන්.ඒ.පී. නවරත්න
නුවන් ලසන්ත
සුනේත්‍රා කුමාරි
අනුරුද්ධ සමන් බණ්ඩාර
දිනේෂ් පුෂ්පකුමාර
තිලංග දර්ශන හෙට්ටිහේවා
ක්‍රිශාන්ති ගංගානි

padippakam

02. **දිනය** 2010 ඔක්තෝම්බර් 14

**සිදුවීම** සිසුන් කිහිපදෙනකු අත්තනෝමතිකව සිරගත කිරීමට එරෙහිව විරෝධය පා කොළඹ දී උද්ඝෝෂණයක් පැවැත්වීම.

**චෝදනාව** මහජන පීඩාවක් ඇති කිරීම, රාජ්‍ය දේපල හානි කිරීම.

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**

01. සිසුන් 10 නෙකු දින 28 ක් සිරගත කිරීම. (නඩුව තවම පවතී)
02. පොලීසිය ලවා උද්ඝෝෂණයට අමානුෂික ප්‍රහාරයක් එල්ල කිරීම (එහිදී සිසු-සිසුවියන් විශාල සංඛ්‍යාවක් තුවාල ලැබීය)

**ගත් ක්‍රියාමාර්ග** අභියාචනා ඉදිරිපත් කිරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| ආර්.එම්.සී. රාජපක්ෂ | නිහාල් තිලකරත්න |
| උදාර ප්‍රදීප් විජේවීර | අමිල සඳරුවන් |
| නිවන්තක සංජීව | තුසිත සුමනදාස |
| චින්තක නානායක්කාර | ඉන්දික සමීර |
| තිළිණ සඳරුවන් | ජානක උපුල් කුමාර විජේසිංහ |

## පහරදීම්

01. **දිනය** 2012 දෙසැම්බර් 08

**සිදුවීම** උත්සවයක් නිම වී යන විශ්වවිද්‍යාල භූමියේ සිට නේවාසිකාගරයට යන අතරතුර විශ්වවිද්‍යාලය ඉදිරිපිටදී පහරදීම. එම ප්‍රහාරයෙන් සිසුන් කිහිපදෙනෙකුට සුළු තුවාල සිදු වූ අතර එක් ශිෂ්‍යයකු බරපතළ තුවාල ලැබීය.

**මර්දනයට ලක්වූ සිසුන්**

උපුල් තිලකරත්න

02. **දිනය** 2012 දෙසැම්බර් 09

**සිදුවීම** විශ්වවිද්‍යාල භූමියෙන් පිට කුලී නිවාසයක පවත්වාගෙන යන තෙන්නකෝන් නේවාසිකාගාරයට රාත්‍රී 12 පමණ කඩාවැදුණු පොළු මුගුරු රැගත් මැර පිරිසක් සිසුන්ට අමානුෂික ප්‍රහාරයක් එල්ල කිරීම. එම ප්‍රහාරයෙන් සිසුන් විශාල පිරිසක් තුවාල ලැබූ අතර දෙදෙනකු බරපතළ තුවාල ලැබීය.

**ගත් ක්‍රියාමාර්ග** පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම (මේ දක්වා කිසිඳු පරීක්ෂණයක් සිදු වූයේවත් කිසිවකු අත්අඩංගුවට ගැනීමක් සිදු වූයේවත් නැත)

**මර්දනයට ලක්වූ සිසුන්**

වසන්ත අජිත්
යූ.ආර්.බී.කේ තිලකරත්න
ජේ.ජී.එස් දිසානායක



படிப்பகம்

03. **දිනය** 2013 ඔක්තෝම්බර් 11

**සිදුවීම** උත්සවයක් අතරතුර නේවාසිකාගාර වලට යමින් සිටි සිසුන් පිරිසකට පහරදීම.

**ගත් ක්‍රියාමාර්ග** පොලිස් පැමිණිලිල්ලක් ඉදිරිපත් කිරීම. (කිසිඳු පරීක්ෂණයක් සිදු වූයේ නැත)

**මර්දනයට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| මහේෂ් විජේන්ද්‍ර | දමිත් වත්තේගෙදර |
| ඩබ්.ඒ විජේකෝන් | එච් .එම්.එස්.එම් හේරත් |
| නලින් දිසානායක | |

## බිය වැද්දීම්

01. **දිනය** 2013 දෙසැම්බර් 18

**සිදුවීම** විනය විරෝධි ක්‍රියාවලට සම්බන්ධ බවට චෝදනා කරමින් දෙමාපියන් කැඳවා බියවැද්දීම. මෙහිදී සිසුන්ට එරෙහිව අභූත චෝදනා දෙමව්පියන් වෙත ඉදිරිපත් කළේය.

**මර්දනයට ලක්වූ සිසුන්**

| | |
|---|---|
| එන්.ටී. ධර්මදාස | කේ. නිහතමාන්‍ය |
| දුමින්ද ප්‍රියසාද් | එම්.ආර් එදිරිසිංහ |
| කේ.එස්. කරුණාදාස | එන්.එස් දිසානායක |
| නිපුන උදාර | ඩිල්ෂාන් ප්‍රනාන්දු |
| ජී.අයි. තිලකරත්න | ඩබ්.ඒ විජේකෝන් |
| ගයාන් චින්තක | නලින්ද දිසානායක |
| එම්.එම්. තිලකරත්න | පී.එන් බණ්ඩාර |
| එල්.එල්. සිල්වා | එම්.පී මෙන්ඩිස් |
| එස්.ඩී බණ්ඩාර | රුචිර ජයසූරිය |
| අයි.ටී සේනාරත්න | කසුන් විමුක්තික |
| ඩබ්.එස් රණිඳු | දසුන් පියුමාල් |
| එස්.වයි ආනන්ද | එස්.එම් හේරත් |
| මයුර ප්‍රසන්න | දර්ශන කුලරත්න |
| එස්.ඒ පෙරේරා | එස්.ටී හේරත් |
| යූ.එස්.ඩී ඉෂාන් | එන්.වී හේවගේ |

# කැලණිය විශ්වවිද්‍යාලය

| විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම් | | 87 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 7 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 48 |
| ඝාතන | | 1 |
| සිරගත කිරීම් | | 5 |
| පැහැරගෙන යාම් | | - |
| මැර ප්‍රහාර | අවස්ථා | 34 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 47 |
| මරණ තර්ජන | අවස්ථා ගණන | 25 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 76 |
| ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | ශිෂ්‍ය සංගම් ගණන | - |
| | අවස්ථා ගණන | - |



# පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

01. **දිනය** 2010 ජූලි 12

**සිදුවීම** අධ්‍යාපන පෞද්ගලීකරණය පිළිබඳව හා අධ්‍යයන සුහසාධන ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කිරීමට කන්නන්ගර නේවාසිකාගාරය තුළ රැස්වීමක් පැවැත්වීම.

**චෝදනාව** නීති විරෝධී රැස්වීමක් පැවැත්වීම.

**දඬුවම** උපාධි ප්‍රධානෝත්සවය තහනම් කිරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

දයාන් වීරක්කොඩි (2010 මහා ශිෂ්‍ය සංගමයේ සභාපති)
මේනකා සමන්මලී
ලක්මාලි හේරත්

02. **දිනය** 2010 අගෝස්තු

**සිදුවීම** අත්තනෝමතිව සිසුන් සිය ගණනකට නේවාසිකාගාර අහිමිකරමින් නේවාසිකාගාර මාරු කිරීමට එරෙහි වීම (මේ දක්වා විශ්වවිද්‍යාලය තුළ පැවති සිසුන් 600 කට පමණක් ඉඩ පහසුකම් ඇති නේවාසිකාගරවල පිරිමි සිසුන්ද, විශ්වවිද්‍යාලයෙන් බැහැර පිහිටි සිසුන් 1500කට ඉඩ පහසුකම් ඇති කන්නන්ගර නේවාසිකාගරයේ ශිෂ්‍යාවන්ද නේවාසිකව සිටියහ. හදිසියේම පරිපාලනය විසින් මෙම නේවාසිකාගාර මාරු කිරීමට, එනම් 600ක් පමණ වන පිරිමි සිසුන් 1500 ක ඉඩ පහසුකම් ඇති කන්නන්ගර නේවාසිකාගාරයට යැවීමටද, එහි සිටි ශිෂ්‍යාවන් 1500 ක් 600කට ඉඩ පහසුකම් ඇති අභ්‍යන්තර නේවාසිකාගාරයට රැගෙන ඒමටද තීරණය කළේය. මෙහි අරමුණ වූයේ පිරිමි සිසුන් විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටීම ශිෂ්‍ය දේශපාලනයට පහසුවක් ලෙස සැලකීමත් හා විශ්වවිද්‍යාලයෙන් පිටතට ගෙනගිය විට උද්ඝෝෂණ හා ශිෂ්‍ය සටන් නවතී යැයි සිතීමත්ය. නමුත් මේ නිසා ශිෂ්‍යාවන් 900 කට නේවාසිකාගර පහසුකම් අහිමිවිය. ඒ නිසා එයට විරෝධය පෑ සිසුන් මෙම තීරණය පිළිනොගැනීමටත් නේවාසිකාගාර තුළ රැඳී සිටීමටත් තීරණය කළහ.
අවසානයේ සිසුන් බලහත්කාරයෙන් ඉවත් කිරීමට තීරණය කළ බලධාරීන් සිසුන්ට අමානුෂික පොලිස් ප්‍රහාරයක් එල්ල කර බලහත්කාරයෙන් ඉවත් කිරීමට කටයුතු කළේය.

**චෝදනාව** නීති විරෝධී ලෙස නේවාසිගාරයේ රැඳීසිටීම.

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**

01. පොලිස් ප්‍රහාරයක් එල්ල කර සිසුන් විශාල ප්‍රමාණයකට තුවාල සිදුකිරීම.
02. ශිෂ්‍ය සංගමය තහනම් කිරීම.
03. ශිෂ්‍ය නායකයින් සිව් දෙනෙකුගේ ශිෂ්‍යභාවය වසර 4 කට අත්හිටුවීම.

**මර්දනයට ලක් කළ සිසුන්**

ජානක බණ්ඩාර ඒකනායක
රසික ඒකනායක
සුරංජිත් බණ්ඩාර
කසුන් සමරසිංහ

03. දිනය 2011 නොවැම්බර් 15

**සිදුවීම** නවක සිසුන් පිළිගැනීම සඳහා කැවුම් කිරිබත් ලබාදී උත්සවයක් සංවිධානය කිරීම (මෙය මීට පෙරද සෑම වර්ෂයකදීම සිදු වූ සංස්කෘතික ක්‍රියාරකමකි)

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**

01. සිසුන් 11 කගේ ශිෂ්‍යභාවය තාවකාලිකව අහෝසි කිරීම.
02. සිසුන් දෙදනකුගේ ශිෂ්‍යභාවය වසරකට අත්හිටුවීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

රසික ඒකනායක (සභාපති-මහා ශිෂ්‍ය සංගමය)
ජානක බණ්ඩාර ඒකනායක (ලේකම්-මහා ශිෂ්‍ය සංගමය)

04. දිනය **2012 නොවැම්බර් 19**

**සිදුවීම** බලහත්කාරයෙන් නේවාසිකාගර මාරු කිරීමට විරෝධය පා සිසුන් කන්නන්ගර නේවාසිකා-ගාරයට යාම.

**චෝදනාව** රාජ්‍ය දේපලකට අනවසරයෙන් ඇතුල් වීම.

**මර්දනය සිදු කළ ආකරය**

මාස 6කට ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

**මර්දනයට ලක් වූ සිසුන්**

රුවන් කරවනැල්ල
ප්‍රියාන් මධුෂ්ක
ඩයස් නාමරත්න
කිංස්ලි ගුණරත්න
උදයංග ජයසිංහ
දිලුම් වික්‍රමආරච්චි
සුනිල් පද්මසිරි
චාමික සඳරුවන්
නුවන් බුද්ධික

## අත්අඩංගුවට ගැනීම්, සිරගත කිරීම් හා නඩු පැවරීම්

01. දිනය 2010 ජූලි 23

**සිදුවීම** රුහුණ විශ්වවිද්‍යාලයේ සුසන්ත බණ්ඩාර සොහොයුරා ඝාතනය කිරීමට එරෙහිව පෝසටරයක් ඇලවීම.

**චෝදනාව** රාජ්‍ය විරෝධී ක්‍රියා.

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**

01. ජූලි 25 දින රක්ෂික බණ්ධනාගාර ගත කිරීම.
02. නඩු පැවරීම (නඩුව තවමත් ක්‍රියාත්මකයි)

**මර්දනයට ලක්වූ සිසුන්**

ධනුෂ්ක මධුෂන්ක
සුරංග ලක්මාල්

02. **දිනය** 2010 නොවැම්බර් 14

**සිදුවීම** අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු උදුල් ප්‍රේමරත්න සහෝදරයා අසත්‍ය චෝදනා එල්ලකර අත්අඩංගුවට ගැනීමට එරෙහිව පෝසටරයක් ඇලවීම.

**චෝදනා**
01. රජයට විරුද්ධව මිනිසුන් පෙළඹවීම.
02. අධිකරණයට අපහාස කිරීම.
03. අත්අඩංගුවට ගත් සැකකරුවන් නිදහස් කිරීමට බලකිරීම.
04. මුද්‍රණාලයක් සඳහන් නොමැති පෝස්ටර් ඇලවීම.

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**

2010 නොවැම්බර් 14 දින රාත්‍රියේ පෝස්ටර් අලවමින් සිටියදී කටුනායක ප්‍රදේශයේදී කටුනායක පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන දින 7 ක් රක්ෂිත බන්ධනාගාර ගතකිරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

දයාන් වීරක්කොඩි (එවකට මහා ශිෂ්‍ය සංගමයේ සභාපති)
ජානක බණ්ඩාර ඒකනායක

**විශේෂ** 2011 ජනවාරි නඩු වාරයෙන් පසු මෙම නඩුව උසාවියේදී නොගැනීම හේතුවෙන් ඉන් අනතුරුව දයාන් වීරක්කොඩි ඒ සඳහා පැමිණියේ නැත. නමුත් පසුව හදිසියේම විවෘත වරෙන්තු යවා (ඊට පෙර උසාවියට ඉදිරිපත්වන ලෙසට සිතාසි යවා නැත) අධිකරණය මඟ ඇරියේ යැයි යන චෝදනාපිට 2013 දෙසැම්බර් 24 දින අත්අඩංගුවට ගෙන 2013 දෙසැම්බර් 30 දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකිරීම.

03. **දිනය** 2013 සැත්තැම්බර් 16

**සිදුවීම** ශිෂ්‍යයින් රාත්‍රි කාලයේ කන්නන්ගර නේවාසිකාගාරයට යාමේ ඒමේදී දිගින් දිගටම මැර ප්‍රහාරවලට ලක්වීමට සිදුවිය. වසර 2 ක කාලයක් තුළ පමණක් එවැනි පහරදීම් 30 කට වඩා සිදු වූ අතර සිසුන් විශාල වශයෙන් පීඩාවට පත්වූහ. මේ පිළිබඳ පොලිස් පැමිණිලි හෝ පරිපාලනයට කරන ලද පැමිණිලි නිශ්ඵල වූ අතර මෙම පහරදුන් පුද්ගලයන්ට දේශපාලන රැකවරණය ලැබිණි.

2013 සැත්තැම්බර් 14 දින එහි ඊළඟ පියවර වශයෙන් අළුයම 2.30 ට පමණ නේවාසිකාගාරයට කඩා වැදුණු මැර පිරිසක් ආරක්ෂක නිලධාරීන්ටද පහරදී සිසුන්ගේ යතුරු පැදි 13 කට අලාභ හානි සිදුකර සිසුන්ට තර්ජනය කර පලා ගිය අතර එම සිද්ධියෙන් අනතුරුව සියලු සිසුන් ආරක්ෂාව ඉල්ලා විශ්වවිද්‍යාල භූමියට පැමිණ ආපනශාලාවේ පදිංචි වූහ. එහිදීද පරිපාලනය නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම හේතුවෙන් සිසුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම දක්වා පාගමනක් සංවිධානය කිරීමට තීරණය කළ අතර එයට එරෙහිව මහර මහේස්ත්‍රාත් අධිකරණය වාරණ නියෝගයක් නිකුත් කිරීම.

**වාරණ නියෝග නිකුත් කළ සිසුන්**

| | |
|---|---|
| ඩී.කේ. ගුණරත්න | ආර්.එම්. කැලණි කුමාර |
| ජී.එස්. මදුරංග | ඩබ්ලිව්.ඩී.එච්.බී. කුලසූරිය ශිෂ්‍යයාව |
| එල්.ඒ.ඩී.ටී. ශ්‍යාමලී ශිෂ්‍යයාව | ජී.එල්.එසි. දයාන් නන්දන |
| ජී.වී.පී.පී. පතිරණ | එම්.පී.සී. රණසිංහ |
| ආර්.ඒ.වී.යූ. රණසිංහ | ඩබ්.ඩබ්.එම්.ඊ.ජී.පී.එම්.බී. වික්‍රමසිංහ |
| බී.ජී.සී. සඳරුවන් | |

04. දිනය 2013 ඔක්තොම්බර් 04

සිදුවීම 2013 සැප්තැම්බර් 04 වන දින නේවාසිකාගාරවල ආරක්ෂාව තහවුරු කරන ලෙස බලකරමින් පැවැත්වීමට නියමිතව තිබූ උද්ඝෝෂණ ව්‍යාපාරය.

මර්දනය සිදු කළ ආකාරය

උද්ඝෝෂණය වැලැක්වීම සඳහා ශිෂ්‍ය නායකයින් 23 දෙනෙකුට උසාවි නියෝගයක් ලබා-ගැනීම.

නඩු අංකයඃ- ඊ5354ය2013

වාරණ නියෝග ලබාගත් සිසුන්ඃ-

| | |
|---|---|
| ඩී කේ ගුණරත්න | අයි එම් එන් එස් කුමාර |
| කේ සද්ධාමංගල හිමි | ජී ජී හේමරුවන් |
| කේ එන් විශ්වනාත් | ආර් ඒ දසුන් සංකල්ප රණසිංහ |
| ආර් එම් කැලණි කුමාර | ජී එස් මදුරංග |
| ජී එල් එසි දයාන් නන්දන | ජී වී ජී ජී පතිරණ |
| එම් ජී සී රණසිංහ | ආර් ඒ වී යූ රණසිංහ |
| අයි එම් ජේ එම් එම් ඉලංගසිංහ | ඒ ජී ටී එම් ජයකාන්ත |
| අයි ආර් කේ ඉද්දමල්ගොඩ | එන් ඩී එස් කේ ජයසිංහ |
| ජී ඒ ඩී එන් තිලංක | බී ජී සී සඳරුවන් |
| බී එම් එම් ඩී දිසානායක | එස් ඒ කේ ආර් සමරතුංග |
| එල් ඒ ඩී ටී ශ්‍යාමලී ශිෂ්‍යාව | ඩබ්ලිව් ඩී එච් බී කුලසූරිය ශිෂ්‍යාව |
| ඩබ්ලිව් ඩබ්ලිව් එම් ඊ ජී පී එම් බී වික්‍රමසිංහ | |

05. දිනය 2013 නොවැම්බර් 12

සිදුවීම නේවාසිකාගාර ප්‍රශ්නය විසඳීමට බලකරමින් විශ්වවිද්‍යාලය ඉදිරිපිට උද්ඝෝෂණයක් පැවැත්වීම.

මර්දනය සිදු කළ ආකාරය

නැවත කිසිදු උද්ඝෝෂණයකට සහභාගී නොවියහැකි පරිදි අධිකරණ නියෝග ලබාදීම.

මර්දනයට ලක්වූ සිසුන්

ඉහත නඩුවට සම්බන්ධ සියලුම සිසුන්.

## සංස්කෘතික තලයේ ක්‍රියාත්මක කළ මර්දනය

01 සිදුවීම සිසුන් ඒකරාශී වී විශ්වවිද්‍යාලය ආරම්භයේ පටන් විවිධ වාද විවාදවල, සංවාදවල හා සංස්කෘතික ක්‍රියාකාරකම්වල නිරතවූයේ විශ්වවිද්‍යාලය තුළ සිසුන් විසින් ''තෙල් බැම්ම'' නමින් හඳුන්වනු ලබන ස්ථානයේදීය. මෙම ස්ථානයට දේශන අවසන් වන සිසුන් එක් ර ස් වීමටත්, විවිධ දේ පිළිබඳව කතා බස් කිරීමටත් පුරුදුව සිටියහ. පරිපාලන විසින් සිසුන් ඒකරාශීවීම වැලැක්වීම අරමුණින් මෙම ස්ථානය කඩාබිඳ දැමීමට හා එම ස්ථානයේ බෝ පැලයන් සිටුවා බරපතළ ආරක්ෂක විධිවිධාන මධ්‍යයේ (දිවා රාත්‍රි ආරක්ෂක නිලධාරීන් 2 නෙකු රඳවා තැබීම, වෙනම ආරක්ෂක කුටියක් ඉදිකිරීම) එය ආරක්ෂා කිරීමටත් කටයුතු කළහ.

02 සිදුවීම 01. ප්‍රධාන ආපන ශාලාවේ බිත්තියේ වසර ගණනාවක් තිස්සේ ඇඳ තිබූ කාල් මාක්ස්, ෆෙඩ්රික් එංගල්ස්, ලෙනින් හා ෆිදෙල් කැස්ත්‍රෝ, මවෝ සේතුන්, චේ ගුවේරා යන විප්ලවවාදීන්ගේ ඡායාරූප එදින රාත්‍රියේ කළුතෙල් ගා මකා දැමීම.

02. මහා ශිෂ්‍ය සංගමය යන නම කළු තෙල් ගා මකා දැමීම.

අරමුණ විශ්වවිද්‍යාල උප සංස්කෘතියේ සංකේත විනාශ කිරීම.

# අග්නිදිග විශ්වවිද්‍යාලය

01. **දිනය** 2013 ඔක්තොම්බර් 03

**සිදුවීම** විද්‍යා පීඨයේ නේවාසිකාගාර ප්‍රශ්න විසඳීමට බලකරමින් එම පීඨයේ දෙවන වසර සිසුන් පරිපාලනයට විරුද්ධව පෝස්ටරයක් අලවන ලද අතර ආණ්ඩුවට සම්බන්ධ තෙවන වසර සිසුන් කිහිපදෙනෙකු විසින් පෝස්ටරය ඇලවූ සිසුන්ට පහරදීම හා පරිපාලනය හරහා බලපෑම්කර ඇලවූ සිසුන් ලවාම පෝස්ටර් ගැලවීමත් සමග ඇතිවූ ගැටුමෙහි දුරදිගයාමක් වශයෙන් මෙම ශිෂ්‍ය කණ්ඩායම් දෙක අතර 2013 ඔක්තෝබර් 3 වන දින ගැටුමක් ඇති විය. එහිදී කළමණාකරන පීඨයේ එස්.බී. දිසානායක අමාත්‍යවරයාගේ හිතවතකු හා කොමියුනිස්ට් පක්ෂ ශිෂ්‍ය සංගමයට සම්බන්ද සංජීව ඒකනායක ශිෂ්‍යාගේ හිතවත් තෙවන වසර සිසුන් ද විද්‍යා පීඨයේ දෙවන වසර සිසුන්ට පහරදීම සඳහා විද්‍යා පීඨයේ තෙවන වසර සිසුන්ට සහය වී ඇත.

**චෝදනාව** ගැටුම්කාරී ලෙස හැසිරීම

**දඬුවම** සිසුන් 53 ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

02. **දිනය** 2013 ඔක්තොම්බර් 3.

**සිදුවීම** ඉහත සඳහන් කොට ඇත.

**චෝදනාව** කළහකාරී ලෙස හැසිරීම

**දඬුවම** සිසුන් 53 දෙනෙකු රක්ෂිත බණ්ධනාගාර ගතකිරීම.

| පීඨය | කළමණාකරන | විද්‍යා | එකතුව |
|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | 39 | 14 | 53 |
| බණ්ධනාගාර ගත කළ දින ගණන | 7 | 7 | 7 |

# යාපනය විශ්වවිද්‍යාලය

**Students from Jaffna University have been attacked by Sri Lankan police and military after protests against the military's harassment of Tamil youths on Tuesday.**

**The peaceful demonstrations saw dozens of students rally outside the university, holding banners and shouting slogans.**

**2012.11.28**
**tamilguardian.com**



01. දිනය 2011 ඔක්තෝම්බර් 15

සිදුවීම



යාපනය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති, තවපාලසිංහම් විශ්වවිද්‍යාලයේ සිට සිය නිවස දක්වා ඇවිද යමින් සිටියදී විශ්වවිද්‍යාලයේ සිට මීටර් 500 ක් දුරින් පිහිටි ස්ථානයකදී රාත්‍රී 8 ට පමණ මෙම ප්‍රහාරය එල්ලවී ඇත. ආයුධ සන්නද්ධ දහදෙනෙකුගෙන් පමණ යුත් පිරිසක් මෙම පහරදීම සිදුකර ඇති අතර මෙම පහරදීම සිදුවී ඇත්තේ හමුදා ආරක්ෂාව බහුල ස්ථානය වීම සුවිශේෂ සිදුවීමකි. මෙම ප්‍රහාරය නිසා බරපතල තුවාල ලැබූ ඔහු යාපනය මහරෝහලට ඇතුළත් කරනු ලැබීය. පහරදුන් පිරිස ''උබලාට වෙනම රටක් අවශ්‍යදැයි'' විමසා තිබීමෙන් හා මෙම පහරදීම සිදුකරන තුරු අසල සිටි ආරක්ෂක අංශ නිලධාරීන් බලාසිටීමෙන් ඊට රාජ්‍ය ආරක්ෂක අංශවල ඇති සෘජු සම්බන්ධය හෙළිදරව් වේ.

02. දිනය 2012 මැයි 18

සිදුවීම මුල්ලිවෙකාල් දිනය සැමරීම වැළැක්වීම සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ සිට මීටර් 200 ක් පමණ දුරින් පිහිටි රමනාදන් වීදියේදී කළු හෙල්මට් පැළඳි වෙල් වර්ගයේ යතුරුපැදි කිහිපයකින් පැමිණි මැර පිරිසක් මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් පරමලිංගම් දර්ශනාත් සහෝදරයාට පහරදී බරපතල තුවාල සිදුකිරීම



03. දිනය 2012 නොවැම්බර් 27

සිදුවීම 50 ක පමණ සන්නද්ධ හමුදා පිරිසක් එදින රාත්‍රියේ ශිෂ්‍ය නේවාසිකාගාරවලට කඩා පැන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තර්ජනය කිරීම

04. දිනය 2012 නොවැම්බර් 28

සිදුවීම උක්ත සිදුවීමට විරෝධය පා උද්ඝෝෂණ ව්‍යාපාරයක් මහා ශිෂ්‍ය සංගමය විසින් පවත්වන ලද අතර එම උද්ඝෝෂණයට හමුදා හා පොලීසිය ම්ලේච්ඡ ප්‍රහාරයක් එල්ල කිරීම. එහිදී සිසුන් 50 කට අධික සංඛ්‍යාවක් තුවාල ලැබූ අතර සිසුන් 10 දෙනෙකු බරපතල තුවාල ලැබීය. තවත් සිසුන් සිව්දෙනෙකු මෙම උද්ඝෝෂණයට නායකත්වය දුන්නේ යැයි චෝදනා කර අත්අඩංගුවට ගනු ලැබිණ.




05. දිනය 2012 නොවැම්බර් 28

සිදුවීම යාපනය විශ්වවිද්‍යාලය අසල ටෙලෝ පක්ෂ කාර්යාලයකට පහරදුන්නේ යැයි කියන බොරු චෝදනාවක් එල්ල කර කනගසුන්දරසාමි, සන්මුහම් සොලමන්, ගනේසමූර්ති සුදර්ශන් හා පරමලිංගම් දර්ශනාත්ත් ඇතුලු සිසුන් 13 දෙනෙකු අත් අඩංගුවට ගැනීම හා දින කිහිපයකට පසු සිසුන්

9 දෙනෙකු නිදහස් කර මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් දර්ශනාන්ත් ඇතුලු සිසුන් සිව් දෙනෙකු මාස තුනක් රැඳවුම් නියෝගමත ත්‍රස්ත විමර්ශන ඒකකය භාරයේ රඳවාගෙන ප්‍රශ්නකිරීම.

| | | |
|---|---|---|
| 06. | **දිනය** | 2013 නොවැම්බර් 11 |
| | **සිදුවීම** | මෙදින සිට දින 30 ක් විශ්වවිද්‍යාලය වසා දැමීම. යුද්ධයේ දි මිය ගිය සිය ඥාතීන් විශ්වවිද්‍යාලය තුළදි සැමරීම වැලැක්වීම මෙහි අරමුණ විය. |

## සාරිපුත්ත භික්ෂු විද්‍යායතනය

01. **සිදුවීම** නවක සාදයක් පැවැත්වීම.

**චෝදනාව** නවක වදය ලබාදීම.

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**
ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 54 නමකගේ ශිෂ්‍යභාවය මාස 6 කට අහෝසි කිරීම.

## බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

| | 2011 | 2012 | 2013 | එකතුව |
|---|---|---|---|---|
| පංති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම් | 68 | 65 | 64 | 197 |
| නඩු | 68 | | | 68 |

## ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

01. **සිදුවීම** නේවාසිකාගාර ගැටළු විසඳීමට බලකරමින් උද්ඝෝෂණයක් සඳහා සූදානම් වීම

**මර්දනය ක්‍රියාත්මක වූ ආකාරය**
සිසුන් 72 දෙනෙකුගේ පන්ති තහනම් කිරීම

## විවෘත විශ්වවිද්‍යාලය

01. **දිනය** 2012 දෙසැම්බර් 31

**සිදුවීම** ක්‍රීඩාපිටියේ ක්‍රීඩාකිරීම

**චෝදනාව** උපකුලපතිවරයා විසින් තහනම් කරනලද ප්‍රදේශයකට ඇතුලුවී ක්‍රීඩාකර උපකුලපතිවරයාට අපහාස කිරීම.

**මර්දනය ක්‍රියාත්මක කළ ආකාරය**
සිසුන් 05 දෙනෙකුගේ ශිෂ්‍යභාවය අහෝසිකිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
කෝසල නුවන් — ධනුෂ්ක ඒකනායක
දිනූෂ ලක්මාල් — නුවන් දිසානායක
ඉසුරු

# ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

| විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම | | 391 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 127 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 85 |
| සිරගත කිරීම් | | 8 |
| පැහැරගෙන යාම් | | 1 |
| මැර ප්‍රහාර | අවස්ථා | 8 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 16 |
| මරණ තර්ජන | අවස්ථා ගණන | 8 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 12 |
| ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | ශිෂ්‍ය සංගම් ගණන | 2 |
| | අවස්ථා ගණන | 2 |



padippakam

# පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

01. **දිනය** 2010 මාර්තු 26

**සිදුවීම** වේදිකාවෙන් මහපොළොවට කෙටි නාට්‍ය උළෙල මහා ශිෂ්‍ය සංගමය නමින් පැවැත්වීම.

**චෝදනාව** විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි නොකළ සංගමයක නම භාවිතා කිරීම.

**දඬුවම** ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සංගමයේ සභාපති හිමියන්ගේ පන්ති තහනම් කිරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**
මාවානේ මේදානන්ද හිමි (ශිෂ්‍ය අංකය AR 54109)

02. **දිනය** 2010 මාර්තු 30

**සිදුවීම** අසාධාරණ ලෙස ලබාදුන් පන්ති තහනම් ඉවත් කිරීමට බලකරමින් උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වීම.

**චෝදනාව** නීති විරෝධී උද්ඝෝෂණයක් පැවැත්වීම, ශිෂ්‍ය භික්ෂුවකට නොගැලපෙන අයුරින් කටුයතු කිරීම, පරිපාලනයේ රාජකාරියට බාධාකිරීම

**දඬුවම** පන්ති තහනම් කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
කැලේගම ජිනරතන හිමි (ශිෂ්‍ය ලියාපදිංචි අංකය AR 56469)

**03.** **දිනය** 2010 මැයි 18

**සිදුවීම** මහා ශිෂ්‍ය සංගමය නමින් පෝසටරයක් ඇලවීම

**චෝදනාව** ආයතන ප්‍රධානියාගේ අවසරයකින් තොරව හා නීත්‍යානුකූල නොවන සංගමයකින් පෝස්ටරයක් ඇලවීම, ආරක්ෂක අංශවල රාජකාරියට බාධාකිරීම, උපාධි අපේක්ෂකයකුට නොගැලපෙන අයුරින් කටයුතු කිරීම.

**දඬුවම** සිසුන් 4 කගේ පන්ති තහනම් කිරීම.

**මර්දනයට ලක්වූ සිසුන්**
ටී.පී.ඩී. පීරිස්

**04.** **දිනය** 2010 මැයි 18

**සිදුවීම** විශ්වවිද්‍යාලයේ ගැටලු හා මර්දනය පිළිබඳ පත්‍රිකාවක් මහා ශිෂ්‍ය සංගමය නමින් බෙදීම

**චෝදනාව** ලියාපදිංචි නැති සංගමයක නම භාවිතා කිරීම, ආචාර්යවරු නොමඟ යැවීම, විශ්වවිද්‍යාලය අපකීර්තියට ලක්කිරීම

**දඬුවම** සිසුන් 7 දෙනකුගේ පන්ති තහනම් කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්ගේ නම්**
කේ. ඩී. යූ. ලියනගේ (ශිෂ්‍ය අංකය AR 62044)



படிப்பகம்

**05.** **දිනය** 2010 ජූනි 12

**සිදුවීම** අසාධාරණ ලෙස ලබාදී තිබූ පන්ති තහනම් කිරීම් ඉවත් කිරීමට බලකරමින් පරිපාලන ගොඩනැගිල්ල ඉදිරිපිට උද්ඝෝෂණයක් පැවැත්වීම

**චෝදනාව** ආයතන ප්‍රධානියා අවඥාවට ලක්කිරීම, රාජ්‍ය විරෝධී ප්‍රකාශ කරමින් තර්ජනය කිරීම හා බියගැන්වීම, දේපල හානි කිරීම (මේ සියල්ල අභූත චෝදනා වේ)

**දඬුවම** සිසුන් 28 දෙනෙකුගේ පන්ති තහනම් කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
කේ චන්ද්‍රානන්ද හිමි (ශිෂ්‍ය අංකය ඝ 59178)
(තවත් සිසුන් 27 ක්)

**06.** **දිනය** 2010 ජූලි 16

**සිදුවීම** භික්ෂූන් වහන්සේ නමකගේ අභාවය පිළිබඳ සංවේගය පළ කර පෝස්ටරයක් ඇලවීම

**චෝදනාව** අවසරයකින් තොරව හා ලියාපදිංචි නොවන සංගමයකින් පෝස්ටර් ඇලවීම

**දඬුවම්** සිසුන් තිදෙනෙකුගේ පන්ති තහනම් කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
කේ.කේ.එන්.එස්. කරුණාතිලක

padippakam

**07.** **දිනය** 2010 අගෝස්තු 01

**චෝදනාව** නවක සිසුන් පිළිගැනීමට විශ්වවිද්‍යාල පරිපාලනය විසින් විශ්වවිද්‍යාල භූමිය ඉදිරිපිට ඉදිකර තිබූ තොරණ එදින අළුයම ගිණි තැබූ බවට මෙම සිසුන්ට චෝදනා කර තිබිණ. නමුත් මෙම පන්ති තහනම සඳහා ශිෂ්‍යාවන් පස්දෙනෙකුගේ නම් ද ඇතුළත් කර ඇත. මෙම ශිෂ්‍යාවන් සියලුදෙනා නේවාසික පහසුකම් හිමි අය වූ අතර රාත්‍රී 8.30 න් පසු නේවාසිකාගාරවලින් පිටතට පැමිණීම තහනම් වේ. එසේ නම් ඔවුන් නේවාසිකාගාරවලින් බැහැරවූයේ කෙසේද? බැහැර වූ ශිෂ්‍යාවන් තොරණ ගිනි තැබූ බවට දැක තිබෙන්නේ කවුද? එම තොරණ ඉදිකර තිබුණේ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන දොරටුව අභියස වූ අතර එම ස්ථානයේ ආරක්ෂක නිලධාරින් පැය විසිහතර පුරාම රැඳී සිටියි. තොරණ ගිණි තබන තෙක් ඔවුන් සිටියේ කොහිද? මෙය මුළුමනින්ම සැලසුම් කරන ලද්දක් බව හෙළිකරමින් එදිනම සවස්වන විට කිසිදු වග විභාග යකින් තොරව පන්ති තහනම් කළ සිසුන් 52 නාගෙන් සිසුන් දහ අටදෙනෙකුගේ පන්ති තහනම යළි ඉවත් කරමින් තහවුරු කිරීම.

**දඬුවම** පන්ති තහනම් කිරීම් 52

**මර්දනයට ලක්වූ සිසුන්**

ප්‍රබුද්ධ චතුරංග රනතුංග (එම්.සී.54073)
එල්.ජී විරාජිත් (ඒ.ආර්. 54601)
ඒ.ඩී ඉඳුනිල් සඳුන් මධුසංඛ (ඒ. එස්. 62776)
එම්.බී උදිත සුරේෂ් ප්‍රනාන්දු (ඒ. එස්.56089)
බී.ඒ එසාන් මධුෂංක බාලසූරිය (ඒ. එස්. 62706)
එච්.එම්.එස් ද සිල්වා (ඒ. එස්. 62863)
ඒල්.ජී දුලාන් ඒ (ආර්.58719)
එම්.වී ප්‍රබුද්ධන (ඒ.එස්. 56438)
ඩී.ජී යුදාර ලක්ෂිත (ඒ. එස්. 62770)
පී ධම්මික සමීර කුලතිලක (ඒ. එස්. 56216)
කැලේගම ජිනරතන හිමි (ඒ. ආර්. 56469)
පී.එච් ආර් සම්පත් (ඒ. ආර්. 56861)
යූ.ජී.ටී රුක්මල් (ඒ. ආර්. 56847)
ඊ.කේ.එම් තරංගනි (ඒ. ආර්. 54591)
පූජ්‍ය පියරතන හිමි (ඒ. ආර්. 54673)
පූජ්‍ය පඤ්ඤානන්ද හිමි (ඒ. ආර්. 54691)
ජී.ඩී පීරිස් (ඒ.එස්. 60507)
එස්.එස්.එස් සමරසිංහ (ඒ. එස්. 60536)
කේ.ඩී.යූ.එල් දිමූ, අසංක සිරිස් (ඒ. ආර්. 62044)
ඩබ් පංඥාරතන (ඒ.අර්. 56993)
කේ සුගත සිරි හිමි (ඒ.අර්. 56995)
ඩබ් ජනානන්ද හමි (ඒ.අර්. 54687)
කේ පංඥාලෝක හිමි (ඒ.අර්. 54689)
එස් පංඥාසාර හිමි (ඒ.අර්. 56472)
එස් උපනන්ද හිමි (ඒ.අර්. 56475)
එච්.එම් එස්.අයි ජයතිලක (ඒ.අර්. 56633)
එස්.කේ අලහකොන් (ඒ.අර්. 56481)
කේ.එල් ප්‍රසන්න (ඒ.අර්. 56794)
පී.සී දේශප්‍රිය (ඒ.අර්. 56537)
ඒ.එම් ප්‍රියංකර (ඒ.අර්. 55063)
මංගල හිමි (ඒ.අර්. 59194)
එම් ගුණරත්න හිමි (ඒ.අර්. 59190)
කේ චන්ද්‍රානන්ද හිමි (ඒ.අර්. 59177)
එස්.එච්.ආර්.සුජී (ඒ.අර්. 54584)
ජේ.ඒ.එන් ධනුෂ්ක (ඒ.අර්. 56540)
ඒ පඤ්ඤාරාම (ඒ.අර්. 58604)
එස් ධම්විජය (ඒ.අර්. 58600)
එච්.එම්.කේ.එස් හේරත් (ඒ.එස්. 60475)
ආර්.එම් ප්‍රනාන්දු (ඒ.එස්. 52824)
යු සේනානන්ද හිමි (ඒ.ආර්. 59207
කේ.එන්.එස් කරාණාතිලක (ඒ.ආර්. 62219)
ආර්.කේ.කේ.ඒ.අයි කැළුම් (ඒ.ආර්. 62208)
ආර්.එම්.කේ තිලකරත්න (ඒ.ආර්. 62515)
එච් සඳරුවන් (ඒ.ආර්. 62455)
කේ.පී.සී ඉරෝෂණි (ඒ.ආර්. 62180)
අයි.එම්.පී.එම් බණ්ඩාර (ඒ.ආර්. 62048)
ඩී.එම්.අයි දිසානායක (ඒ.ආර්. 62121)
ආර්.එම්.එස් කුමාර (ඒ.ආර්. 62241)
ඒච්.පී.එස් සඳරුවන් (ඒ.ආර්. 54442)
එස්.එම්.එම්.එන් සිංහබාහු (ඒ.ආර්. 62340)
පී ලොකුගමහේවා (ඒ.ආර්. 54459)
කේ.ඩී.එච් පෙරේරා (ඒ.ආර්. 58965)



படிப்பகம்

padippakam

08. **දිනය** 2011ජූනි 01

**සිදුවීම** ක්‍රීඩා මණ්ඩපය අසල කතාබස් කරමින් සිටීම

**චෝදනාව** ක්‍රීඩා මණ්ඩපය අසල නීති විරෝධී රැස්වීමක් පැවැත්වීම හා රජය පෙරලීමට කුමන්ත්‍රණ සිදුකිරීම

**දඬුවම** සිසුන් 6 කගේ පන්ති තහනම් කිරීම

09. **දිනයඃ** 2011 ජුනි 03

**සිදුවීම** උපකුලපතිතුමා ඝාතනය කිරීමට හා පරිපාලන ගොඩනැගිල්ල ගිණි තැබීමට කුමන්ත්‍රණයක් ඇති බවට දුරකථන ඇමතුමක් උපකුලපතිට ලැබීම

**චෝදනාව** උපකුලපති ඝාතනය කිරීමට කුමන්ත්‍රණ සිදුකිරීම

**දඬුවම** ශිෂ්‍යයකු රක්ෂිත බන්ධනාගාර ගතකිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
ඩබ්.කේ. ලලිත් ප්‍රසන්න

10. **දිනය** 2011 ජූනි 08

**සිදුවීම** 2011 ජූනි 01 දින විශ්වවිද්‍යාල භූමියේ රැස්වීමක් පැවැත්වීම

**චෝදනාව** රාජ්‍ය විරෝධී හා රජය පෙරලීමට කුමන්ත්‍රණය කරමින් විශ්වවිද්‍යාල භූමිය තුළ ඒ සඳහා තමන් ද යෙදෙමින්, අහිංසක ශිෂ්‍යයන් ද බලහාත්කාරයෙන් යොදාගෙන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ඝාතනය වන ආකාරයේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කොට මළ සිසුවෙකුගේ හෝ ශිෂ්‍යයන් කිහිපදෙනෙකුගේ මෘත දේහයන් රැගෙන රටපුරා ගොස් රාජ්‍ය විරෝධි කැරැල්ලක ඇති කිරීමට කුමන්ත්‍රණය කිරීම

**දඬුවම** සිසුන් 25 කගේ පන්ති තහනම් කිරීම

11. **දිනය** 2011 ජූනි 12

**සිදුවීම** ප්‍රථම වසර සිසුන් සිව්දෙනෙකු පිහිණුම් තටාකය අභියස රැඳී සිටීම

**චෝදනාව** රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සැලසුම් කිරීම

**මර්දනය සිදු කළ ආකාරය**
01. උපකුලපති මිරිහාන පොලීසියට පැමිණිලි කිරීම
02. අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හතරවෙනි තට්ටුවට ගෙන-ගොස් දින 4 ක් ප්‍රශ්න කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
සිව් දෙනෙකි



படிப்பகம்

12. **දිනය** 2011 ජූනි 17

**සිදුවීම** මහපොළ මාස ගණනාවක් ලබානොදීම පිළිබඳව මහපොළ රැස්වීමේදී සිසුන් ප්‍රශ්න කිරීම

**චෝදනාව** මහපොළ උත්සවය කඩාකප්පල් කිරීම

**මර්දනයට ලක්වූ ශිෂ්‍ය සංඛ්‍යාව**
සිසුන් 21 දෙනකුට ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම

13. **දිනය** 2012 ඔක්තොම්බර්

**සිදුවීම** 2012/12/18 වන දින යූරෝ ලංකා නේවාසිකාගාරයේ ශිෂ්‍යාවක් දැඩිලෙස රෝගාතුරවීම හා පරිපාලනයට කිහිපවිටක් දැනුම් දුන් නමුදු අවශ්‍ය පියවර නොගැනීම හේතුවෙන් එම කාමරයේ ඇගේ යහළුවන් විසින් ඇයව ජයවර්ධනපුර රෝහලට ප්‍රතිකාර ගැනීම සඳහා රැගෙන යාම

**චෝදනාව** නේවාසිකාගාර පාලිකාවගේ උපදෙස් නොතැකීම, රෝගී වූ ශිෂ්‍යාවක් පාලිකාවට දැනුවත් නොකොට පිටතට රැගෙන යාම

**මර්දනය සිදු කළ ආකාර**
ශිෂ්‍යාවන් තිදෙනෙකු පන්ති තහනමට ලක් කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
කේ.ජී.ජී. ප්‍රියදර්ශනී(AR67733)

14. **දිනය** 2013 ජනවාරි 07

**සිදුවීම** ප්‍රථම වසර සිසුන්ගේ සුහද හමුවක් පැවැත්වීම

**චෝදනාව** නවක වදය ලබාදීම

**දඬුවම** ශිෂ්‍යයකු පන්ති තහනම් කිරීම

15. **දිනය** 2013 ජූනි 14

**සිදුවීම** පළමු වසර සිසුන් සඳහා ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය, සරසවි උපසංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීම

**චෝදනාව** දේශන අවසන් වූ සිසුන් බලහත්කාරයෙන් රඳවාගැනීම, ඔවුන්ගේ ස්වාධීනත්වයට බලපෑම් සිදුකිරීම, විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට හානිකිරීම

**මර්දනය සිදු කළ ආකාරය**
සිසුන් 33 දෙනෙකුගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**
ඩී.ජී.එම්. මදුරංග(AR/67625)
ජී.එච්.සී. අරවින්ද(AR/67313) (ඇතුළු 31 දෙනෙකු)

padippakam

16. දිනය 2013 ජූනි 20

සිදුවීම අසාධාරණ ලෙස ලබාදී ඇති පන්ති තහනම් ඉවත් කිරීමට බලකරමින් උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වීම

චෝදනාව ආයතන ප්‍රධානියාගේ අවසරයකින් තොරව උද්ඝෝෂණයක් පැවැත්වීම, රාජකාරියට බාධා කිරීම හා ආරක්ෂක නිලධාරීන් අවතක්සේරු කිරීම, විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට හානි පැමිණවීම, විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුට නොගැලපෙන අයුරින් කටයුතු කිරීම

දඬුවම සිසුන් 15 දෙනෙකුගේ පන්ති තහනම් කිරීම

මර්දනයට ලක්වූ සිසුන්
ජී.එච්.ආර්.පී. වීරසිංහ (MC/64263) ඇතුළු තවත් සිසුන් 14 ක්

17. දිනය **2013**

සිදුවීම වෛද්‍ය පීඨයේ උපාධිය ලක්ෂ 75 ක මුදලකට විකිණීම සඳහා අවම සුදුසුකම් පවා නොමැති සිසුන් බඳවා ගැනීමට එරෙහිව විජේරාම මන්සන්දියේ උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වීම

චෝදනාව නීති විරෝධී උද්ඝෝෂණයක් පැවැත්වීම, බාහිර පුද්ගලයකු උද්ඝෝෂණය ඇමතීම (කැඳවුම්කරු), විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට හානිකිරීම

මර්දනය සිදුකළ ආකාරය
සිසුන් 25 කගේ පන්ති තහනම් කිරීම

18. දිනය 2013/9/26

සිදුවීම මහා ශිෂ්‍ය සංගම් රැස්වීමක් පැවැත්වීම

දඬුවම සිසුන් 7 දෙනෙකුගේ පන්ති තහනම් කිරීම

මර්දනයට ලක් කළ සිසුන්
එස්.එස්.බණ්ඩාර (MC/64643) ඇතුළු 6ක්

19. දිනය 2013 ඔක්තොම්බර් 01

සිදුවීම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සුහසාධන ගැටලු විසඳීමට බලකරමින් උද්ඝෝෂණ ව්‍යාපරයක් පැවැත්වීම

දඬුවම සිසුන් 21 කගේ පන්ති තහනම් කිරීම

මර්දනයට ලක් කළ සිසුන්
එස්.ජී.එස් බණ්ඩාර (MC/64643) ඇතුළු විස්සක්



படிப்பகம்

20. දිනය 2013 ඔත්තොම්බර් 05

**සිදුවීම** මහා ශිෂ්‍ය සංගමට විසින් සිසුන් දැනුවත් කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීම

දඬුවම සිසුන් දෙදනකුට පන්ති තහනම් කිරීම

**මර්දනයට ලක්වූ සිසුන්**

ආර්.එල්.පී.මදුෂංක (MC63924)

21. දිනය 2013 ඔක්තෝබර් 05

**සිදුවීම** මහා ශිෂ්‍ය සංගමය මඟින් විශ්වවිද්‍යාල ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමට රැස්වීමක් පැවැත්වීම

දඬුවම සිසුන් 31 දෙනෙකුගේ පන්ති තහනම් කිරීම

22. දිනය 2013/12/17

**සිදුවීම** ප්‍රථම වසර සිසුන්ගේ මහපොළ වාරික ඔවුන් විශ්වවිද්‍යාලයට පැමිණ මාස 7 ක් ගතවී ඇතත් තවමත් ලබාදී නොතිබීම, හිමිදිරිය කලා උළෙල කිරීමට විශ්වවිද්‍යාලය තුළ ඉඩ ලබා නොදීම, පන්ති තහනම් කිරීම් ඉවත් කරගැනීම මුල්කරගනිමින් උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වීම

දඬුවම සිසුන් 40 කට පන්ති තහනම් ලබාදීම

**මර්දනයට ලක් කළ සිසුන්**

ඩබ්ලිව්.ඩබ්ලිව්.පී.එස්. සම්පත්
ඩබ්ලිව්.ඒ.එස්.පී. අප්පුහාමි
එල්.ජී.එම්.සඳකුමාර
එස්.ආර්. කුමාර
එම්.එන්.එස්.මාකාවිට
යදුරේ සුසීලහිමි
ඒ.එච්.එම්.ඒ. ද සිල්වා
බී.ඒ.ටී. බුද්ධික
එස්.ජී.එස්. බණ්ඩාර

## සංස්කෘතික තලයේ ක්‍රියාත්මක කළ මර්දනය

01. දිනය 2012 ජනවාරි 05

**සිදුවීම** රක්නා ලංකා ආරක්ෂක අංශයේ සහයෝගය සහිතව පැමිණි හමුදා මේජර්වරයකු යැයි කියාගන්නා ලද පුද්ගලයකු හා තවත් කිහිපදෙනෙකු විරු සිසු ස්මාරකයට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම. මෙම ප්‍රහාරය එල්ල කළ පිරිස උජ-ෂෂ- 9747 යන අංක තහඩු සහිත යතුරු පැදියෙන් පලායන ලදි.

අරමුණ විශ්වවිද්‍යාල උපසංස්කෘතියේ සංකේත, වටිනාකම් විනාශ කර දිගුකාලීන වශයෙන් ශිෂ්‍ය ව්‍යාපාරය විනාශ කිරීම

# රුහුණ විශ්වවිද්‍යාලය

| විස්තරය | | ප්‍රමාණය |
|---|---|---|
| ශිෂ්‍යභාවය අහෝසිකිරීම් හා පංති තහනම් කිරීම් | | 60 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 13 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 63 |
| ඝාතන | | 2 |
| සිරගත කිරීම් | | 9 |
| පැහැරගෙන යාම් | | 1 |
| මැර ප්‍රහාර | අවස්ථා | 10 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 10 |
| මරණ තර්ජන | අවස්ථා ගණන | 16 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව | 45 |
| ශිෂ්‍ය සංගම් අහෝසි කිරීම් | ශිෂ්‍ය සංගම් ගණන | 2 |
| | අවස්ථා ගණන | 2 |



## පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

01. දිනය 2010/10/20

**සිදුවීම** රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා තුමා සහ සිසුන් අතර ඇතිවූ බහින්බස් වීමකදී එය සමතයකට පත් කිරීමට මැදිහත් වීම.

**චෝදනා** රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුට පහර දීම, අසභ්‍ය ලෙස බැනවැදීම, ප්‍රකෝපකාරී ලෙස හැසිරීම.

**දඬුවම්** මාස දෙකකට ආසන්න කාලයක් තාවකාලිකව ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

**ගත් ක්‍රියාමාර්ග** අභියාචනා ඉදිරිපත් කිරීම

**මර්දනයට ලක්වූ ශිෂ්‍යයාගේ නම**
නන්දික ඥාණසිරි ගුණසේකර (මහාශිෂ්‍ය සංගමයේ සභාපති)

## පහරදීම්

01. දිනය 2010/05/31

**සිදුවීම** මාතර එළියකන්ද මන්සන්දියේ දී විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයෙකු වන බෝහිංගමුව මහතාට, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමකට සහ ශිෂ්‍යයන්ට මැර පිරිසක් විසින් පහරදීම.

**පහරකෑමට ලක්වූ සිසුන්**
වී. කැළුම් රෝහණ පියසිරි
ලුණුගම්වෙහෙර පඤ්ඤානන්ද හිමි

02. දිනය 2010/06/03

**සිදුවීම** ආණ්ඩුවේ ප්‍රාදේශීය දේශපාලඥයකුට සම්බන්ධ මැර පිරිසක් නේවාසිකාගාරය වෙත යමින් සිටි ශිෂ්‍යයකුට පහරදීම

**පහරකෑමට ලක්වූ ශිෂ්‍යා**
එච්.එම්. උදය බණ්ඩාර ඒකනායක

03. දිනය 2010/06/07

**සිදුවීම** එදින පැවති ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ නවක සාදයට බාහිරින් කඩාවැදුණු මැර පිරිසක් සිසුන්ට පහරදී ගැටුමක් නිර්මාණය කිරීම හා එම ගැටුමේදී සිසුන් විශාල පිරිසක් තුවාල ලැබීම.

විශ්වවිද්‍යාලයට ඇතුල්වීමේදී සිසුන්ගේ පවා හැඳුනුම්පත් පරීක්ෂා කරන විශ්වවිද්‍යාල ආරක්ෂක අංශ මෙම මැරයන්ට පැමිණීමට ඉඩ ලබාදී විශ්වවිද්‍යාලය ගැටුම්කාරීත්වයට යවා ශිෂ්‍ය ව්‍යාපාරය අපකීර්තියට පත්කිරීමේ හා ගැටුම් දඩමීමා කරගෙන ශිෂ්‍ය මර්දනය දියත් කිරීමේ න්‍යාය පත්‍රයේ කොටස්කරුවන් බවට පත්වී ඇත.

04. දිනය 2010/06/16

සිදුවීම කළමණාකරන හා මූල්‍ය පීඨයේ සිසුන් පිරිසකට මැරයන් පහරදීම.

05. දිනය 2012 පෙබරවාරි 31

සිදුවීම නේවාසිකාගාරය වෙත යමින් සිටි සිසුන්ට පොළු මුගුරු රැගත් ආණ්ඩුවේ මැර පිරිසක් පහරදීම. මේ නිසා සිසුන් දෙදෙනකු තුවාල ලබා රෝහල් ගත කරන ලදී.

**පහර කෑමට ලක්වූ සිසුන්**

ඩබ්ලිව්.එම්.පී.කේ. විජේසුන්දර (MF2010/2737)
ආර්.එම්.පී.එච්.රණවීර (MF2010/2657)

06. දිනය 2012 දෙසැම්බර් 19

සිදුවීම ආණ්ඩුවේ නිදහස් ශිෂ්‍ය සංගමයට සම්බන්ධ ශිෂ්‍යයකුගේ මැදිහත්වීම මත ප්‍රාදේශීය දේශපාලඥයකුගේ මැරපිරිසක් මාතර බස් නැවතුම්පළේදී ශිෂ්‍යයකුට පහරදීම

**පහරකෑමට ලක්වූ සිසුන්**

ටී.වී. ප්‍රියංකර (MF/2010/2657)

07. දිනය 2013 ජූලි 31

සිදුවීම පොලු මුගුරු රැගත් පිරිසක් වෙලේවත්ත හන්දියේදී ශිෂ්‍යයකුට පහරදී තුවාල සිදුකිරීම

**පහරකෑමට ලක්වූ ශිෂයයා**

පී.එම්. විජේසූරිය (MF/2010/2657)
එස්.කේ.එස් මදුරංග (HS/2010/12773)

## නඩු පැවරීම්

01. නඩු ප්‍රමාණය 13

නඩු අංක

| | | |
|---|---|---|
| B2045/2008 | B1556/2009 | B49812/2009 |
| B2543/2009 | B60386/2009 | B1114/2010 |
| B1392/2010 | B1426/2010 | B2010/2010 |
| B52895/2011 | B52892/2011 | B82072/2012 |
| B1913/2013 | | |

මර්දනයට ලක් කළ සිසුන්

| | |
|---|---|
| ටි. කේ. චින්තක | නිලන්ත ලක්මාල් වීරසිංහ |
| ආර්. ඩි. නිලන්ත සිල්වා | කේ.පී.සී. චතුර කුමාර |
| එම්.පී. මහේෂ් ධනංජය | ආර්.කේ.ආර්.එස්.තිලකසිරි |
| ඊ.ඒ.පී. මධුරංග | පි.එම්. ගයාන් කුමාර |
| යූ.පි.එම්. පෙරේරා | ඩි.පි. සංජීව |
| ඩබ්ලිව්. කේ. මදුසංක | ඩබ්ලිව්.ඒ.සි.කේ. ගුනසේකර |
| යූ.පි.එම්. පෙරේරා | පි.එම්.එම්. පෙරේරා |
| පී.වී.කුමාර | ඊ.එම්.කුමාර |
| පි. රත්නායක | යූ.පි.එම්. පෙරේරා |
| පී.එම්.සිසිර කුමාර | ඒ.ඩබ්ලිව්.සි.ඩි.විමලසේන |
| ආර්.ඩබ්ලිව්.කේ.එස්.ආර්.කුලතුංග | අනිල් මදුසංක |
| ඩබ්ලිව්.සේහාන් දර්ශන | ඩි.ඩි.සමරනායක |
| යූ.පි.එම්. පෙරේරා | පී.වී.කුමාර |
| රංග නිලන්ත | තිළිණි ගංකා අමරසේන |
| කේ.එස්.වි.ඩි. තාරක | ඩබ්ලිව්.එම්.යූ.එස්.වික්‍රමනායන |
| කේ.ආර්.පි.කුමාර | ජේ.පි.ජේ. චතුරංග |
| ඩි.ඩි.එස්. දළුවත්ත | යූ.එල්.රුවන් කුමාර |
| පී.වී. කුමාර | ජේ. පුෂ්පකුමාර |
| එස්.ඒ.එම්. කාංචන | එම්.ඩබ්ලිව්.ඩි.එස් ගුනවර්ධන |
| එම්. චන්ද්‍රතිලක | ඩබ්ලිව්.පී.පද්මසිරි |
| එම්.වි.එස්.බි. ගුණසේකර | පි.ඔ. නිමනිත |
| එච්.එස්. පෙරේරා | එස්.එල්.එස්. සම්පත් |
| ඩබ්ලිව්.ටි.එල්. උමයංගන | ඊ.සි.පි. කුමාර |
| කේ.එම්. කහටපිටිය | එම්.ජේ.ඩි. සේනක |
| එම්.කේ.ආර්. අනුරාධ | එම්.ඩබ්ලිව්.ඩි.එස්. ගුනවර්ධන |
| ආර්.බි.එස්.එම්.කුමාර | අමිල ප්‍රසාද් කරුණාතිලක |
| කේ.ඩි.සංජීව | යූ.පි.එම්.කුමාර |
| ඩබ්ලිව්.ටි.එල්. උමයංගන | සි.ඩබ්ලිව්. දෙවින්ද |
| ඊ.සි.පි. කුමාර | එච්.එස්. පෙරේරා |
| එම්.කේ.ආර්. අනුරාධ | එල්.කච්මිනි නිෂාණි |
| ඒ.මනිෂා තිළිණි | ඩබ්.එම්.නදිෂා ලක්මාලි |
| කේ.කේ නොමෙශිකාදිල්රුක්ෂි | රුවනි සුදර්ශනි |
| කේ.සි. රුක්ෂාන් | ඩබ්ලිව්.සි. ප්‍රියදර්ශන |

## සිරගත කිරීම්

| නඩු අංකය | ශිෂ්‍යයා/ශිෂ්‍යාව | සිරගතව සිටි දින ගණන |
|---|---|---|
| B82072/2012 | එල්. කච්මිනි නිෂාණි | 67 |
| | තිළිණි අලවත්ත | 60 |
| | ඩබ්.එම්. නදිෂා ලක්මාලි | 14 |
| | කේ.කේ. නොමේශිකා දිල්රුක්ෂි | 14 |
| B82072/2012 | රුවනි සුදර්ශනි | 14 |
| B52892/2011 | අමිල ප්‍රසාද් කරුණාතිලක | 14 |
| B52892/2011 | කේ.ඩි.සංජීව | 17 |
| B1556/2009 | යූ.පී.එම්. පෙරේරා | 47 |

# සෞන්දර්ය විශ්වවිද්‍යාලය

01. **දිනය** 2010 දෙසැම්බර් 16

**සිදුවීම** නවක සිසුන් විසින් ඔවුන්ගේ ශිෂ්‍ය කණ්ඩායමේ රැස්වීමක් පැවැත්වීම.

**චෝදනාව** නවක ශිෂ්‍යයකු නවක ශිෂ්‍යයින්ට නවක වදය ලබාදීම.

**දඬුවම** සිසුන් දෙදෙනකුට තාවකාලික පන්ති තහනම් ලබාදීම.

**මර්දනයට ලක්වූ සිසුන්**

ආර්.සී. ලක්මාල්
එම්.ජේ.සී. ද සිල්වා

02. **දිනය** 2011 නොවැම්බර් 17

**සිදුවීම** සෞන්දර්ය විශ්විද්‍යාලයේ කොහුවල පරිශ්‍රයට යාමට නොදීම නිසා සිසුන්ගේ අධ්‍යයන කටයුතුවලට බාධා සිදුවීම පිළිබඳව සාකච්ඡා කිරීමට ශිෂ්‍ය සංගමයේ සභාපති ලේඛකාධිකාරීවරිය මුණගැසීම.

**චෝදනාව** බලහත්කාරයෙන් ඇතුළුවීම හා ලේඛකාධිකාරීවරියට බැණ වැදීම (මෙවැන්නක් සිදු වී නොමැති අතර හැඳුනුම්පත් ආරක්ෂක අංශයට ලබාදී ලේඛකාධිකාරීවරිය මුණ ගැසී ඇත. ඇය සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කර ශිෂ්‍යයාට බැණ වැදී ඔහු එළවා දමා ඇති අතර පසුව ඇයට බැණ වැදුනේ යැයි කියමින් පැමිණිලි කර ඇත)

**දඬුවම:-**

01. මාස දෙකක් පන්ති තහනම් කිරීම
02. විනය පරීක්ෂණයකින් පසු වසර 2 ක අත්හිටවූ පන්ති තහනමක් ලබාදීම

**මර්දනයට ලක්කළ සිසුන්:-**

සිසිර චාමර විජිතසේන

03. **දිනය** 2011 ජූනි 29

**සිදුවීම** අධ්‍යයන සුහසාධන ගැටලු විසඳීමට බලකරමින් උද්ඝෝෂණයක් පැවැත්වීම හා සන්දේශයක් බාරදීම.

**චෝදනාව** උපකුලපති නිල කාමර පරිශ්‍රයේ කළහකාරී ලෙස හැසිරීම.

**දඬුවම**

01. සිසුන් 9 දෙනකුට සති දෙකක තාවකාලික පන්ති තහනමක් ලබාදීම.
02. විනය පරීක්ෂණ පැවැත්වීමෙන් පසු වසර දෙකක අත්හිට වූ පන්ති තහනමක් ලබාදීම.

**මර්දනයට ලක් කළ සිසුන්:-**


එස්.ආර්. තුසිත යාපා අබේතුංග
සංජීව නුවන් සිරිසේන
සී. ප්‍රසන්න ධර්ම ශ්‍රී
එස්.ඒ.ආර්. ආසිරි තිලක් චතුරංග
එච්.ඒ. සජිත් ශ්‍රීනාත් විමුක්ති
ජී.ජී. දිනේෂ් කුමාර පියතිස්ස
එම්.එම්.එස්. අරුණ කාන්ත
ඩී.ආර්. ගිහාන් සෙනවිරත්න
ඩබ්ලිව්.පී.එස්. සිසිල් ප්‍රියංකර

| | | |
|---|---|---|
| 04. | **සිදුවීම** | නවක සිසුන්ට රැස්වීමක් පැවැත්වීම. |
| | **චෝදනාව** | නවක වදය ලබාදීම. |
| | **දඬුවම** | 01. මාස තුනක පන්ති තහනමක් ලබාදීම.<br>02. විනය පරීක්ෂණයේන පසු මාස 6 ක අත්හිටවූ පන්ති තහනමක් ලබාදිම. |

**චෝදනාවට ලක්වූ සිසුන්**

පවර නවමිණ
පූජිත ගුණවර්ධන

# මර්දනයට අදාළ විශේෂ සිදුවීම්



Sri Lanka, Sept. 28 -- Two university students who were members of the Inter University Students' Federation (IUSF) were killed in a road accident in Gampaha yesterday, police said.

The two victims Sisitha Priyankara (22) and Bandara Ekanayake (24) were undergraduates of the Ruhunu University and Kelaniya University respectively. They were killed at around 3.00 am last morning at Imbulgoda Junction on the Kandy-Colombo road, police said.

The accident had occurred when the motorbike they were riding (on their way to Colombo) struck a lamppÈt causing them to be flung onto a nearby fence. They had been taken to the Gampaha Base HÈpital and found dead on arrival. Police said ...


2012.09.28
Mirror

## ජානක හා සිසිත ඝාතනය කිරීම

**දිනය** 2012 සැප්තැම්බර් 27

**සිදුවීම**


ජානක ඒකනායක


සිසිත ප්‍රියංකර

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සිය වැටුප් වැඩිකර ගැනීම සඳහා ආරම්භ කරන ලද වැඩ වර්ජනයේ ප්‍රතිඵලයක් ලෙස වසා දැමූ විශ්වවිද්‍යාල, ආචාර්ය ගැටලු විසඳා වහා විවෘත කිරීමටත්, අධ්‍යාපනය විකිණීම නැවතීමටත් බලකරමින් 2012 සැප්තැම්බර් 24 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිට කොළඹ දක්වා පැමිණීමට අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය විසින් පාගමනක් සංවිධානය කරන ලද අතර එම පාගමන අතර තුර මෙම ඝාතන සිදුවිය.

තුන්වන දිනය අවසන් වී ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය අසල හිතවතකුගේ නිවසක ශිෂ්‍ය නායකයින් සියලුදෙනා 4 වන දිනය සඳහා සූදානම් වූ අතර එදින බෙදීමට නියමිත පත්‍රිකා ගෙන ඒම සඳහා කොළඹ දෙල්කඳ සරලා මුද්‍රණාලය වෙත පැමිණීමට කැලණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපති ජානක බණ්ඩාර ඒකනායක හා රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රථම වසර ශිෂ්‍ය ක්‍රියාකාරී සිසිත ප්‍රියංකරද සිල්වා යතුරු පැදියකින් 27 වන දින අළුයම 2.45 ට පමණ අදාළ ස්ථානයෙන් පිටත් විය.
ඔවුන් දෙදනාම මෙම ගමන ආරම්භයේදීම එනම් නවාතැන් ගෙන සිටි ස්ථානයේ සිට කි.මී 4 ක් පමණ දුරින් පිහිටි කොළඹ නුවර මාර්ගයේ ඉඹුල්ගොඩ පාසල අසලදී යතුරු පැදිය පාරෙන් දකුණු පැත්තට පිටපැනීමෙන් සිදුවූ අනතුරෙන් හිසට බරපතළ තුවාල ලබා එම ස්ථානයේදීම මිය ගොස් තිබුණි. යතුරු පැදියට හා ඔවුන් දෙදෙනාගේ හිසට ඉතාමත් බරපතළ හානි සිදුවී තිබුණත් එවැනි අනතුරක් සිදුවීමට තරම් යතුරුපැදිය ගැටීමට අදාළ කිසිවක් එහි නොතිබුණා පමණක් නොව එවැනි ගැටීමකට අදාළ සාක්ෂිද නොවීය. එම නිසා මෙම අනතුරු මුලසිටම සැක සහිත වූ අතර ඒ සඳහා වන සාක්ෂි විශාල ප්‍රමාණයක් ද පසුව හෙළිදරව් විය.

01. මෙම අනතුර සිදු වූ ස්ථානය වංගු සහිත ස්ථානයක් නොවන නිසා හා මාර්ගයේ පළල සැලකිය යුතු තරම් විශාල ස්ථානයක් නිසා යතුරු පැදිය එතරම් වේගයකින් පාරේ දකුණු පස ලයිට් කණුවක ගැටීමේ කිසිඳු හැකියාවක් නොමැති වීම




02. මෙම ස්ථානයේදී හදිසියේ වේගයෙන් පැමිණි වාහනයක් මාර්ගය හරස් කළ ටයර් සළකුණු පාර හරහා තිබීම

03. පොලිසිය විසින් කරන ලද ප්‍රකාශ සමඟ ප්‍රදේශවාසීන් හා රෝහල් සේවකයන් ලබාදුන් කටඋත්තර විවිධ පරස්පරතාවලින් යුක්තවීම (පොලීසිය විසින් මොවුන් දෙදෙනා රෝහල්ගත කරන විට මියගොස් නොසිටි බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පවසද්දී පොලිසිය විසින් මළ සිරුරු රැගෙනයාම සඳහා තමන්ගෙන් ගෝනි ඉල්ලූ බව ජනමාධ්‍යට අසල්වාසියෙක් ප්‍රකාශයක් ලබාදීම, මොවුන් රුගෙනයාමට මල් ශාලාවකින් ගෙන ආ රථය හා මළ සිරුරු -

padippakam




අදළ ස්ථානයේ වසා තිබෙන ඡායා රූප පැවතීම, පොලිසිය විසින් රැගෙන ආවේ මළ සිරුරු දෙකක් බවත් කෙලින්ම එම මළ සිරුර මෝචරියට යැවූ බවත් රෝහල් සේවකයින් ප්‍රකාශ කිරීම)

04. මෙවැනි මාරක රිය අනතුරක් සිදු වූ විට පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පැමිණෙන තුරු හා මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා මහේස්ත්‍රාත්වරයකු පැමිණෙන තුරු මළ සිරුරු හා අදාළ අනතුර සිදුවූ ස්ථනය කොටුකර ඊට අදාළ කිසිවක් වෙනස් නොකර තැබීම සාමාන්‍ය නීතිය වුවත් මහේස්ත්‍රාත්වරයා පැමිණීමට පෙර මළ සිරුරු පමණක් නොව ලේ පැල්ලම් පවා මකාදමා තිබීම

05. මෙම පාගමන ආරම්භක මොහොතේ පටන් දිගින් දිගටම සැකකටයුතු පුද්ගලයන් සිසුන්ගේ ක්‍රියාකාරකම් හා යන එන තැන් නිරීක්ෂණය කරමින් සිටීම හා 26 වන දින රාත්‍රියේ සිසුන් නවාතැන් ගත් ස්ථානයට පැමිණෙන විටත් කිහිපදෙනෙක් සිසුන් පසුපස පැමිණීම හා නාඳුනන බයිසිකල්කරුවන් ඒ ස්ථානයේ එහා මෙහා සැරිසැරීම

06. පසුව මෙම සිඳුවීමෙන් ඇති කළ ආන්දෝලනයත් සමඟ වෙබ් අඩවි විසින් පොලිස් මූලාශ්‍ර උපුටාදක්වමින් වාර්ථා කළ අන්දමට මෙම ස්ථානයට ආසන්න ස්ථාන දෙකක ජනාධිපති ආරක්ෂක අංශයට අයත් සැක කටුයතු ජීප් රථ දෙකක් නවතා තිබීම හා එදින හෝ ඊට ආසන්න දිනක ජනාධිපතිවරයා එම ප්‍රදේශයේ කිසිඳු සංචාරයක්ද සිදු නොකිරීම, එසේම වේයන්ගොඩ ප්‍රදේශයේද ජනාධිපති ආරක්ෂක අංශයේ යැයි ප්‍රකාශ කරන ලද ට්‍රේල් වර්ගයේ යතුරුපැදියක් නවතා තිබූ බවට පොලිස් ජංගම සංචාර සටහන් වාර්ථා කිරීම

07. මේ සම්බන්ධව ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුව තුළ ආණ්ඩුවේ ඉතාමත් සැක කටයුතු හැසිරීම

- 2013 දෙසැම්බර් 18 දක්වාත් රස පරීක්ෂක වාර්ථා ලබාදීමට කටයුතු නොකිරීම.

- ජානක සහෝදරයාගේ ජංගම දුරකථනයට පැමිණි හා ඔහු විසින් ගන්නා ලද දුරකථන ඇමතුම් සම්බන්ධ ඇතැම් තොරතරු මකාදමා තිබීම (ජානක විසින් පාවිච්චි කරන ලද මොබිටෙල් සමාගමට අයත් දුරකථන අංකයේ මාසයකට අදාළ ඇමතුම් පිළිබඳ තොරතුරු ලබාගන්නා ලෙස අධිකරණය පොලීසියට නියෝග කරන ලද අතර මොබිටෙල් සමාගම විසින් දින 10 කට අදාෘළව පමණක් එනම් මෙම අනතුර වීමට පෙර දින 5 ක හා පසු දින 5 ක තොරතුරු වාර්ථාවක් අධිකරණයට ලබාදෙන ලදි. ඒ අනුව මේ දින වලදී ඔහුගේ දුරකථන අංකයෙන් කිසිදු මොබිටෙල් අංකයකට ඇමතුම් ලබාගෙන හෝ ඔහුට ඇමතුම් ලැබී නැත. නමුත් එය කිසිසේත්ම සිදුවිය නොහැක්කක් වූ අතර 26 වන දින පස්වරුවේද කැඳවුම්කරු සංජීව සහෝදරයා හා තවත් බොහෝ දෙනෙක් ඇමතුම් ලබාදී තිබුණි. මේ නිසා ඇතිවූ සැකය හේතුවෙන් සංජීව බණ්ඩාර (0718422735) සහෝදරයාගේ හා අවිශිබම වැඩබලන කැඳවුම්කරු චින්තක රාජපක්ෂ (07146041607 සහෝදරයාගේ මොබිටෙල් සමාගමට අයත් ඉහත අංකවල ඇමතුම් පිළිබඳ තොරතුරු වාර්ථා ලබාගන්නා ලදී. පුදුමයට කරුණක් ලෙස ඒ කිසිවකද ගන්නා ලද කිසිදු ඇමතුමක් පිළිබඳ තොරතුරු නොතිබුණේය. මේ අනුව සමහර තොරතුරු මකා දමා ඇති බව පැහැදිළි වූ අතර ජානක බණ්ඩාරට ගන්නා ලද වෙනත් අංකවල තොරතුරු වාර්ථා ගෙන පරීක්ෂා කළෙමු. එහිදී රුහුණ විශ්වවිද්‍යාලයේ සරත්ද සිල්වා සොහොයුරාගේ (0715713085) දුරකථනයේ වාර්ථාවට අනුව 25 හා 26 වන දිනවල ජානක සහෝදරයාගේ අංකයට ගන්නා ලද හා ඔහුගෙන් ලැබීතිබූ ඇමතුම්වල දත්ත තිබුණි. ඒ අනුව නැවත වාර්ථාවක් මොබිටෙල් සමාගමෙන් ඉල්ලා සිටිය නමුත් එම තොරතුරු තවමත් ලබාදී නැත. නමුත් අද වන විට මෙම තොරතුරු ලබාගැනීමට සාමාන්‍ය පාරිභෝගි-කයකුට වුවද ගතවන්නේ පැයක දෙකක කාලයක් පමණි.

මේ සියලු සාක්ෂි මත ඉතාමත් පැහැදිළිව ඒත්තු යන කරුණ නම් මොවුන් දෙදෙනා ආණ්ඩුව සැලසුම් කර ඝාතනය කරන ලද බවයි.



படிப்பகம்

# රුහුණ විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ හර්ෂ ගුණවර්ධන පැහැරගෙනයාමට උත්සාහ කිරීම හා පහරදීම



W.H.B. **හර්ෂ ගුණවර්ධන**
MF2008/2094
2011 - 2012 **මහා ශිෂ්‍ය සංගමයේ සභාපති**

**දිනය** 2013 ජනවාරි 16

හර්ෂ ගුණවර්ධන 2008 වර්ෂයේදී රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයට ඇතුළත් වූ අතර ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු වශයෙන් ශිෂ්‍ය ව්‍යාපරය තුළ කටයුතු කළේය. පසුව 2011 - 2012 අධ්‍යයන වර්ෂයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වශයෙන් ශිෂ්‍ය ව්‍යාපාරයට නායකත්වය දුන් අතර අවස්ථා ගණනාවකදීම රාජ්‍ය මර්දනයේ කුරිරු අද්දැකීම් වලට මුහුණ දීමට ඔහුටද සිදුවිය.

**සිදුවීම**



මෙදින ප.ව. 9.30 ට පමණ මොහු රුහුණ විශ්වවිද්‍යාලයේ මැද්දවත්තේ පිහිටි පිරිමි නේවාසිකාගරයේ සිට මැද්දවත්ත හන්දියේ පිහිටි කඩයකට දුරකථන කාඩ්පතක් මිලදී ගැනීමට යන අතරතුර දී මෙම පහරදීම සිදුවිය. අංක තහඩු රහිත ඩිපෙන්ඩර් රථයකින් පැමිණි යකඩ පොලු රැගත් මුහුණු ආවරණය කරගත් මැර පිරිසක් හර්ෂ අසල වාහනය නවතා යකඩ පොලුවලින් දිගට හරහට පහරදී ඔහු රැගෙනයාමට උත්සාහකරන ලදි. නමුත් ඒ අසල සිටි ගම්වාසීන් පිරිසක් එම සිදුවීම දැක පැමිණීම නිසා පැහැරගෙනයාමේ උත්සාහය ව්‍යවර්ථ විය.

මෙම පහරදීම නිසා අතට, හිසට හා කොන්දට තුවාල සිදුවූ අතර මාතර මහ රෝහලේ 5 වන වාට්ටුවේ දින දෙකක් නේවාසිකව ප්‍රතිකාර ගැනීමට ඔහුට සිදුවිය. මීට පෙර අවස්ථා ගණනාවකදී හර්ෂ ගුණවර්ධන සහෝදරයාට ආරක්ෂක අංශ විසින් ශිෂ්‍ය අරගල සඳහා නායකත්වය දීම නවතන ලෙස තර්ජනය කර තිබූ අතර ආණ්ඩුවේ බුද්ධි අංශයේ ඉහළ නිලධාරීන් කිහිපදෙනකු නිවසට පැමිණ ඔහුගේ සියලු විස්තර ඔවුන් සතු බවත්, ශිෂ්‍ය දේශපාලනයට අදාළ තොරතුරු ලබාදෙන්නේ නම් හොඳ රැකියාවක් ලබාදීමේ හා ඒ සඳහා


රුහුණු මහා ශිෂ්‍ය සංගම් සභාපතිට මැර ප්‍රහාරයක්
02

ඉහළ මුදලක් ගෙවීමේ හැකියාවක් තමන්ට ඇති බව ප්‍රකාශ කර තිබුණි.
ඒ කිසිවකට එකඟ නොවීම නිසා හා තවදුරටත් ශිෂ්‍ය නායකයකු ලෙස කටයුතු කිරීම නිසා මෙම පහරදීම ආණ්ඩුවේ ආරක්ෂක අංශ විසින් සැලසුම් කරන ලද්දක් බවට පැහැදිලි සාක්ෂි තිබේ.

# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ජනක නිලංග මදුෂාන් පැහැරගෙන යාම හා තර්ජනය කිරීම



**එම් එම් ජනක නිලංග මදුෂාන්**
A/GGA/07/074
2012 - 2013 මහා ශිෂ්‍ය සංගමයේ සභාපති

2008 වර්ෂයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමණාකරන පීඨයට ඇතුළත් වූ ජනක නිලංග 2012 වර්ෂය දක්වා පීඨ ශිෂ්‍ය සංගමයේ විවිධ වගකීම් දරමින් ශිෂ්‍ය අරගලවලට නායකත්වය සැපයූ අතර 2012 - 2013 අධ්‍යයන වර්ෂයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වශයෙන් පත්විය. විවිධ තර්ජනවලට මුහුණ දීමට සිදුවූ ඔහු එක් අවස්ථාවක පැහැර ගැනීමටද ලක්විය.

**දිනය** 2013 මැයි 14

**සිදුවීම** එදින ජනක නිලංග සිය පියා මුණ ගැසීමට මහනුවර ''ගුඩ් ෂෙඩ්'' බස් නැවතුම්පළට ගිය අතර ප.ව. 05.00 ට පමණ බස් රථයෙන් බහින අවස්ථාවේදීම ආරක්ෂක අංශවලට සම්බන්ධ සිවිල් ඇඳුමින් සැරසී සිටි පිරිසක් විසින් ඔහු වටකරගෙන තමන් ආරක්ෂක අංශ සාමාජිකයන් බවත්, ප්‍රශ්න කිරීමට තමන් සමඟ පැමිණෙන ලෙසත් පවසා ඇති අතර සිය පියාට කිසියම් අනතුරක් සිදුකරතැයි වන බිය නිසා ඔහුට එම තීරණයට එකඟවීමට සිදුවී ඇත. පසුව බස්නැවතුම්පළ පිටුපස හෝටලයක තුන්වන තට්ටුවට රැගෙන ගොස් පැයක් පමණ ප්‍රශ්න කිරීමටත් තර්ජනය කිරීමටත් කටයුතු කර ඇත.

එහිදී ඔවුන් පවසා ඇත්තේ විශ්වවිද්‍යාලය තුළ සිදුවන සෑම දෙයක් පිළිබඳවම තමන් දන්නා බවත් සෑම තැනකම සිය ඔත්තුකරුවන් සිටින බවත්ය. සෑම උද්ඝෝෂණයකට ඔවුන් පැමිණ ඇති බවත් සියලු තොරතුරු එක්රැස්කරගෙන සිටින බවත් පවසා ජානකට හා සිසිත (ඔවුන් දෙදෙනා රිය අනතුරක් සැලසුම් කර ඝාතනය කළේය) සිද්ධ වූ දේ දන්නවා නේ දැයිද විමසා ඇත.

දිගින් දිගටම ශිෂ්‍ය උද්ඝෝෂණවලට නායකත්වය දීම නවත්වන ලෙස බලපෑම් කර ඇති අතර එසේ නොවන්නේ නම් මරා දමන බවටද තර්ජනය කර ඇත.

# කැලණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති සුරංජිත් බණ්ඩාරට පහරදීම



**එස් ජී සුරංජිත් බණ්ඩාර**
BM2007/20
**2010 -2011 මහා ශිෂ්‍ය සංගමයේ සභාපති**

2008 වර්ෂයේ කැලණිය විශ්වවිද්‍යාලයේ කළමණාකර පීඨයට පැමිණි සුරංජිත් බණ්ඩාර 2010 වර්ෂය දක්වා ශිෂ්‍ය සංගමයේ ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු වශයෙන් කටයුතු කරන ලද අතර 2010 - 2011 අධ්‍යයන වර්ෂයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වශයෙන් පත්විය. දිගින් දිගටම විවිධ තර්ජන වලට ලක්වූ ඔහු අවස්ථා ගණනාවකදී මැර ප්‍රහාරයන්ටද ලක්විය.

**දිනය** 2012 දෙසැම්බර් 30

**සිදුවීම** ඝාතනය කළ ජානක/සිසිත සොයුරන්ගේ තෙමස් පූර්ණ සැමරුම සඳහා විශ්වවිද්‍යාලය තුළ සැරසිලි හා අනෙකුත් සූදානම් කිරීම්වලින් අනතුරුව විශ්වවිද්‍යාල භූමියෙන් පිට කැලණියේ මුණමල්ගහවත්තේ පිහිටි නේවාසිකාගාරය දක්වා (දුර විශ්වවිද්‍යාලයේ සිට කි.මී 2 පමණ) තනිව පයින් ගමන් කරමින් සිටි අතර තුර මෙම පහරදීම සිදුවිය. කොහල්විල පන්සල අසල වංගුවේ දී අංක තහඩු රහිත ට්‍රේල් වර්ගයේ යතුරු පැදියකින් පැමිණ ඔහු අසල නවතා පහරදී පහරකෑමෙන් ගැලවීමට හිසපහත් කරගත් විට ඔළුව කිහිපවිටක් බිම හප්පා පලාගොස් තිබුණි.



2013 ජනවාරි 06

ජනරළ 11

**කාගෙ හයියෙන්ද යකෝ උඹලා සෙල්ලං දාන්නෙ ?**

**ශිෂ්‍ය මර්දනයේ සීතල මෙහෙයුම්**

ආශිකා බ්‍රාහ්මණ
ashika.janarala@gmail.com

මෙම පහරදීම අතර තුර මෙම මැරයන් ''මේ රට අපි ලේ හළල දිනාගත් රට..විනාශ කරන්න හදන්න එපා.. ඉගෙන ගන්න අවනම් ඉගෙන ගනිල්ල ආණ්ඩු පෙරලන්න හදන්නෙ නැතුව..මැරුම් කන්න හදන්නෙපා'' යැයි තර්ජනය කර ඇත.
මෙම ප්‍රකාශය නිසාත්, මීට පෙර දිගටම ජංගම දුරකථන හරහා ශිෂ්‍ය උද්ඝෝෂණ නවත්වන ලෙස බලකිරීම නිසාත් මෙම ප්‍රහාරය හා රජයේ ආරක්ෂක අංශ අතර ඇති සම්බන්ධය හෙළිදරව් වේ.

# අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු කිඹුල්ලෑවේ චන්ද්‍රානන්ද හිමිට එරෙහි මර්දනය




**කිඹුල්ලෑවේ චන්ද්‍රානන්ද හිමි**
**කැඳවුම්කරු - අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලය**
**ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

කිඹුල්ලෑවේ චන්ද්‍රානන්ද හිමි 2008 ජූනි මස 19 වන දින ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයට ඇතුළත් වූ අතර සිය පළමු අධ්‍යයන වර්ෂය තුළ ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සංගමයේ කණිෂ්ඨ භාණ්ඩාගාරික ලෙසද, දෙවන අධ්‍යයන වර්ෂයේ දී භික්ෂු සංගමයේ සභාපති ලෙසද කටයුතු කළේය. එසේම 2012 අගෝස්තු 05 වන දින සිට 2013 නොවැම්බර් 05 දින දක්වා අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු වශයෙන් ශිෂ්‍ය ව්‍යාපාරයට නායකත්වය දුන් මුන් වහන්සේ මෙම කාලය තුළ විශාල රාජ්‍ය මර්දනයකට මුහුණ දුන්හ.

අවස්ථා කිහිපයකදීම අභූත චෝදනා නගා මුන්වහන්සේගේ පන්ති තහනම් කිරීමට කටයුතු කළ විශ්වවිද්‍යාල පරිපාලනය 2012 ජනවාරි මස 2 වන දින ජීවිතාන්තය දක්වා ශිෂ්‍යභාවය අහෝසි කිරීමට කටයුතු කළේය.
එසේම උපකුලපතිවරයා විසින් හා පරිපාලනයට සම්බන්ධ විවිධ පිරිස් විසින් ගොණු කළ පැමිණිලි මත ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ මුන් වහන්සේට විරුද්ධව නඩු 18 ක් ගොණුකරන ලද අතර මෙම පැමිණිලිවල ප්‍රතිඵලයක් වශයෙන් අවස්ථා දෙකකදී සිරගතවීමටද සිදුවිය.

**නඩු සම්බන්ධ විස්තර**

| | |
|---|---|
| 01. | **නඩු අංකය** B/3465/2010 |
| **සිදුවීම** | 2010/10/14 දින රාත්‍රියේ භික්ෂු නේවාසිකාගාරයට පැමිණ උඩුකය වහගන්නැයි භික්ෂූන්වහන්සේලාට නියෝග කිරීමට හා තර්ජනය කිරීමටත් ආරක්ෂක අංශ විසින් භික්ෂුන් දෙනමක් තල්ලුකර පහරදීමටත් එරෙහිව විරෝධය පෑම (මෙම පහරදීම සම්බන්ධව ෂජ් 101-420 යන අංකය යටතේ මිරිහාන පොලීසියේ පැමිණිලි කර ඇත) |
| **චෝදනාව** | උපකුලපතිට, ආරක්ෂක නිලධාරීන්ට හා නියෝජ්‍ය විනය පාලකට පහරදීම හා තර්ජනය කිරීම |
| 02. | **නඩු අංකය** B/719/2011 |
| **සිදුවීම** | 2011/6/22 දින ආචාර්ය අරගලයට සහය දක්වමින් පෝසටරයක් ඇලවූ ශිෂ්‍යයකු විශ්වවිද්‍යාල ආරක්ෂක අංශ විසින් අල්වා පොලීසියට භාරදීමට විරුද්ධව මැදිහත්වීම |
| **චෝදනාව** | ආරක්ෂක නිලධාරීන්ට පහරදීම හා තර්ජනය කිරීම රාජකාරියට බාධා කිරීම |

padippakam

**03.** **නඩු අංකය** B/1652/201

**සිදුවීම** ප්‍රථම වසර සිසුන්ට මාස ගණනාවක් මහපොළ ලබානොදී සිට මහපොළ ලබාදීම සඳහා උත්සවයක් පවත්වා එස්.බී. දිසානායක ඇමතිවරයා එයට පැමිණීමට සූදානම්ව සිටි අවස්ථාවේ 2011/6/18 වන දින විශ්වවිද්‍යාල අචාර්යවරුන් හා සිසුන් එක්ව ඇමතිවරයාගේ පැමිණීමට විරුද්ධව උද්ඝෝෂණයක් පැවැත්වීම

**චෝදනාව** නීතිවිරෝධී උද්ඝෝෂණයක් පැවැත්වීම

**04. නඩු අංකය** B/180/2012

**සිදුවීම** 2012 ජනවාරි 05 විරු සිසු ප්‍රතිමාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කළ අවස්ථාවේ එම ප්‍රහාරයට සම්බන්ධවූවන්ට සහයදීම පිළිබඳව ආරක්ෂක අංශ නිලධාරීන්ට විරෝධය පෑම

**චෝදනාව** ආරක්ෂක නිලධාරීන්ට පහරදීම

චන්ද්‍රානන්ද හිමියන්ට විරුද්ධව මෙවැනි නඩු 18 ක් ගොනුකර ඇති අතර ඒවායේ චෝදනාවන්හි උක්ත චෝදනාවලට සෘජු සමාන කමක් ඇත. එම නිසා විස්තර රහිතව එම නඩුවල නඩු අංක පමණක් පහත ඉදිරිපත් කරමු.

| | |
|---|---|
| B/948/2012 | B/1459/2011 |
| B/181/2012 | B/4218/2011 |
| B/733/11 | B/109/2012 |
| B721/11 | B720/2011 |
| B4246 | B/2638/2013 |
| B/2380/2013 | |



படிப்பகம்

# කැලණිය විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් ශ්‍යාමලී ලියනආරච්චිට එරෙහි මර්දනය




ශ්‍යාමලී ලියනආරච්චි
2012/2013 මහා ශිෂ්‍ය සංගමයේ ලේකම්
කැලණිය විශ්වවිද්‍යාලය

2008 වර්ෂයේ අ.පො.ස. උසස්පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල අවස්ථා ලද ශ්‍යාමලී ලියනආරච්චි විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ 2009 වර්ෂයේ සිටම ශිෂ්‍ය ක්‍රියාකාරිණියක් ලෙස ශිෂ්‍ය ව්‍යාපාරය තුළ කටයුතු කරන ලද අතර, 2010-2011 අධ්‍යයන වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සංගමයේ උප සභාපති ලෙසද 2012-2013 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් ලෙසද කටයුතු කරන ලදී. මෙලෙස ශිෂ්‍ය ව්‍යාපාරය තුළ ක්‍රියාකාරීවීම නිසාම සහ සහෝදරියක් වීම නිසාත් රාජ්‍ය මර්දනය නොයෙකුත් ආකාරයෙන් ඇයට අභිමුඛ විය. එය විටෙක තම නිවෙසට පැමිණ කරන ආරක්ෂක අංශ මැදිහත්වීම්ද, විවිධ සමාජ ජාල වෙබ් අඩවි තුළින් කරන තර්ජන කිරීම් හා අපහාස කිරීම්ද, අධිකරණය ඉදිරියට කැඳවූ අවස්ථාවල වෙනම ඉදිරියට රැගෙන කරන දැඩි අවවාද කිරීම්ද, උද්ඝෝෂණ ව්‍යාපාරයන්ට සහභාගී වූ අවස්ථාවල ආරක්ෂක අංශ වලින් කරන ලද අඩත්තේට්ටම්ද මේවා අතර වේ.

**දිනය** 2013 පෙබරවාරි 22

**සිදුවීම** එදින රාත්‍රි බොරලැස්ගමුව පුබුදු මාවත ඇගේ නිවස ආශ්‍රිත ප්‍රදේශයේ ඇය ත්‍රස්තවාදී සංවිධානයක ක්‍රියාකාරිණියක් බව දක්වා ඡායාරූපයක්ද සහිතව අවලාද පෝස්ටරයක් අලවා තිබුණු අතර අබේරත්න මාවත, කනත්ත පාර ආදී ප්‍රදේශවල එම පෝස්ටරය තැන් තැන් වල බිම දමා ගොස් තිබිණි.




මෙම සිදුවීමෙන් අනතුරුව ඒ වන විටත් දිගින් දිගටම සිදුවූ දුරකථන තර්ජන හා ඇගේ නිවසට අපරාධ පරීක්ෂණ අංශයෙන් යැයි කියමින් පැමිණ දෙමව්පියන්ට සිදුකරන තර්ජන පිළිබඳවද සඳහන් කරමින් ඇයට ජීවිත තර්ජන ඇති බවට 2013 පෙබරවාරි 24 වන දින ලදු පත් අංක CIB II 34/265 යටතේ බොරලැස්ගමුව පොලීසියට පැමිණිල්ලක් සිදුකරන ලදී. මේ පිළිබඳ අද වන තෙක් කිසිදු පරීක්ෂණයක් සිදු වී නැත.

**දිනය** 2013 ඔක්තෝබර් 4

**සිදුවීම** පිරිමි නේවාසිකාගාරයට එල්ල කරන ලද මැර ප්‍රහාරයට එරෙහිව ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය මතු කරමින් මසකට ආසන්න කාලයක් සිසුන් විශ්වවිද්‍යාල භූමිය තුළ රැඳී සිට විරෝධය පළ කළද විසඳුමක් නොමැති වූ විට ජනාධිපති මන්දිරය දක්වා පැවැත් වූ සාමකාමී විරෝධතා පාගමනින් පසු කඩවත මහර උසාවියේ නඩු පැවරිනි. මෙහිදී චෝදනාව තිබුනේ 'මහජන පීඩා කිරීම' ය.

මෙම නඩු විභාගයේදී මැය වෙනම ඉදිරියට කැඳවා දැඩි අවවාද කරන ලදී. මෙම නඩුවේම ඊළඟ නඩු වාරයේදී සිය දෙමාපියන් සමඟ. (මව සමඟ) නැවත වතාවක් වෙනම ඉදිරියට ගෙන දැඩි අවවාද කරන ලදී. නැවත කිසිදු ශිෂ්‍ය ක්‍රියාකාරීත්වයක නොයෙදෙන ලෙස අවවාද කෙරිණ.

## රජරට විශ්වවිද්‍යාලයීය මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ඉසුරු බණ්ඩාරට එරෙහි මර්දනය



**අනුරාධ ඉසුරු බණ්ඩාර**
**මහා ශිෂ්‍ය සංගමයේ සභාපති**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**

අනුරාධ ඉසුරු බණ්ඩාර 2009 වර්ෂයේ රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයට ඇතුළත්වූ අතර ප්‍රථම වසරේ සිටම මහා ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයකු වශයෙන් කටයුතු කළේය. ඉන් අනතුරුව 2012 - 2013 අධ්‍යයන වර්ශයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වශයෙන් පත්වූ ඔහු එතැන් පටන් අධ්‍යාපනය විකිණීමේ ආණ්ඩුවේ ව්‍යාපෘතියට එරෙහිව රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාවට නායකත්වය ලබාදෙයි. මෙහි ප්‍රවීපලයක් ලෙස ඔහුට දැනටමත් විශාල මර්දනයකට මුහුණදීමට සිදුව තිබේ.

**දිනය** 2013 අගෝස්තු 2

**සිදුවීම** ''ගමයි සරවියයි'' වැඩසටහන කඩාකප්පල් කළේයැයි කියන බොරු චෝදනා මත 2013/8/2 දින ඔහුගේ ශිෂ්‍ය භාවය අහෝසි කරන ලදී. තවත් අවස්ථා ගණනාවකදී විනය පරීක්ෂණ කැඳවා අභූත චෝදනා ගණනාවක් ද එල්ලකරනු ලැබිණ. ඒ අතර රජයේ ආරක්ෂක අංශ හරහා ඔහුට හා ඔහුගේ දෙමව්පියන්ට අවස්ථා ගණනාවකදී මරණ තර්ජන ද එල්ල කරනු ලැබිණි. 2013 සැත්තැම්බර් මාසයේ මුල් සතියේ කිහිපවිටක්ම යතුරුපැදිවලින් පැමිණි ආරක්ෂක අංශ සමාජිකයන් යැයි කියාගන්නා ලද පිරිස් දෙමව්පියන් වෙත චෝදනා ගණනාවක් එල්ල කරන ලදී. ඒ අතර එක් දිනක් කොළ පැහැති ඩිපෙන්ඩර් රථයකින් පැමිණි 6 දෙනෙකු විසින් දෙමව්පියන්ට මොහු රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණවලට සම්බන්ධ බවටත් එබැවින් පරෙස්සන් කරගත්තේ නොමැතිනම් ඉදිරියේදී කරදර සිදුවීමට සිදුවනු ඇති බවටත් ප්‍රකාශකර පලා ගොස් ඇත. ඊට අමතරව නාදුනන දුරකථන ඔස්සේද අවස්ථාගණනාවකදී ඔහුට එරෙහිව මරණ තර්ජන එල්ළ වී තිබේ.

# අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු සංජීව බණ්ඩාරට එරෙහි මර්දනය



**සංජීව බණ්ඩාර**
**අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු**

සංජීව බණ්ඩාර සහෝදරයා 2011 වර්ෂයේ ජනවාරි 06 දින අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වශයෙන් පත්වූ අතර ආණ්ඩුවේ අධ්‍යාපනය විකිණීමේ ප්‍රතිපත්තියට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරයට නායකත්වය ලබාදීමේ ප්‍රතිඵයක් වශයෙන් එතැන් පටන් මේ දක්වා විශාල රාජ්‍ය මර්දනයකට මුහුණ දී සිටියි.

පත්වීමෙන් අනතුරුව රුහුණ විශ්වවිද්‍යාලයේ පරිපාලනය විසින් ශිෂ්‍යභාවය අහෝසි කරන ලදි. අවස්ථා තුනකදී බොරු චෝදනා එල්ල කර අත්අඩංගුවට ගන්නා ලද අතර ඒ සෑම අවස්ථාවකදීම දින ගණනක් රක්ෂිත බන්ධනාගාර ගතවීමට ඔහුට සිදුවිය. එසේම ඔහුට එරෙහිව අධිකරණ කිහපයකදී ඇප කොන්දේසි ගණනාවක්ද ඉදිරිපත්කර තිබේ.
එසේම අවස්ථා ගණනාවකදී විවිධ තර්ජන වලට ලක් වූ ඔහු පැහැර ගැනීම සඳහා එක් අවස්ථාවක් හෝමාගම පිහිටි සමාජවාදී ශිෂ්‍ය සංගමයේ කාර්යාලයකටද ආයුධ සන්නද්ධ පිරිසක් කඩාවැදී තිබේ. ඔහු එහි නොසිටි නමුත් මේ හරහා මර්දනයේ සැබෑ තත්වය හඳුනාගත හැකිය.

**හිරගත කිරීම පළමු අවස්ථාව**

**දිනය** **2011 ජනවාරි 26**

**සිදුවීම** එදින රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය පිළිබඳ දේශනයකට සම්බන්ධවී කොළඹ බලා පැමිණීමට කඹුරුපිටිය මාපලානේ සිට කෘෂි පීඨ ශිෂ්‍ය සංගමයේ සභාපති අමිල ප්‍රසාද් කරුණාතිලක සමග යතුරුපැදියකින් මාතර දක්වා පැමිණෙමින් සිටියදී තිහගොඩ පොලිස් මුරපොලේදී ඔහු පළමු වතාවට අත්අඩංගුවට ගනු ලැබිණ.

අත්අඩංගුවට ගැනීමත් සමග රාජ්‍ය මාධ්‍ය හරහා මොහු ගිණි අවියක් ප්‍රවාහනය කරමින් සිටියදී අත්අඩංගුවට ගන්නා ලද බවට බොරු ප්‍රචාරය කරමින් අවි ආයුධ ළඟ තබාගැනීම හා ප්‍රවාහනය යන චෝදනාව යටතේ මාස ගණනාවකට බන්ධනාගාර ගතකිරීමට සූදානම් වූ නමුත් නීතීඥයන් හරහා හදිසියේම ක්‍රියාත්මකවීම නිසා එම උත්සාහය ව්‍යවර්ථ විය.
නමුත් එම උත්සාහය අසාර්ථක වීමෙන් අනතුරුව රුහුණ විශ්වවිද්‍යාලයේ ගැටුමකට සම්බන්ධ යැයි චෝදනාකර මාතර පොලීසිය හරහා දින 14 කට රක්ෂිත බන්ධනාගාර ගතකරනු ලැබිණ.

මෙම ගැටුම වන විට මොහු විශ්වවිද්‍යාලයේ නොසිටියා පමණක් නොව මෙම ගැටුමේදී පහරකෑමට ලක්වූ සිසුන්ද එම අවස්ථාවේදී කරන ලද පැමිණිල්ලේ ඔහුගේ නම සඳහන්කර නොතිබුණි. නමුත් මේ අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව 2011/01/26 වන දින නව පැමිණිල්ලක් ලියවා එහිදී මේ ගැටුමට අදාළව මොවුන්ගේ නම් ඇතුළත් කර දින 14 කට හිරගත කරන ලදි.

හිරගත කිරීම දෙවන අවස්ථාව

**දිනය** **2012 සැත්තැම්බර් 19**

**සිදුවීම** අචාර්ය වැඩවර්ජනය හේතුවෙන් මාස තුනක් පමණ විශ්වවිද්‍යාල වසා දමා තිබූ තත්වයක් යටතේ ආචාර්ය ගැටලු විසඳා වහාම විශ්වවිද්‍යාල විවෘත කිරීමට, පෞද්ගලික විශ්වවිද්‍යාල අහෝසි කිරීමට, පාසල්වලින් ගාස්තු අයකිරීම නැවතීමට, අධ්‍යාපනයට ප්‍රතිපාදන 6% ක් වෙන් කිරීමට බලකරමින් අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය විසින් විශ්වවිද්‍යාල සිසුන් 2000 කගේ පමණ සහභාගීත්වයෙන් කොටුව දුම්රියපොළ ඉදිරිපිට සිට ජනාධිපති මන්දිරය දක්වා පාගමනක් සංවිධානය කරන ලදි. එම පාගමන ඕල්කට් මාවත වසා පොලිසිය විසින් කඳුළු ගෑස් හා ඇමෝනියා ජල ප්‍රහාරයක්ද, ගල්මුල් ප්‍රහාරයක්ද එල්ලකර මර්දනය කරන කරන ලදී. මෙම ප්‍රහාරය නිසා සිසුන් විශාල ප්‍රමාණයක් ද තුවාල ලැබූහ.

මෙම උද්ඝෝෂණය වැලැක්වීම හා සිසුන්ට අමානුෂික ලෙස පහරදීම මානව හිමිකම් කඩවීමක් වුවත් අන්තිමේ නීතිය ක්‍රියාත්මක වූයේ පහරදීමට පක්ෂපාතීව උද්ඝෝෂණය නීති විරෝධී යැයි තීන්දු කරමිනි.

ඒ අනුව නීති විරෝධී උද්ඝෝෂණයක් සංවිධානය කර මහජනතාවට පීඩාකිරීම හා පාරේ ගමනාගමනයට අවහිර කිරීම, වතුර බවුසරයකට අලාභ හානි සිදුකිරීම යන චෝදනා යටතේ 2012 සැප්තැම්බර් 19 වන දින සංජීව බණ්ඩාර සහෝදරයා අත්අඩංගුවට ගනු ලැබිණි.
පසුව දින 5 රක්ෂිත බන්ධනාගාර ගතකිරීමෙන් අනතුරුව ඇප කොන්දේසි ගණනාවක් මත නිදහස් කරන ලදී.

**නඩු අංකය** B1291/2012

**ඇප කොන්දේසි** 01. සෑම සතියකම සඳුදා, බදාදා, සෙනසුරාදා යන දිනවල පෙ.ව. 9.00 - ප.ව. 12.00 අතර කොළඹ අපරාධ කොට්ඨාසයට වාර්ථා කිරීම

02. නීති විරෝධී ජන රාශියක සමාජියකු ලෙස කටයුතු නොකිරීම හා මහජන පීඩාකාරී තත්වයක් ඇතිවන අයුරින් කටයුතු නොකිරීම

මෙම කොන්දේසිවලට අනුව කිසිසේත්ම ඔහුට සිය අයිතීන් වෙනුවෙන් අරගල කිරීමේ ඉඩක් ඉතිරිකර නොමැති අතර ඕනෑම අවස්ථාවක අත්අඩංගුවට ගෙන සිරගත කිරීමේ ඉඩ ඉතිරි කරගෙන ඇත.

අත් අඩංගුවට ගැනීම තෙවන අවස්ථාව

**දිනය** 2013 ජුනි 27

සිදුවීම:- ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උග්‍ර අධ්‍යයන සුහසාධන ගැටලු විසඳීමට බලකරමින් හා ශිෂ්‍ය මර්දනයට එරෙහිව එම විශ්වවිද්‍යාලයේ සිට නුගේගොඩ මන්සන්දිය දක්වා පාගමනක් පැවැත්වූ අතර එම උද්ඝෝෂණයේ දී මහජනතාවට පීඩාවක් ඇති කරමින් හා පාරේ ගමනාගමනයට බාධා පමුණුවමින් පෙර නඩුවේ ඇප කොන්දේසි කඩ කළේ යැයි කියමින් 2013 ජුලි 8



වන දින නැවත අත්අඩංගුවට ගන්නා ලදි.
ඒ අනුව දින 7 ක් බන්ධනාගාර ගතකර සිට පෙර පැවති ඇප කොන්දේසිවලටත් වඩා බරපතළ ඇප කොන්දේසි යටතේ ඔහුගේ ක්‍රියාකාරීත්වයට මුළුමනින්ම විලංගු ලමින් ඇප ලබාදෙන ලදි.

ඒ අනුව කිසිම උද්ඝෝෂණයකට සම්බන්ධවීමද, ලංකාවේ කුමන හෝ විශ්වවිද්‍යාලයකට ඇතුළු වීමද ඇප අවලංගු කර නැවත සිරගත කිරීමට හේතුවේ.

එම සිදුවීමටම අදාළව ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේද නඩුවක් (ඊ/2380/2013) ගොනුකර තිබුණ අතර එම නඩුවට අදාළවද දින 14 ක් බන්ධනාගාර ගතවීමට ඔහුට සිදුවිය.

**ඇප කොන්දේසි**

නීති විරෝධී උද්ඝෝෂණයක සාමාජිකයකු නොවිය යුතු වීම

සෑම මසකම පළමු හා තුන්වන දින දෙකේ කොළඹ අපරාධ කොට්ඨාසයට වාර්ථා කිරීම

දිවයිනේ කිසිදු විශ්වවිද්‍යාලයකට ඇතුල් නොවිය යුතු වීම

**නැවත ඇප අවලංගු කිරීමට සිතාසි**

උක්ත සඳහන් ඊ/1291/2012 නඩුවේ ඇප කොන්දේසි නැවත කඩ කළේ යැයි යන පැමිණිල්ලක් යටතේ 2014 ජනවාරි 8 වන දින සංජීව බණ්ඩාර සහෝදරයා උසාවියට කැඳවීමට කටයුතු කර ඇති අතර නැවත සිරගත කිරීමට සූදානම් වේ.

පොදු රාජ්‍ය මණ්ඩල නායක සමුළුවට සියලුම විශ්වවිද්‍යාල වසා දමා සිසුන් 80000 කගේ අධ්‍යාපන කටයුතු කඩාකප්පල් කිරීමට ගන්නා ලද ආණ්ඩුවේ තීරණයට එරෙහිව කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිට 2013 නොවැම්බර් 08 වන දින පැවති උද්ඝෝෂණ ව්‍යාපාරයේ දී පෙර නඩුවේ ඇප කොන්දේසි කඩවුණේය යන චෝදනාව යටතේ මෙම කැඳවීම සිදුකර තිබේ.

# අධ්‍යාපන ආයතන මිලිටරිකරණය හරහා සිදුකරන මර්දනය

ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහි රාජ්‍ය මර්දණයෙහි නව පරිච්ඡේදයක ආරම්භය යුද්ධය අවසන් වීමත් සමගම සිදුවිය. යුද්ධය හේතුවෙන් ආණ්ඩුව වටා ඒකරාශීවූ ජනප්‍රියත්වයත් යුද්ධයේ ඝාතන සංස්කෘතිය විසින් මුළු මහත් සමාජයෙහිම ඇතිකළ මනුෂ්‍යත්වයේ පරිහාණියත් ආණ්ඩුවට ඒ සඳහා සරු පසක් නිර්මාණය කළේය. එසේම ආර්ථික තලයේදී නව ලිබරල් ප්‍රතිසංස්කරණ දියත්කිරීමේහිලා  අධ්‍යාපන ක්ෂේත්‍රය මූලිකම ක්ෂේත්‍රයක් වශයෙන් හඳුනාගෙන තිබීමත් එකී ප්‍රතිසංස්කරණවලට එරෙහි ප්‍රබල අභියෝගයක්ව ශිෂ්‍ය ව්‍යාපාරය පැවතීමත් එම මර්දනයේ අවශ්‍යතාව දැඩිව තහවුරු කළේය.

යුද්ධය අවසන් කාර්තුවේදීම බොහෝ රාජ්‍යගැති මාධ්‍ය ප්‍රධානීහු මේ සඳහා මතවාදී පසුබිම සකස්කරමින් සිටි අතර ඔවුන් කීවේ උතුර මුදාගැනීමෙන් පසු ආරක්ෂක අංශවල ඊළඟ භාරදූර වගකීම වියයුත්තේ ''දකුණේ මුදානොගත් ප්‍රදේශ''(ඔවුන් විශ්වවිද්‍යාල හඳුන්වනු ලැබූයේ ඒ නමිනි) එනම්, දකුණේ රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍ය ව්‍යාපාරයෙන්  මුදාගැනීම බවයි. මෙම මතවාදය පෝෂණය කිරීමේදී හෙල උරුමය වැනි ජාතිවාදී පක්ෂ විශාල කාර්‍යභාරයක් ඉටු කළේය. රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ එතෙක් පැවති සාපේක්ෂ ස්වාධීනත්වයද කෙළෙසා දමා රාජ්‍ය හා එහි ක්‍රියාකාරීත්වය ප්‍රශ්නකරන්නන්ගෙන් සැදුණු ප්‍රජාවක් වෙනුවට රාජ්‍යයට පක්ෂපාතී හා එහි සියලු මුග්ධකම්වලට ප්‍රසස්ථි වයන්නන්ගෙන් සැදුම්ලත් ප්‍රජාවක් සරසවි තුළ නිර්මාණය වනු දැකීම මේ කාගේත් ආශාව විය. ඒ අනුව මිලිටරි යාන්ත්‍රණය යොදවා ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය කිරීමේ වැඩපිළිවෙල ඉ දිරියට ගන්නා ලදී.

මෙහි පලමු පියවර වශයෙන් විශ්වවිද්‍යාලවලට ඇතුලත්වන නවක සිසුන් අනිවාර්ය හමුදා පුහුණුවක් හඳුන්වාදෙන ලදී.

එහිදී විශ්වවිද්‍යාල ප්‍රජාවගෙන් හා ප්‍රගතිශීලී බුද්ධිමතුන්ගෙන්ද අධ්‍යාපනය පිළිබඳ විශේෂඥයින්ගෙන්ද දැඩි විරෝධයක් එල්ල වූ අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ එහි ප්‍රතිමාණයන්ට අදාලව හමුදාපුහුණුවෙහි ඇති නොවැදගත් බව කවුරුත් අවධාරණය කළහ. දෙමවුපියෝද, ශිෂ්‍යයෝද මෙම පුහුණුව ප්‍රතික්ෂේප කළහ. සාධාරණය පතා ශ්‍රේෂ්ඨාධිකරණයට පවා ගියහ. එහෙත් ඒ කිසිවක් ප්‍රජාතන්ත්‍රවාදය බින්දුවට කෙලෙසා දමුනු හා පුරවැසියාගේ භූමිකාව යටපත්කොට යටත්වැසියාගේ භූමිකාව උත්කර්ෂයට නගා තිබූ රටක ජනතාවට සාධාරණය ඉටු නොකළේය.

කෙසේ හෝ සියලු විරෝධතා මැද්දේ හමුදා පුහුණුව ලබාදීම 2009 වසරේ සිට ආරම්භකරන ලදී. එහිදී සිසුන් විශාල වශයෙන් කායිකවත් ශාරීරිකවත් පීඩාවට පත්විය. බලහත්කාරයෙන් විවිධ ක්‍රියාකාරකම් සඳහා යොදවාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස විශාල වශයෙන් සිසුන් තුවාල ලැබූහ. දෙමව්පියන්ට පවා සිය දරුවන් රැගෙනයාමේ අයිතිය අහිමි කෙරිණි. සිසුන්ගේද දෙමව්පියන්ගේද මූලික අයිතිවාසිකම් ඇස් පනාපිට උදුරා දමනු ලැබිණි. එවැනි සිදුවීම් සිය ගණනක් වුවද ඉදිරිපත් කළ හැකිය.

01. මාඳුරුඔය හමුදා කඳවුරේදී අඩි හයක පමණ ගැඹුර වලකින් බලහත්කාරයෙන් පැන්නවීමේ ප්‍රතිඵලයක් ලෙස කේ.කේ සෙව්වන්ධි ශිෂ්‍යාවගේ කකුලේ වළලුකර අසල අස්ථියක් බිඳී අබාධිත තත්ත්වයට පත්වීම

02. වත්සලා සෙව්වන්ධි ශිෂ්‍යාව මහනුවර හුවැලිකඩ හමුදා කඳවුරේදී පලංචියකින් ඇද වැටී තුනටියේ අබාධයකට ලක්වීම



03.



ලංකාදීප ONLINE
www.lankadeepa.lk
අන්තර්ජාලයට එකතු වූ ප්‍රථම සිංහල පුවත්පත
2014 ජනවාරි මස 07 වැනි අඟහරුවාදා

එසැණ පුවත් | ක්‍රීඩා විත්ති | සයුරෙන් එතෙර | අපේ උරුමය | වීඩියෝ දර්ශන | විශේෂාංග | පෙර

NDB බැංකුව රට සල්ලි අනුපාතය 2014-01

කොටස් වෙළඳපොළ 4 @ 20.00 -2.44 AHUN.N0000 5 @ 78.90 0.25 KGAL.N

AMW bringing the world to you SUZUKI MILLION MADNESS Buy A New Suzuki before 31st January 2014 and stand a chance to WIN A MILLION BUCKS IN THE GRAND DRAW Learn More Sales Hotline : 0117 609 609

## විදුහල්පති රන්ටැඹේ පුහුණුවේදී මරුට

2013 ජූනි මස 30 10:12:33 | හරිඳු ජයවර්ධන , බන්දුල ගොඩකුඹුර

Share Tweet 0

රන්ටැඹේ කඳවුරේ පුහුණුව ලබමින් සිටි විදුහල්පතිවරයකු අද උදෑසන ක්‍රීඩා සඳා පෙළගස්සද්දී හදිසියේ මිය ගිය බවත්, අවුරුදු ගණනක් කිසිදු ක්‍රීඩාවක් නොමැතිව සිටි විදුහල්පතිවරුන්ට හමුදා පුහුණුව ලබා දීමේ දී විවිධ අතුරු ආබාධ ඇති බව බව අමාත්‍යංශය දැනගත යුතු බවත්, මෙවැනි අවාසනාවන්ත සිද්ධියක් වූයේ අමාත්‍යංශයේ වරදින් බවත් ලංකා ගුරු සංගමය කියයි.

එලෙස මිය ගියේ සීදූව පඤ්ඤානන්ද විද්‍යාලයයේ විදුහල්පති ඩබ්ලිව් ඒ එස් වික්‍රමසිංහ (52) මහතාය.

මහියංගනය රෝහල් ආරංචි මාර්ග පැවසුවේ එම විදුහල්පතිවරයා හෘදයාබාධයකින් මිය ගිය බවයි.

රන්ටැඹේ ආරංචි මාර්ග කියනුයේ පෙරේදා (28) පුහුණුව සඳහා පැමිණි විදුහල්පති අද උදේ ව්‍යායාම කිරීමට පෝලිම් කරද්දී පපුව අමාරුවක් යැයි කියමින් පපුව අල්ලාගෙන හිඳ ගත් බවයි.

වැලිමඩ නිෂාන්ති මදූෂානි හමුදා පුහුණුවේදී ඇති වූ රෝගී තත්ත්වයක් නිසා බදුල්ල මහ රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියයාම මෙම හමුදා පුහුණුව විසින් ඇති කළ භයානක ප්‍රතිඵල කිහිපයක් පමණක් වන අතර ශාරීරික අබාධයන්ට හා මානසික ආතතීන්ට සිසුන් ගොදුරුවූ අවස්ථා හා විවිධ ලිංගික බලහත්කාරකම් සිදුවූ අවස්ථා සියගණක් වුවද ඉදිරිපත් කළ හැකිය.

මෙසේ සිසුන්ගේ ජීවිත සමග සෙල්ලම් කරමින් ඇරඹුණු මිලිටරීකරණ උන්මාදය සමස්ථ අධ්‍යාපන ආයතන පද්ධතිය පුරා වේගයෙන් පැතිරයාම ඉතාමත් ඉක්මනින්ම සිදුවිය. පාසල් සිසුන්ට හා විදුහල්පතිවරුන්ටද උපාධිධාරීන්ටද ආදී වශයෙන් කාටත් පොදුවේ  මෙම පුහුණුව නිර්දේෂ කරනු ලැබින. විදුහල්පතිවරුන් හමුදා කර්නල් තනතුරුවලට උසස් කිරීම දක්වාත්, විශ්වවිද්‍යාලවලට හමුදා ප්‍රධානීන් රිංගවීම දක්වාත් මෙම මිලිටරි බලපෑම සිදුවිය. මිලිටරි යාන්ත්‍රණය වන්දනයට හුරුකළ සාමාන්‍ය සමාජය මේ ක්‍රියාවලියේ භයානක කම අඳුනා නොගත් අතර එය ආණ්ඩුවට මෙහිදී විශාල පහසුවක් විය.

මෙකී පුහුණුවීම්වලදී ශිෂ්‍යයින්ගේ තබා විදුහල්පතිවරුන්ගේවත් අභිමතයට කිසිඳු ඉඩක් නොලැබිණි. අභිමතය වූ කලී හමුදා ප්‍රධානීන්ගේ අභිමතය විය. මේ කාටත් එයට යටත්වීම හැර අන් විකල්පයක් නොවුනි. අභිමතය, රුචියට නොව අවමය ශාරීරික යෝග්‍යතාවය කෙරෙහි වුවද සැලකීමක් සිදු නොවිණ.  එහි ප්‍රතිඵලයක් වශයෙන් රන්ටැඹේ හමුදා කඳවුරේ පුහුණුව ලබමින් සිටි සීදූව පඤ්ඤානන්ද විද්‍යාලයේ ඩබ්ලිව්.ඒ.එස්. වික්‍රමසිංහ මහතා පුහුණුව අතරේ මිය ගියේය.

නමුත් අධ්‍යාපන ආයතන තුල හමුදාමය විනයක් ගොඩනැගීම හා රාජපක්ෂ රෙජිමයේ දේශපාලන අභිමතයට පක්ෂපාත පරිපාලන ව්‍යුහයක් පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් ජීවිත සියදහස් ගණනකින් මිල ගෙවා වුවද මෙම හමුදා පුහුණුව ආණ්ඩුව දිගටම පවත්වාගෙන යාමට සූදානම් බව පෙනී යයි. මෙම හමුදා පුහුණුව නවක ශිෂ්‍යයා තුල හමුදාමය පන්නයේ විනයකට අදාල පසුබිම සැකසීමටත් විශ්වවිද්‍යාලතුල ශිෂ්‍ය දේශපාලණයට එරෙහි ඔත්තුකරුවන් හඳුනාගන්නා හා පුහුණුකරනු ලබන පාඨමාලාවක් ලෙසත් යොදාගනී.

එහිම දිගුවක් වශයෙන් ඊලග පියවර ලෙස රෙජිමයට පක්ෂපාත ආරක්ෂක අංශයක් විශ්වවිද්‍යාල තුල ස්ථාපිත කරගැනීමද සිදුවිය. ඒ ආරක්ෂක ලේකම්වරයාගේ '' රක්නා ලංකා'' නැමති ආරක්ෂක අංශය ස්ථාපිත කිරීමයි. මෙම ආරක්ෂක අංශය විශ්වවිද්‍යාලවලට ගෙන ඒමද ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාමාර්ග ඔස්සේ සිදුවිය. එනම් රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිවලින් පවා බැහැරව රාජ්‍ය බලය යොදා සිදුකරන ලදී. ඊට පෙර විශ්වවිද්‍යාල පද්දතියේ ආරක්ෂක සේවා සැපයූ සමාගමට මුළු වර්ෂය සඳහාම ගෙවිය යුතු වූයේ රු.කෝටි 20ක් වුවත් රක්නා ලංකා ආරක්ෂක අංශය කෝටි 70 ක් වැය කර බඳවාගැනීමෙන් මෙම ආරක්ෂක අංශය රිංගවා ගැනීමට ආණ්ඩුවට ඇති අවශ්‍යතාවය හා වැදගත්කම මැනවින් අවබෝධවේ.පන්ති තහනම් කිරීම් හා ශිෂ්‍යභාවය අහෝසි කිරීම්

padippakam

# පසුවදන


පසුගිය වසර 4 කාලය තුළ ශිෂ්‍ය ව්‍යාපරයට එරෙහි මර්දනය ඉතාමත් සාහසික අයුරින් වර්ධනය වී ඇති බව මෙම වාර්ථාවෙහි ඉදිරිපත්වී ඇති සංඛ්‍යාලේඛන තුළින් පෙනී යයි. එසේම එම තත්ත්වය තවදුරටත් විවිධ තලයන් ඔස්සේ වර්ධනය වෙමින් ද තිබේ. මෙය කොහෙත්ම ශිෂ්‍ය ව්‍යාපාරයට එරෙහිව ක්‍රියාත්මක වන්නක් පමණක් නොව සෑම සියලු ක්ෂේත්‍රයක් දෙසම බැලීමේදී දක්නට ලැබෙන  පොදු තත්ත්වයකි.

නවලිබරල් ධනවාදය වේගයෙන් මුළු මහත් සමාජයේ අස්සක් මුල්ලක් නෑර වෙළඳ පොළ ව්‍යාප්ත කරමින් තිබීමත්, එකී වෙළඳ පොළකරණය තුළ සමාජයේ බහුතරයකගේ මූලික මිනිස් අයිතීන් පවා උල්ලංගණයවීමත් (පසුගිය කාලයේ රතුපස්වල ජනතාව මුහුන දුන් ජල ගැටලුව හා ඊට එරෙහි රාජ්‍යයේ මැදිහත්වීම) ගත හැක.  ඒ තුළ අරගල පැනනගිමින් තිබීම තුළින් මෙම මර්දනය වඩා උග්‍ර කිරීම පාලකයන්ගේ උපාය වී තිබේ. සමාජ අසාධාරණත්වය මෙසේ තවදුරටත් වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් තුළ, හා දිනෙන් දින සෑම පොදුජන අයිතියක්ම කප්පාදුකර දමමින් ඇති තත්වයක් තුළ අසාධාරණයට  පත්වන බලවේග සටන් වැදීමත් එකී අරගලවලට එරෙහිව පාලක පංතිය මර්දනය කැඳවීමත් පොදු සාමාන්‍ය අත්දකීමක් බවට පත්වේ. රජයට සිය පැවැත්ම වෙනුවෙන් ඍජු රාජ්‍ය ප්‍රචන්ඩත්වය පවා යෙදවීමට සිදුවේ. අද රාජපක්ෂ රෙජිමය තුළ සිදුවන්නේ එයයි. ඒ සඳහා ශිෂ්‍ය ව්‍යාපාරය විශයෙහි සිසුන්ගේ පන්ති තහනම් කිරීම මෙන්ම සිසුන්ගේ නිවෙස් වලට ඍජුවම කෙරෙන ආරක්ෂක අංශ මැදිහත්වීම් දක්වා මෙය ව්‍යාප්ත වේ. අධිකරණ ක්‍රියාවලිය මේ සඳහා යොද ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්දයෙන් බරපතල තත්ත්වයකි. මෙය තවදුරටත් ඉදිරියට යමින් ආරක්ෂක බුද්ධි අංශ භාවිතා කර සිසුන්ට එරෙහිව කරන මර්දනය සාධාරණීකරණය කිරීමට ඔවුන්ට කරන ද්වේශ සහගත ප්‍රචාරයන් හා අවලාද නැගීම්ද දැකිය හැක. පහත දැක්වෙන්නේ ඒ ආකාරයෙන් සිසුන්ගේ නිවෙස් වලට නිර්ණාමිකව යවන ලද ලිපි හා කරන ලද බුද්ධි අංශ මැදිත්වීම් වල සාක්ෂීන්ය.

අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් කොට විකුණාදැමීම රාජපක්ෂ රෙජිමයේ ප්‍රතිපත්තියයි. එය ක්‍රියාවට නැගීමේදී ශිෂ්‍ය ව්‍යාපාරය ප්‍රබල සතුරකු වශයෙන් අඳුනාගෙන ඇති අතර ඒ සතුරා සමූලඝාතනය සඳහා රාජ්‍ය ත්‍රස්තය යොදා ගැනීම අනිවාර්යකි. මේ ක්‍රියාත්මක වන්නේ  එයයි. එසේම මේ මර්දනය කොහෙත්ම හුදකදලා ව්‍යුක්තයක් වශයෙන් අඳුනා ගැනීම නිවරදි නොවේ.  එය සංයුක්තව අඳුනා ගැනීමත්, තනි තනිව සටන් වැද රාජ්‍ය මර්දනයේ ගොදුරුබවට පත්වීමත් වෙනුවට සියලු සමාජ බලවේග එක්ව සටන් වැදිය යුතු ඓතිහාසික මොහොතකට අපි එළඹ සිටිමු. එසේම ප්‍රජාතන්ත්‍රවාදය හා මූලික අයිතිවාසිකම් රැකගැනීමද ව්‍යුක්ත ප්‍රශ්නය නොවේ. එය පැහැදිළිවම සමාජයේ රජයන අසමානත්වය හා සුළුතරයක් විසින් සාතිශය බහුතරයක් සිය අභිමතය වෙනුවෙන් කොල්ලකෑමටද එරෙහි සටනකි. මර්දනයට එරෙහිව කරනු ලබන අරගලයත්, ප්‍රජාතන්ත්‍රයවාදය හා මානව නිදහස දිනාගැනීමේ අභිලාෂයත් ජයගත හැකිවනු ඇත්තේ එවැනි අරගලයකින් පමණි.



படிப்பகம்




උතුරේ දැඩි මතධාරී දෙමළ තරුණ සංවිධානයක් ලෙස යාපනය විශ්ව විද්‍යාලය තුලින් ඇරඹුණ ලොව දරුණුතම ත්‍රස්ථවාදි සංවිධානයක් වන එල්ටීටීඊ සංවිධානය යුධමය වශයෙන් පරාජය කොට එහි උණුසුම තවම මැකී ගොස් නොමැත. පසුගිය දශක තුනක කාලය තුල ඔවුන් රටේ කල විනාශයන් පිළිබඳව ඔබට අමුතුවෙන් කීමට අවශ්‍ය නැත. මෙවැනි තත්ත්වයක් තුල එල්ටීටීඊ සංවිධානයේ ආකල්පයන් පෙරදැරි කොට ගෙන උතුරේ දේශපාලන වාසි ලබාගැනීම සඳහා ව්‍යාජ සටනක යෙදෙන **දෙමළ ජාතික සංධානය** (TAMIL NATIONAL ALLIANCE - TNA) හා **දෙමළ ජාතික මහජන පෙරමුණ** (TAMIL NATIONAL PEOPLE'S FRONT - TNPF) එල්ටීටීඊ ය වෙනුවෙන් යාපනය විශ්ව විද්‍යාල සිසුන් වෙත නැවතත් ඍජුවම බලපෑම් කරමින් අතීතයේ සිදු වූ දෙය නැවත සිදු කිරීමට උත්සහ දරමින් සිටියි. මෙහි ප්‍රතිඵලය වන්නේ නැවත එල්ටීටීඊ සංවිධානයක් බිහිකොට දශක තුනකට ආපස්සට ඇද දැමූ අධ්‍යාපනය නැවත දශක ගණනාවක් ආපස්සට ඇද දැම්මත්, තරුණ ජීවිත අකාලයේ විනාශ වීමත්ය. මෙම ඊනියා වැඩ පිළිවෙලේ ආරම්භය මෙවර එල්ටීටීඊ මහවීරු දින සැමරුම් උත්සවය යාපනය සරසවිය තුල සැමරීමට සැලසුම් කිරීමෙන් ඔප්පු කරන ලදි.

<u>**එල්ටීටීඊ විදෙස් කණ්ඩායම් වල ක්‍රියා**</u>


එල්ටීටීඊ සංවිධානය යුධමය වශයෙන් පරාජය වීමෙන් පසුව යුරෝපයට හා බටහිර රටවල් වලට පැනගිය සටන්කාමීන් එම රටවල වෙසෙන මිලියනයක් පමණ වන ශ්‍රී ලාංකික දෙමළ ජනතාව නොමග යවමින් රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් ඊනියා සංවිධාන බිහිකරමින් එල්ටීටීඊ සංවිධානයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන අතර ප්‍රධාන වශයෙන් එල්ටීටීඊ සංවිධානය කණ්ඩායම් 04 කට බෙදී රට දෙකඩ කිරීමේ එකම අරමුණ කරා ගමන් කරනු ලබයි.

| | | |
|---|---|---|
| අ. | රටින් පිට දෙමළ ඊළාම් රාජ්‍ය | (රුද්‍රකුමාර්ගේ නායකත්ව ‍යෙන්) |
| ආ. | ලෝක දෙමළ සංසදය | (එමානුවෙල් පියතුමාගේ නායකත්වයෙන්) |
| ඇ. | දෙමළ සම්බන්ධීකරණ කමිටුව | (නෙඩියවන්ගේ නායකත්වයෙන්) |
| ඈ. | මූලස්ථාන කණ්ඩායම | (එල්ටීටීඊ බුද්ධි අංශ විනායගම්ගේ නායකත්වයෙන්) |

මෙම සියල්ල එක් වී විදේශගත දෙමළ ප්‍රජාවගෙන් ලැබෙන මුදල් යොදවා ව්‍යාජ ප්‍රචාරයන් දියත් කිරීමටත් එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා දැඩි පීඩනයක් අප රටට එල්ල කිරීමටත් අවසානයේ රට දෙකඩ කර ගැනීමටත් දැඩි ප්‍රයත්නයක යෙදී සිටියි. මෙම තත්ත්වය බුද්ධිමත් සිසු සිසුවියන් ලෙස ඔබ තේරුම්ගත යුතුය.

<u>**දෙමළ ජාතික සංධානය (TNA), දෙමළ ජාතික ජනතා පෙරමුණ (TNPF), පෙරටුගාමි සමාජවාදි පක්ෂය (FRONTLINE SOCIALIST PARTY - FSP), අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය (INTER UNIVERSITY STUDENTS UNION - IUSU) හා යාපනය විශ්ව විද්‍යාල ශිෂ්‍ය කමිටුවේ (JAFFNA UNIVERSITY STUDENT UNION - JUSU) ක්‍රියාකාරකම්**</u>

දෙමළ ජාතික සංධානය හා දෙමළ ජාතික ජනතා පෙරමුණ ඍජුවම යාපනය විශ්ව විද්‍යාල පද්ධතියට දේශපාලනය රැගෙනවිත් ඇති අතර ඊට උදාහරණ ලෙස දෙමළ ජාතික සංධානයෙහි තරුණ කණ්ඩායමේ ලේකම් හා විශ්ව විද්‍යාල ශිෂ්‍ය කමිටුවේ ලේකම් යන තනතුරු දෙකටම **තර්ෂානන්දන්** යන ශිෂ්‍යයා පත්වීමත් ... ජන්දයට **ජනාර්තන්** නැමැති විශ්ව විද්‍යාල සිසුවා දෙමළ ජාතික සංධාන (TNA)



දෙමළ ජාතික සංධානය හා දෙමළ ජාතික ජනතා පෙරමුණ සෘජුවම යාපනය විශ්ව විද්‍යාල පද්ධතියට දේශපාලනය රැගෙනවිත් ඇති අතර ඊට උදාහරණ ලෙස දෙමළ ජාතික සංධානයෙහි තරුණ කණ්ඩායමේ ලේකම් හා විශ්ව විද්‍යාල ශිෂ්‍ය කමිටුවේ ලේකම් යන තනතුරු දෙකටම **තර්ෂානන්දන්** යන ශිෂ්‍යයා පත්විමත් ත්‍රිකුණාමල පළාත් සභා ජන්දයට **ජනාර්තන්** නැමැති විශ්ව විද්‍යාල සිසුවා දෙමළ ජාතික සංධාන (TNA) පක්ෂයෙන් ඉදිරිපත්ව ජයග්‍රහණය කිරීමත් දෙමළ ජාතික මහජන පෙරමුණ (TNPF) ලේකම් හා හිටපු එල්ටිටිඊ ශිෂ්‍ය සංවිධානයේ (STUDENT ORGANISATION OF LIBERATION TIGERS - SOLT) **එස් කජේන්ද්‍රන්** සෘජුවම විශ්ව විද්‍යාල කටයුතු වලට සම්බන්ධ වීමත් පෙන්වා දිය හැක. මේ අතර කණගාටුදායකම තත්වය වන්නේ පටු දේශපාලන වාසි ලබා ගැනීමට දකුණේ සිටින පෙරටුගාමි සමාජවාදි පෙරමුණෙහි **උදුල් ප්‍රේමරත්නද,** අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වන **සංජීව බංඩාර** සමග එක්ව යාපනය විශ්ව විද්‍යාලයේ මෙම ඇති වූ තත්ත්වයට උඩ ගෙඩි දීම සඳහා බුද්ධිමත් ඔබද දකුණෙන් යොදාගැනීමට උත්සහ ගැනිමයි. මෙමගින් විද්‍යාමාන වනුයේ උතුරේ එල්ටිටිඊ අවශ්‍යතා සඳහා රට දෙකඩ කිරීමේ උත්සාහයට නොදැනුවත්වම ඔබද බිලි වීමකි. මෙම ව්‍යාපාරය කෙසේ සහසම්බන්ධ වී ඇද්ද යන්න පසු පිටේ සඳහන් සටහනින් ඔබට වැටහෙනු ඇත.

**බුද්ධිමත් සිසු සිසුවියනි,**

මෙම තරුණ ව්‍යාපාර මගින් නොයෙක් සංවිධාන දේශපාලන වාසි ලබාගැනීම සඳහාත් ජාතිවාදි අදහස් ව්‍යාප්ත කොට එල්ටිටිඊ සංවිධානයේ අරමුණ සාර්ථක කරමින් රට දෙකඩ කිරීම සඳහාත් ඉඩ ප්‍රස්ථාව සලසමින් සිටින අතර ඔවුන්ගේ බසට කිකරු වී උද්ඝෝෂණය කිරීමෙන් ඔබද නොදැනුවත්වම රට දෙකඩ කරන වැයමට හවුල්වීම වැළැක්විය නොහැක. එම නිසා ඔබගේ බුද්ධිය යොදවා සිතා බලන්න, ඔබගේ අහිංසක දෙමාපියන්ගේ අභිප්‍රායන්, අනාගත බලාපොරොත්තු ඉටුකිරීමට අදිටන් කරගන්න. ඔබගේ අනාගතය අඳුරුවීමට නොදී එය සුභවාදි කොට බුද්ධිමත්ව කටයුතු කරන්න. ඔබ වැනි උගත් පරපුරක් මේ රට සෞභාග්‍ය කරා රැගෙන යාමට අත්‍යවශ්‍ය වේ.

බුද්ධිඅංශ මගින් විශ්වවිද්‍යාල තුල ශිෂ්‍යව්‍යාපාරයට අසත්‍ය චෝදනා එල්ලකරමින් සිසුන් නොමගයැවීමට හා බියවැද්දීමට බෙදාහැර තිබූ ලිපියක්

padippakam

<u>දයාබර දෙමව්පියනි</u> !

අපගේ සංවිධානය වෙතින් ඔබට මෙවැනි ලිපියක් ලැබීමට තරම් ඔබ භාග්‍යවන්තයෙක් යැයි මුලින්ම සඳහන් කරන්නේ හදපිරී සෙනෙහසින් හා ගෞරවයකිනි. මන්දයත් ඔබ වැනි දෙමව්පියන් මුළු ලංකා මාතාවගේම ගෞරවය හා ආදරය ලැබිය යුතු අයවළුන් වීමය. එසේ වීමට එකම හේතුව වන්නේ ලක්ෂ හතරක් පමණ වන උසස් පෙළ හදාරන ලාංකිය සිසු දරුවන්ගෙන් විසිදෙදහසක් පමණ වන භාග්‍යවන්ත සහ දක්ෂ එසේම බොහෝ විට ඔබ දෙපලටද ලඟා කර ගැනීමට නොහැකි වූ සරසවි වරම් ලැබීමට ඔබගේ ආදරණිය දියණිය/පුතනුවන් සමත්වීමයි.

මෙම වරම දෙවියන්ගෙන් ලද වරමක් යැයි සිතා දේවත්වයෙන්ම සැලකිල්ල යොමු කලයුතු කරුණකි. තවමත් නාඹර, තරුණ ජවයෙන් ඔද වැඩුනු ඔබගේ ආදරණිය දියණිය/පුතනුවන් මෙම මහඟු අවස්ථාව හරිහැටි හඳුනාගෙන නොමැති බැව් අපහට වැටහී ඇත. නමුත් ඔවුන් නිවැරදි මාර්ගයට ගැනීමට අප තවමත් පමා නැත. ඒ සඳහා සුදුසුම අයවළුන් වන්නේ ඔවුන්ට හැමදාමත් මුළු හදවතින්ම සහ අවංකවම ආදරය කරන ඒ වගේම පණමෙන් හදා වඩාගත් දෙමාපියන් වන ඔබ දෙපලයි. මන්දයත් මේ ලෝකයේ මොන තරම් නරක දේ කලත් ඔවුන්ගේ දෙමව්පියන්ට හැමදාමත් ඔවුන් "සනෙහෙබර දරුවන්" වන නිසාය. ඒ නිසා ඔබ දෙපළ මුලින්ම දැනුවත් කිරීම සර්ව සාධාරණ යැයි සිතමු.

අද සමාජයේ සහ සරසවි ඇතුලත ඔබ නොදන්නා අභියෝග විශාල ප්‍රමාණයකට ඔබගේ ආදරණිය දරුවන් මේ වනවිට මුහුණදී ඇත. ඉන් කිහිපයක් කෙටියෙන් හෝ ගෙනහැර දැක්වීම වැදගත් වන්නේ යැයි සිතමු.

තමන් ඉදිරියේ ඇති අභියෝග වලින් ලෝකය ජය ගැනීමට පොරබදන ඔබගේ දරුවන් බිලි ගැනීමට නොයෙකුත් දේශපාලන සංවිධානයන්ගේ උකුසු ඇස් යොමුකරමින් සිටිති. පුද්ගලික න්‍යායන් ඉටුකරගැනීමට තරුණ ජිවිත බිලි දීම එම දේශපාලන පක්ෂවල එකම අරමුණයි. මේ දක්වා අප රටට මෙවැනි පක්ෂවල සිටි අයවළුන් උරුම කළ කිසියම් වැදගත් දෙයක් (ඔවුන් නිතර කථා කරන අරගලයෙන් හෝ නිතැතින් පෙනෙන රතු පාට තුලින් වසා ඇති මරණයත්, රත්වූ රුධිරයත් හැරෙන්නට) නොමැති බැව් ඔබ දන්නාමුත් ඔබගේ දරුවන් එය දන්නේ නැත. ඒ ඔවුන් ගේ දැනුම ගැන ඇති ප්‍රශ්ණයක් නිසා නොව, ඔබ අතීතයේ ඉගෙනගත්, ඔබගේ ඇස් වලින් දැකපු අතීත පාඩම් ඔවුන්ට දැක ගැනීමට අවස්ථාවක් උදා නොවු බැවිනි.

පටු දේශපාලන අරමුණු ඉටු කරගැනීමේ පරමාර්ථ පමණක් පෙරදැරී කරගත් පක්ෂවල අයවළුන් නිරන්තරයෙන් කථා කරන අනාගත විප්ලවයේ එක්කොටසක් ලෙස විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හඳුන්වා ඇති අතර, එයින්ම ඔබගේ ආදරණිය දියණිය/පුතුණුවන් ඔවුන්ගේ දේශපාලනයේ අතකොළුවක් වී ඇති බැව් ඔබටද පැහැදිලි වේ. තවද, තරුණ ජවයෙන් හා අතිධාවනකාරි අදහස් උදහස් සහ ක්‍රියාකාරීත්වයෙන් හෙබි ඔබ දරුවා ඔවුන්ගේ පංචමහා බලවේගවල ක්‍රියාකාරී බලවේගය කරගෙන ඇත.

තරුණවියේ සිටින ඔබගේ ආදරණිය දරුවාගෙ කලහකාරී අදහස් හා තරුණ ජවය මොවුන් කවදත් සිදුකළ පරිදි ඔවුන්ගේ දේශපාලන උවමනාවන් මුදුන් පමුණුවා ගැනීමට යොදා ගැනීම.

තවද විශ්වවිද්‍යාල විප්ලව යැයි කියාගන්නා සිවිල් කළහකාරී වැඩ වලින් අහිමිවන තරුණ ජිවිත සඳහා ඒ අයගේ දෙමව්පියන්හට ලැබුනු කිසිවක් නොමැත. ඒවාට සහභාගි නොවී ඔවුන් හොඳින් ඉගෙන ගත්තානම් අද දවසේ රටට වැඩදායි පුරවැසියන් වීමට තිබිණ.

මේ සියළු කාරණා පිළිබඳව සැලකිල්ලෙන් බලන කළ පෙනී යන්නේ ජාත්‍යන්තර බළපෑමක් මගින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හරහා අපගේ මව්බිම වැනසීමේ ක්‍රියාවලියක් පවතින බවයි. එම ක්‍රියාවලියේ කොටස් කරුවන් වීමට ඔබගේ ආදරණිය දරුවන්ට ඉඩ නොතැබීම ඔබගේ පරම යුතුකමයි. මේ සියළු බාධක බිඳ ගෙන අනාගතයේ දවසක සරසවියෙන් ඉහලම සාමාර්ථයක් ලබා හොඳ පුරවැසියෙකු වී ගමට එන ඔබගේ ආදරණිය දියණිය/පුතනුවන් පිළි ගැනීමට ඔවුන්ගේ අධ්‍යාපනයට ශක්තියක් වූ ඔබ දෙපළට අමතරව ආදරණිය ගුරුවරුන්, පන්සලේ ලොකු හාමුදුරුවෝ සහ ගමේ සියළුම නැහිත මිතුරන් පෙරමග බලා සිටිනවා ඇත.

අදම මේ පිළිබඳව සිතා ඔබේ දරුවා පිළිබඳව අවදානයෙන් සිටින්න. මේ ලිපිය ලද ඔබේ දරුවාගේ රාජ්‍ය විරොධි ක්‍රියාවන් පිළිබඳව මේ වනවිටත් නොයෙකුත් තොරතුරු විශ්ව විද්‍යාලය තුළ පැතිරෙමින් පවතිනු ඇත. නැතිනම් රතුපාට සමාජයේ තවත් ගොදුරක් ලෙස ඔබගේ දරුවාද ගමට එන දිනය වැඩි ඈතක නොවේ. ඒ වන විට ඔබ දෙපළ පමා වැඩි වන්නට පිළිවන. ඒ නිසා පාසැල් කාලයේ මෙන්ම ඔබගේ දරුවාගේ සරසවි අධ්‍යාපනය සහ ඔවුන් කරන්නේ මොනවාද යන්න පිළිබඳව අවධානයෙන් සිටින්න. මන්ද ඔබගේ දරුවා කාටත් වඩා ඔබට වටින බැවිනි.

\- සරසවි සිසුන් රැක ගැනීමේ සංවිධානය -

සිසුන්ගේ දෙමාපියන් බියවැද්දීම සඳහා බුද්ධිඅංශ මගින් නිවෙස්වලට යවාතිබූ නිර්ණාමික ලිපියක්



படிப்பகம்